# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.12.15

වර්ෂ 2020 ක් වූ දෙසැම්බර් මස 15 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ දෙසැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
11. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020-11-03 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-11-03 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-11-03 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2020-11-03 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

සංශෝධන නැති බවයි පෙනෙන්නේ.

2020-11-03 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>02) 2020-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** 2020-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සම්භාවනීය සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අදහසක් ප්‍රකාශ කරන්න තියෙනවා. ගිය සභා වාරයේදී අපේ වාසනා මන්ත්‍රීතුමිය ප්‍රකාශයක් කෙරුවා පසුගිය ආණ්ඩුව කාලයේදී මගේ ඉඩම් වලට පාරවල් කපාගෙන මේවා කරගත්තා කියලා. එයා ඒවා හෙවුවේ නැතෙයි කියලා කියනවා. මම දන්නේ නැහැ එතුමියට කවුරු අදහසක් ප්‍රකාශ කරලද කියලා. මගේ ඉඩම් නැත්නම් අද ටිකිරුප්ජඳුව වත්තට යන්න පාර නැහැ. මගෙන් පර්චස් හයක් දීලා තමයි ඒ පාර කැපුවේ. තාම ඒක සභාවට පැවරුවෙත් නැහැ. මම හදපු පාරටම එතුමිය ඊයේ පෙරේදා මේවා එක දාලා හැදුවේ. මම ගිහිල්ලා බැලුවේ අඩුපාඩුව විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා සමාවෙන්න. කරුණාකරලා දැන් සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේ ඔබතුමාට සංශෝධනයක් තියෙනවා නම් විතරක් ඉදිරිපත් කරන්න. නැත්නම් අදහස් දැක්වීමේ අවස්ථාවේදී ඔය පිළිබඳව සඳහන් කරන්න. ඔය වාර්තාවට අදාළ දෙයක් විතරක් කතා කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** වාර්තාවට අදාළ දෙයක් තමයි කිවුවේ. පැන නගින කරුණ තමයි කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාර්තාවේ සංශෝධනය වෙන්න ඕනද කියන්න මොනවා හරි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** චෝදනාවක් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට උත්තරයක් දෙන්න වෙන වෙලාවක. දැන් වෙලාව තියෙන්නේ සංශෝධන කරන්න විතරයි. මේ වෙලාවේ සංශෝධන විතරයි කරන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** සංශෝධන යටතේ මම ඉල්ලුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැහැ. ඒක ඔබතුමාගේ අදහස් දැක්වීමේදී කියලා ඉවර කරන්න. දැන් ඕකට අවස්ථාව දෙන්න බැහැ. සංශෝධන තියෙනවා නම් ඉදිරිපත් කරන්න කරුණාකරලා.

සංශෝධන නැති බවයි පේන්නේ.

2020-11-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනවාරි පළවෙනිදා උදේ සුපුරුදු පරිදි සෙත් පිරිත් දේශනා කිරීම සහ උදේ දානය සභා පරිශ්‍රයේදී පැවැත්වෙනවා. ඒ සඳහා සියලුම මන්ත්‍රීතුන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට ආරාධනා කරනවා.

ඊළඟට ඔබතුමන්ලා කවුරුත් දන්නවා වර්තමානයේදී කොරෝනා වසංගතයත් සමඟ මේ වර්ෂය පුරාවටම නොයෙකුත් හැලහැප්පීම් වලට ලක්වෙන්න සිදු වෙච්ච වර්ෂයක්. නමුත් ලබන වර්ෂය සඳහා රජය තීරණයක් අරගෙන තියෙනවා. අපි කවුරුත් දන්නවා කොරෝනා වලට තැන දීලා යන්න පුලුවන් මට්ටමක් නෙමෙයි තියෙන්නේ. කොරෝනා සමඟ ජීවත් වෙන්න වෙන තත්ත්වයක් තමයි ඉදිරියට සිද්ධ වෙන්නේ. ඉතිං ඒකෙදී ලබන ජනවාරි වල ඉඳන් සුපුරුදු පරිදි පාසල් ආරම්භ කරන්නත්, ඒ වගේම රජයේ කාර්යාල සුපුරුදු පරිදි පවත්වන්නටත්, ඒ වගේම සංවර්ධන කටයුතුත් ඒ ආකාරයෙන්ම ඉදිරියට කරගෙන යන්නටත් වත්මන් රජය බලාපොරොත්තු වෙනවා. මේකත් දැනුම් දෙන්න ඕන. ඒ වගේම නැවත ග්‍රාම සේවා වසම් මට්ටමින් ''ගම සමඟ පිළිසඳරක්'', ''ගම සමඟ යළි වැඩ'' වැඩසටහන් ආරම්භ වෙනවා මේ මාසයේ 21, 22 සහ 23 වෙනිදා ඉඳන්. ඒකත් දැනුම් දෙන්න ඕන.

ඒ වගේම ඔබතුමන්ලා දන්නවා අපේ ආදාහනාගාරයේ වැඩ කටයුතු වල මූලික බිම් සකස් කිරීමේ වැඩ කටයුතු මේ දිනවල පවත්වාගෙන යනවා. ඔබතුමන්ලා දන්නවා ඒකෙදි අපි නර්ඩ් ආයතනය සමඟ වැඩ කටයුතු කරන්න බලාපොරොත්තු වෙලා ඉන්නේ. මොකද, රජයේ ආයතනයක් හින්දා නර්ඩ් ආයතනය සමඟ වැඩ කටයුතු කිරීම අපිට කොයි අතින් ගත්තත් වාසියක්. ඒ වගේම අපි බලාපොරොත්තු වෙනවා ඒ ටෙන්ඩර් පටිපාටිය ඒ විදියටම ප්‍රසිද්ධ දැන්වීම් පුවත්පත්වල පළකරලා අදාළ ඉදිරි වැඩ කටයුතු කරන්න. ඉතිං එතනදී අපිට පොඩි ගැටළුවක් මතුවෙලා තියෙනවා. නර්ඩ් ආයතනය ඒ අයගේ ගාස්තු විදියට ඇස්තමේන්තුවෙන් 6% ක ප්‍රමාණයක් බලාපොරොත්තු වුණා. නමුත් මම දැන් දිගින් දිගටම කතා කරලා අපි රජයේ ආයතනයක් කියන මේවා එක උඩ ඒක 2.5% ක් වෙනකම් දැන් අඩු කර ගත්තා. ඒකත් දැන් රුපියල් ලක්ෂ නමයක් වෙනවා. රජයේ ආයතනයක් මේක. ඒ අය ස්වයංව ආදායම උත්පාදනය කරගෙන යන ආයතනයක්. නමුත් ඒ අයගේ අධික මිල ගණන් තියෙන්නේ. නමුත් මේ වෙලාවේදී මේක කරගෙන යන්න ඕනකම තියෙනවා. අපගේ ආරක්ෂාවට විශේෂඥ දැනුමක් තියෙන රජයේ ආයතනයක් තියෙන්න ඕන. අපිට මේකට අනුගත වෙන්න සිදු වෙනවා. ලක්ෂ නමයක මුදලක් අපෙන් ඉල්ලලා තියෙනවා. ඒක ඇස්තමේන්තුවෙන් 2.5% ක්. ඒ මුදල් ගන්නේ ඇස්තමේන්තු සකස් කිරීමට සහ සැලසුම් සකස් කිරීමට. ඒ වගේම මේ අය නැවත නිරීක්ෂණ චාරිකාවක් ආවොත් වෙනම ගාස්තුවක් අය කරනවා. මම ඉල්ලා සිටියා අපි ප්‍රවාහන පහසුකම් ලබා දෙන්නම්. ඒක නිසා ඊට වැඩිය බොහොම සුළු ගාණකට ඇවිල්ලා ඒක කරන්න කියලා. ඒක කරන්න එකඟතාවයක් තියෙනවා. ඒ වගේම අපිට තවම ඉඩමේ අයිතිය 100% ක් නීත්‍යානුකූලව ලැබිලා නැහැ. දැනට භාණ්ඩාගාරයට යනකම් මේක ගිහිල්ලා තියෙන්නේ. අපිට අවසන් ලියුම එන්න විතරයි තියෙන්නේ සභාවට පවරන්න කියලා. නමුත් අපි මේ වැඩ කටයුතු ඒ හා සමාන්තරව ආරම්භ කර ගෙන යනවා. ඒක හින්දා මම ඉල්ලීමක් කරා අදාළ ලක්ෂ නමයේ මුදල ගෙවන්නම් අපිට ඇස්තමේන්තුව එවන්න කියලා. ඉඩම අපිට පැවරිච්ච ගමන් ඒ මුදල ගෙවන්නම් කියලා කිව්වා. අපි අද ඒකට ලියුමක් හදලා යවනවා. ඒකට යම් එකඟතාවයක් තියෙනවා. අපිට එතකොට ඒ මුදල ගෙවන්න වෙන්නේ ටෙන්ඩර් කරන කොට. ඒකට කාලයක් යනවා. ඒක කෙරෙන මට්ටම දක්වා නවත්වා ගෙන ඉන්නේ. ඒක ප්‍රකාශ කරන්න ඕන.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් නර්ඩ් ආයතනයෙනුත් ආදාහනාගාර හදනවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. ඒක ගැන බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක නර්ඩ් ආයතනයටම හදන්න දුන්නම ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නර්ඩ් ආයතනය හදන්නේ නැහැ. ඒ අය යටතේ ඉන්න වෙනත් ආයතනයකට තමයි හදන්න දෙන්නේ. ලංකාවේ මම හිතන්නේ ආයතන නමයක්ද කොහෙද තියෙනවා. ඉතිං ඒ අය හරහා තමයි ඒක කෙරෙන්නේ. ඒකට අමතර ගාණක් ඒ අය තියා ගන්නවා. අපි බැලුවේ සම්පූර්ණයෙන්ම අදාළ ආයතන සියල්ලටම ඉදිරිපත් වෙන්න පුලුවන් විදියට ප්‍රසිද්ධ දැන්වීමක් පුවත්පතක පළ කරලා ටෙන්ඩරයක් විදියට යන්න. එතකොට ඉල්ලුම් කරන අය ඒකට ඉල්ලුම් කරාවි. මේකත් කියන්න ඕන. මේකෙ ගෙවීම් කටයුතු සිදු කරන්නේ ටෙන්ඩර් එක ප්‍රදානය කරන කොට. ටෙන්ඩර් මණ්ඩලයට ඒ අය එනකොට තමයි මම මේක ගෙවන්නම් කියලා කිව්වේ. නර්ඩ් ආයතනයත් අපි ටෙන්ඩර් මණ්ඩලයට ගෙන්වනවා. එතකොට මේ ලක්ෂ නමයක මුදල ගෙවන්නම් කියලා කිව්වා. මම මහා සභාවේ අනුමැතිය ඉල්ලනවා මේ ආයතනයට ලක්ෂ නමයක මුදල ගෙවන්න. ඒ අය ඉල්ලනවා උපදේශන සේවය ලබා දීමට එක් නිරීක්ෂණ චාරිකාවකට රුපියල් විසි හය දහස් දෙසිය විස්සක ගාස්තුවක්. ඒක ගෙවන්නත්

මම මහා සභාවේ අනුමැතිය ඉල්ලනවා. අපි මේක අනුමත කරලා තියමු. මේකට මම සාකච්ඡා කරලා තියෙනවා අපේ වාහනයක් දෙන්න. ඒකට ඒ අය ගාණක් කිව්වේ නැහැ.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනිත් එක හැමතිස්සෙම යන්න එන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මම හිතන්නේ බිලක් දාන කොට ඒ අය ඇවිල්ලා බලලා යනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඇස්තමේන්තු කරද්දි ඒ අය නිරීක්ෂණය කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මම යෝජනා කරනවා මේ සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා. විධිමත් අනුමැතියක් ලබා ගන්න ඊළඟ සභාවට යොමු කරනවා. මේක හදිසි කාරණාවක් හින්දා මම මේකට සභා අනුමැතිය ඉල්ලලා යෝජනා කරනවා.

ඊළඟ කාරණය පොළ භූමිය සම්බන්ධව. පොළ භූමිය සම්බන්ධව දැන් අපි දිගටම මේකෙ කතා වුණා. ඇමතිතුමා හිටියේ වෙනත් ස්ථාවරයක. මේකෙ කොහොම හරි ගොඩනැගිල්ල හදලා ඉවර කරන්න ඕන කියන මතයේ තමයි අපි හිටියේ. නමුත් අපි එදා මහේෂ් මහත්තයා, ඒ වගේම ප්‍රධාන ඉංජිනේරු ජයනන්ද මහත්මයා ගෙන්වලා මම එතන ඉඳන් ඇමතිතුමාට කෝල් එකක් දීලා කිව්වා මේක හරියන්නේ නැහැ, මේකෙදී අපි පළවෙනි තට්ටුව සම්පූර්ණ කරලා ඒ මුළු බිම් ප්‍රමාණයම එන විදියට අපි කලින් හදපු ඇස්තමේන්තුවේ විදියට වැඩ කරමු කියලා. ඇමතිතුමා මේකට යම් එකඟතාවයක් දැක්වූවා. අපි බලාපොරොත්තු වන්නේ අපිට පුලුවන් විදියට පළවෙනි තට්ටුව සම්පූර්ණයෙන්ම ඉවර කරන්න. ඒකටත් විශාල මුදලක් යනවා. මුළු තට්ටු තුනේ ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුව තිබුණා කෝටි තිස් අටක් විතර. මේක තට්ටු තුනට යන්න පුලුවන් විදියට අත්තිවාරම දාලා ඒ විදියට තනි තට්ටුවක් හදන්නේ. ඒකටත් කෝටි දොළහක් විතර සාමාන්‍යයෙන් මම හිතන විදියට යනවා. ඉතිං ඒ ආකාරයෙන් තනි තට්ටුවක් සම්පූර්ණයෙන්ම ඉවර කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒකත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕන. ඒක දේශීය ණය අරමුදලින් ණය මුදලක් ලබාගෙන තමයි අපි කරන්න බලාපොරොත්තු වෙන්නේ. ආදාහනාගාර ඉදිකරන්නේ අපිට ඉදිරියට ලැබෙන්න තියෙන මුද්දර ගාස්තු වලින්. සභා අරමුදලින් තමයි ආදාහනාගාරයේ වැඩ කටයුතු කරන්නේ. ඉතිං ඒ ටික තමයි විශේෂයෙන්ම දැනුම් දෙන්න තිබුණේ.

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** 2021 වර්ෂය සඳහා කාරක සභා පත්කිරීමට යෝජනා කරමි.

I. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

II. තාක්ෂණික සේවා කමිටුව

III. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

IV. පරිසරය සහ පහසුකම් කමිටුව

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදි මට කියන්න කණගාටුයි අපි පහුගිය කමිටුවලට පත්කරපු අයගෙන් කීප දෙනෙක් එකම කමිටු රැස්වීමකටවත් සහභාගි නොවී ඉඳලා තියෙනවා. ඒ ගැන ඉතාමත්ම කණගාටු වෙනවා. මොකද, වර්ෂය පුරා තිබුණ කමිටු වලින් මුදල් කමිටුව, තාක්ෂණික සේවා කමිටුව විශේෂ වශයෙන් ගත්තම අඩුම තරමේ රැස්වීම් වාර 24 ක් විතර තිබුණා. ඒ රැස්වීම් වාර 24 න් එකකටවත් ආපු නැති මන්ත්‍රීවරුත් හිටියා. ඉතිං ඒ පිළිබඳව ඇත්තටම කණගාටු වෙනවා. කාරක සභා පත් කිරීමේදී ගිය වර්ෂයේ විදියටම පත් කරමු.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මමත් යෝජනා කරනවා එම කමිටුම හොඳයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
09. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. තාක්ෂණික සේවා කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
09. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

මමත් හිතනවා ඒ කමිටුවම හොඳයි කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම වෙනුවට මේ කමිටුවට අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමාව පත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි කමක් නැහැ. එතනදී ඉල්ලීම නිසා ඉන්දික මන්ත්‍රීතුමා වෙනුවට අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමාව ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** III. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
03. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
04. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
06. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
08. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** IV. පරිසරය සහ පහසුකම් කමිටුව

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
04. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
06. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
09. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2021 වර්ෂය සඳහා රු. 200,000.00 ට අඩු වියදම් වලට බැඳීමට අවසරදීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ තියෙන්නේ එදිනෙදා ගෙවීම් කිරීම් පිළිබඳව. මේක ගිය වර්ෂයේදීත් තිබුණා. ඒ ටිකම තමයි තියෙන්නේ සංශෝධන මුකුත් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අදහස් දක්වන්න විනාඩියක් ලබා දෙන්න. ගරු සභාපතිතුමා මේ ලක්ෂ දෙකේ කතාවේදී මම දන්නේ නැහැ එච්චර එකක් අවශ්‍ය ඇයි කියලා. ඇත්තටම මීට කලිනුත් මේ ලක්ෂ දෙක තිබුණා. නමුත් ඔබතුමා දන්නවා මීට ඉස්සර තිබුණේ රුපියල් පනස් දාහයි. ඉතිං ඇත්තටම මේ දවස ගැන හිතුවොත් එහෙම දැන් අද පහළොස්වෙනිදා. දහසය වෙනිදා ගෙවීමක් ආවත් මම අහන්නේ ඇයි ඔබතුමා වැඩක් නැති බරකට කර ගහන්න යන්නේ. මේකෙ මොකක්ද අවශ්‍යතාවය. මේ කියන්නේ මේක විරෝධාකල්පයක් නෙමෙයි. පටන් ගන්නකොටම මේක කතා කරන්න ඕන. ඇත්තටම එදා තිබුණේ රුපියල් පනස්දාහයි. නමුත් එකක් තියෙනවා එදා ගෙවුවා වැරදි ගෙවීමක්. නමුත් එවලේ මම ඒක දිගට ඇදගෙන ගියේ නැහැ. හේතුව කමක් නැහැ කියලා හිටියා. ඉතිං ඊට පස්සේ තමයි ලක්ෂ දෙකක එක ආවේ ගරු සභාපතිතුමා. ඉතිං මම දකින විදියට ඇත්තට මට තේරෙන්නේ නැහැ. උපරිම මාසයයිනේ යන්නේ. දහසය වෙනිදා ඉඳන් ඊළඟ මාසය වෙනකම් ගත්තත් මාසයයි යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාහන අළුත්වැඩියාවන් එනවා. දැන් උදාහරණයක් බලන්න. මේ කාලයේ ආවා ලොකු ප්‍රශ්නයක්. මම භාවිතා කරන වාහනයේ ටයර් හතර කිලෝ මීටර් තිස්පන්දාහක් ධාවනය කරහම අයින් කරන්න ඕන. මේක ගැන ඕන රජයේ ආයතනයකින් අහන්න. මේක තිබුණ නිසා ඒකෙන් බේරුණා. නමුත් මම භාවිතා කරන වාහනයේ ටයර් හතරෙන් කිලෝ මීටර් පනස්හත් දහසක් ධාවනය කරා. ලංකාවේ හැම තැනින්ම හෙවුවා ගන්න. ටයර් ගන්න තිබුණේ නැහැ. ජපන් ටයර් දාන්නත් ඕන. ඒ පාර යන්තම් තැනකින් හොයලා මිල ගණන් කැඳවලා මිලදී ගත්තා. මාතර රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් යන්තම් ගෙනාවේ. එවෙලේ ගෙවීම් කරේ නැත්නම් ඒක ගන්න බැහැ. මේකෙ පැති දෙකක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා අඩු ගාණේ මුදල් කමිටුව තියෙනවා. මුදල් කමිටුව කැඳවලා ඉවර වෙලා ඒකේදී ක්ෂණික තීන්දුවක් අරගෙන ඒ වගේ දේවල් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කියන්න මේ අවුරුද්දේ තිබුණ ප්‍රශ්නය මොකක්ද, දැන් අවුරුද්දක් ගෙවුනානේ. ඒකෙ තිබුණ ප්‍රශ්නය මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ අහන්න. දැන් ඔබතුමන්ලා කිසිම හදිසියක් නැතුව තමයි බැකෝ එකේ අර අළුත්වැඩියාවට හැත්තෑ එක්දහස හරි, අනූ එක්දහස හරි ගෙව්වේ. ඒ ගෙවන කොට ඒක නීත්‍යානුකූල නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නමුත් අද වෙනකම් ඒ මැෂින් එක වැඩ කරන්නේ ඒකෙන්නේ. එහෙම කතා කරන්න එපා. ඒක හදලා ගෙනාවා. ඒක ගැන යසරත්න මන්ත්‍රීතුමා හොඳටම දන්නවා. මැෂින් එක හදලා ගෙනාවා. එන්ජින් එක තමයි අළුත්වැඩියා කරේ. මැෂින් එක එකම තැන

තිබුණේ අවුරුදු දෙකක් විතර. ඊට පස්සේ හෝස් වලින් ලීක් වෙන්න ගත්තා වැඩ කරද්දී. පෙෂර් වෙද්දී හෝස් වලින් ලීක් වෙනවා. ඒකට තමයි ඒ අළුත්වැඩියාව කරේ. අදටත් ඒ මැෂින් එක ඒ විදියට වැඩ කරනවානේ දෙවියන්ගේ පිහිටෙන්. ඒක කියලා දැන් අවුරුද්දකට වැඩියිනේ. මේක වෙන්දේසි කරන මට්ටමට තිබුණ මැෂින් එකක්නේ. මම කියන්නේ එහෙම කතා කරන්න එපා. කරන්න හදන දේත් මම දන්නවා. අවුලක් නැහැ. අත්තටු කපලා හිරකරගෙන යමු. ඔබතුමන්ලා දන්නවාද, මාත් මේකෙ බබෙක් නෙමෙයි. මේකෙ හැරෙන කොට මම දන්නවා මොකද වෙන්නේ කියලා. ඔබතුමාට පහුගිය අවුරුද්දේ තිබුණ ප්‍රශ්නය මොකක්ද, ඕන නැහැ. පනස්දාහ ගාණේ දා ගෙන යමු. ප්‍රශ්නයක් නැහැ. මම මේකෙ වෙන දේවලුත් කියන්න ඕන. තේරුණාද, පනස්දාහ දාගෙන යමු. ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕන වෙලාවක කමිටුව කැඳවලා මේවා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා අනිත් පැත්තට කියනවානේ කැඳෙව්වම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ අහන්න. මම ගෙනිච්චේ නැහැ මේ ප්‍රශ්නය එහාට. ගෙනිච්චානම් ඒක වැරදියිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද වැරදි. ඔබතුමා ගෙනිච්ඡානේ. ගෙනියන්න පුලුවන් ඒවා ගෙනියනවා. මම කාටවත් බලපෑම් කරලා නැහැ. ගෙනියන්න එපා කියලා කිසි එකකට බලපෑම් කරලා නැහැ. මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා, මේකෙ ඇත්තටම දෙයක් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි බැරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්ත කතාව මම කියන්නම්. මම මගේ වුවමනාවකට කමිටුවක් හැදුවා මේකෙ තියෙන වෙන්දේසි ඉඩම්වල ප්‍රශ්න ගැන, අනවසර ඉදිකිරීම් ගැන ක්‍රියා කරන්න. දැන් ඒක පාරාවලල්ලක් වෙලා මටම ප්‍රශ්න ඇති කරන ගාණටම ඇවිල්ලා තියෙනවා. මම මන්ත්‍රීවරුන්ට ඒ බලය දුන්නා. මන්ත්‍රීවරුන්ට කිවුවා ගිහිල්ලා ඒවා බලන්න කියලා. මම ඔබතුමන්ලට කිවුවා නීතිඥයොන්ට ගිහිල්ලා ඒවා භාර දෙන්න මේවට නඩු දානවා කියලා.

(ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හොඳ දෙයක්

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොඳ දෙයක්. මේක කමිටුවේ අනිත් අය දන්නවද දන්නෙත් නැහැ. විගණකාධිපතිගේ ඉඳන් හැමතැනටම මේවා ගැන පිටපත් දාලා. මේ හැමදේටම මගේ ඔලුව අතගාලා ටොක්ක අනිනවා. ඒකයි වෙන්නේ. පළාත් පාලන කොමසාරිස්තුමා ලියුමක් එවලා තියෙනවා මේක වහාම කරන්න කියලා. එතකොට දැන් කාගෙද දුර්වලකම. මම අහන්නේ මන්ත්‍රීවරුන්ගෙන්. විශේෂයෙන්ම කමිටුවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන්. කොහේවත් නැති දෙයක් මම කරේ. අන්තිමට පළාත් පාලන කොමසාරිස්තුමා මට එවනවා ඇයි මේ මන්ත්‍රීවරුන්ගෙන් කමිටුවක් පත් කරලත් මේවා ක්‍රියාත්මක කරන්නේ නැත්තේ කියලා. එතකොට සභාපතිවරයා විදියට මට මොකක්ද තියෙන තත්ත්වය. ඒ බලය දීලා සම්පූර්ණයෙන්ම නීතිඥවරු හොයලා නඩු දාන්න කියලා දුන්නට පස්සෙත් මේක කරනවා. මේකේදී පෙන්වන දේ නෙමෙයි මේක යට තියෙන්නේ. මම මේ හැමදේම දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. අපි බොහොම සන්තෝෂයෙන් ඉන්නේ ඔබතුමාගේ ඒ වැඩපිළිවෙලට. ඔබතුමාට විරෝධාකල්පයක් නෙමෙයි කරේ. මම ඔබතුමාට පැහැදිළි කරලා කියන්නම්. අනිත් මන්ත්‍රීවරුත් මේක දැන ගන්න. මෙතුමාට විරෝධයක් හරි මොකක් හරි නෙමෙයි කරේ. බොහොම පැහැදිළිවම ගරු සභාපතිතුමා අපි ගිහිල්ලා බලලා ඉවර වෙලා නිර්දේශ කරා. අපි ගිහිල්ලා කිවුවා, බොහොම පැහැදිළිවම ඔබතුමත් ගියා. මමත් අහම්බෙන් ඉඳලා ගියා එදා දවසේ වටරැක වෙන්දේසි ඉඩමට. ඊලඟට වෙන්දේසි ඉඩම් තුන හතරකට ගියා. අන්තිමට අපි ගියා ඉන්ග්ලන්ඩ් හිල් එකේ වෙන්දේසි ඉඩමට. මේවාට අඟල් හතරේ එක ගල් කැල්ලක් දාලා නැහැ. මගේ ළඟ පින්තූර තියෙනවා. මම ඔබතුමාට පෙන්වන්නම්. මේක නවත්වන්න කියලා කිවුවා. නවත්වන්න කියලා කිවුවට නැවැත්තුවේ නැහැ. එතකොට ඔබතුමාගේ වැරැද්දක් නෙමෙයි මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ වැරැද්දක් නෙමෙයි කියලා කියන්නේ කොහොමද, මේ සභාවේ වෙන දේකට මම වගකීම ගන්නවා. හැබැයි මෙහෙම දෙයක් තියෙනවා. තාක්ෂණ නිලධාරීන්ට ඒක ළඟට ගිහිල්ලා එතන ඉන්න බැහැ හැමතිස්සෙම. ඒක හින්දා තමයි අවුරුදු පහේ කොන්දේසියක් දාලා තියෙන්නේ. මන්ත්‍රීවරු මේක දැන ගන්න ඕන. ඒ අය අවුරුදු පහ ඇතුළත ඒ පාරවල් කැඩිලා ගියොත් ඒ අයගේ වියදමින් හදන්න ඕන. අපි ඒක කර ගන්න ඕන. ඉතිං ඒකට ගිය නිලධාරීන්ට ඒක ළඟ ඉන්න බැහැ.

ඉතිං ඒකට තමයි කොන්දේසියක් දාලා තියෙන්නේ. ඉතිං ඒ කොන්දේසි අපිට දාන්න බැහැ ඉස්සරහට. අපි සභා තීන්දුවක් අරගෙන තියෙනවානේ. අපි ඒවා කරන්න යනවා. එතකොට ඒ ප්‍රශ්නය ඉවරයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඔබතුමාට ජීවමාන අත්දැකීම් තියෙනවා. නගරිගෙවත්තට බලන්න යන්න. අඟල් දෙකේ ගල් ගොඩවල් විතරයි තියෙන්නේ. ගියපු මන්ත්‍රීවරු ඒක දන්නවා. මම මුලින්ම යෝජනාවක් ගෙනාවා. කරුණාකරලා ගිහිල්ලා ඉවර වෙලා මේවා බලන්න මන්ත්‍රීවරු. නිරීක්ෂණ චාරිකාවක් යමු කිවුවා කවදාවත් ගිහිල්ලා නැති හින්දා මේ අළුත් මන්ත්‍රීවරු. ඒක කෙරුනේ නැහැ ගරු සභාපතිතුමා. ඒක කරේ ඔබතුමාට විරෝධාකල්පයකට නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද කෙරුනේ නැත්තේ. අවුරුදු පහට අඩු සියලු ඒවාට අපි ලියුම් දාලා තියෙන්නේ. මොකක්ද කෙරුනේ නැත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනිත් මන්ත්‍රීවරු මේක තේරුම් ගන්න. මේක ගිහිල්ලා බලන්න කියලා කිවුවේ මේ කියන දේවල්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ මෙච්චරයි. විගණකාධිපතිගේ ඉඳන් ඔබතුමන්ලා ලියුම් දැම්මේ ඇයි. මට ඒකට උත්තරයක් දෙන්නකෝ. විවෘතව කතා කරන මනුස්සයෙක් මම. අපි සභාවෙන් කමිටුවක් හදලා බලය දුන්නා මන්ත්‍රීවරුන්ට. ඔයගොල්ලෝ ගේන්න කිවුවා නඩු දාන්න ඕන ටික. ඒ ටික ගෙනාවා. ඊට පස්සේ අබේසේකර මන්ත්‍රීතුමාටත් දුන්නා. අර දහනායක හාඩ්වෙයාර් එක ගැන හැමදාම කියනවා. එතුමාට කිවුවා නීතිඥයා හම්බවෙලා මේක කරන්න කියලා. එතුමා තමයි නීතිඥතුමාගේ නම කිවුවෙත් ප්‍රසිත් වල්ගම කියලා. අපි එහෙම වැඩ කරගෙන යද්දි විගණකාධිපතිට දාන්නේ ඇයි, පළාත් පාලන කොමසාරිස්ට දාන්නේ ඇයි. මේක අබේසේකර මන්ත්‍රීතුමා තේරුම් ගන්න එක නෙමෙයි තියෙන්නේ. මම බබෙකුත් නෙමෙයි තේරුම් නොගන්න තරම්. මේ හදන්නේ වෙන ගේම් එකක්. ඔබතුමන්ලා හිතන්නකෝ. මෙතනින් බේරගන්න පුලුවන් දේ මේක. මෙතනින් බේර ගන්න බැරි වුණොත් නේද, උඩට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙතනින් බේරන්න බැහැ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද බේරන්න බැරි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කමිටුවට ඇවිල්ලා කිවුවා. ඔබතුමා පොඩ්ඩක් ඇහුම්කන් දීලා උත්තර දෙන්න. අපි අහගෙන ඉන්නම්. අන්තිමට ඔබතුමන්ලාව දැනුවත් කරා මේ නිලධාරීන්. බොහොම පැහැදිළිව අපේ තාක්ෂණ නිලධාරී මහත්වරුන් කිවුවා මේ වැඩේ කරන්න එපා මෙන්න දාලා තියෙනවා මෙහෙමයි කියලා. මේකට මේ චෝදනාවක් කරන්නේ කියලා කිවුවා. එතකොට එහෙම කරලා ඉවර වුණාම අපිට ඒක තේරෙනවා. දැන් ඔබතුමා ඉඳගෙන කියනවා අවුරුදු පහේ ගිවිසුමක් ගැන. අවුරුදු පහේ ගිවිසුම රෙද්දකටවත් වැඩක් නැහැ. එහෙම කියන්න හේතුව මොකද, දැන් අන්තිමට කියන්න ගත්තා ඉංජිනේරුවරු පිළිගත්තා කියලා අඟල් දෙකේ ගල් දාලා තියෙන්නේ කියලා. එහෙමනම් ඉතිං අපේ පාරවලුත් මෙහෙම කරාට පස්සේ අපිට පුලුවන් මෙච්චර කාලයක් පාරවල් හදලා තියෙන්නේ කිලෝමීටර් දහයක් නම් කිලෝ මීටර් පන්සීයක් විතර හදන්න පුලුවන් ඒ විදියට කරනවා නම්. සභාපතිතුමා මේක දැන් කැඩිලා ගියාට පස්සේ අවුරුදු පහේ කතාව නෙමෙයි කියන්නේ. මාස හයෙන් හතෙන් මේවා කැඩෙනවා. ඔබතුමාගේ ප්‍රශ්නයක් නෙමෙයි මේක. ඔබතුමා හැමතැනටම බලන්න යනවද, ඔබතුමාට බලන්න යන්න පුලුවන්කම තිබුණද, සෙන්චරි ෆිනෑන්ස් එකේ අරහේ තිබුණ එකට. ඒකට යන්න බැරි වුණා. දැන් යන්නේ නැහැ ඒ වැඩේ ඉවර හින්දා. නමුත් තාක්ෂණ නිලධාරීන් ඒක දෙන්න ඕන. වතුර ටැංකිය තිබ්බේ නැහැ ආරක්ෂාවට කියලා. මේ අර කිතුල් ගහට නැගපු අයට කියන්න දේවල් තියෙනවා වගේ. ආරක්ෂාවට ටැංකිය තිබ්බේ නැහැලු. හැබැයි බැලුවද එතන අඟල් හතරේ ගල් දාලාද කියලා. පාරවල් මාස පහෙන් හයෙන් කැඩිලා යනවා. මේ හැම පාරකටම සිද්ධ වෙලා තියෙන්නේ ඒක. වෙලාවට අපි ඒවා අරන් තිබුණා. ඔබතුමා මේකෙ වැරදිකාරයෙක් නෙමෙයි. මම කියන්නේ තාක්ෂණ නිලධාරීන් මේවා බලන්න ඕන. අඩු තරමින් ගල් දානකොට ඒ අයට කියන්න ඕන. එතන ගිහිල්ලා නැවතිලා ඉන්න ඕන නැහැ. අඩු ගාණේ ගල් ගෙනල්ලා තියෙනවා නම් ඒවා එලනවාද, නැද්ද කියලා බලන්න ඕන. එතන ගිහිල්ලා ලැගලා ඉන්න ඕන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. සියලුදෙනාගේ හෘද සාක්ෂිය මේක දන්නවා. මෙතන මේ ප්‍රශ්න කරන්නේ නිලධාරීන්ටද, මටද කියලා සියලු දෙනාගේ හෘද සාක්ෂියෙන් අහන්න. පළාත් පාලන කොමසාරිස්තුමා පෙරේදා මට කතා කරලා කියනවා ඔය සිද්ධියත් එක්ක සභාපතිතුමා ඇත්තටම ඔබතුමන්ලා මොකක්ද මේ කරන්නේ කියලා. ගාල්ල දිස්ත්‍රික්කයේ තියෙන පළාත් පාලන ආයතන සියල්ල ගත්තම ඒ පළාත් පාලන ආයතන එක්ක සංසන්දනය කරන කොට මුළු පළාත් පාලන ආයතන ටික 100% ක්

කියලා ගත්තහම 80% ක් ප්‍රශ්න එන්නේ බෝපෙ පෝද්දලින් කියලා කියනවා. පෙත්සම්, පැමිණිලි තියෙනවා හැමදාම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න හරියට කරලා තියෙනවද කියලා. මේවා පෙත්සම් නෙමෙයි. ප්‍රසිද්ධව තමන්ගේ නමින්ම ඉදිරිපත් කරපුවා මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කීපයක් අරගෙන ගියානේ. අබේසේකර මන්ත්‍රීතුමා මීට පස්සේ මේවා ගේන්නත් එපා කියලා කිවුවානේ පළාත් පාලන කොමසාරිස්තුමා. මට ඒක කිවුවා. ගේනවා ගේනවා බේරෙන්න බැහැ කිවුවා. එතුමා කියලා තවත් ගේන්න එපා කියලා.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස්තුමා නීතියක් දන්නේ නැහැ. සභාපතිතුමා මේක අහගන්න. එතුමාට බලතල නැහැ කිවුවා. එතුමාට තමයි බලතල තියෙන්නේ. එතුමා ඇවිල්ලා මාස ගාණක් වෙනවා. එකම එකයි ගෙනිහිල්ලා දුන්නේ. ඒක දීලා එනකොට අනිත් පැත්තට හැරිලා මෙතුමට ඒක කිවුවා. මොකක්ද මේකෙ තියෙන සහ සම්බන්ධය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා කියනවා මට මේ වෙන වැඩ නැතුව වගේ සභාපතිතුමා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හිටපු කොමසාරිස්තුමන්ලාගේ අඩුපාඩු තියෙන්න පුලුවන්. හැබැයි පරීක්ෂණ කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මමත් කිවුවා එයාට විතරයි ප්‍රශ්නය තියෙන්නේ අනිත් මන්ත්‍රීවරුත් කියනවා නම් මේ ගැන සලකා බලන්න කියලා මම කිවුවා. අබේසේකර මන්ත්‍රීතුමා විතරයි එන්නේ, මොන ප්‍රශ්නයක් වුණත් මෙතන ඇවිල්ලා එක දෙක කරනවා කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ අහන්න. මම මෙතන සභාවේදී සභාගත කරා ලියුම් විසි පහක්. ඒ ලියුම් විසි පහෙන් හැම එකකටම වගේ ඔබතුමා අත්සන් කරලා තියෙනවා. එතකොට මේ අබේසේකර විතරද අත්සන් කරලා තියෙන්නේ. මෙතන ඉන්න මන්ත්‍රීවරු අත්සන් කරලා තමයි ගිහින් දීලා තියෙන්නේ. අබේසේකරගේ ප්‍රශ්නයක් එතකොට නැහැ මෙතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ ඒක නෙමෙයි. දැන් ඒක නවත්වමුකෝ. දැන් මම අනිත් මන්ත්‍රීවරුන්ගෙන් අහන්නේ මෙතන කමිටුවක් හදලා අපි ඒක සද්භාවයෙන් කරානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හොඳයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මම කිවුවානේ මගේ පැත්තේනේ ඔය සියලු ඒවා 99% ක් තියෙන්නේ. ඕවා මගේ පැත්තේ තියෙන්නේ කියලා කිවුවානේ. එච්චර දේවල් කරලා ඒ සම්බන්ධව නඩු දාන්න පුලුවන් ටික වෙන්කරලා මන්ත්‍රීවරුන්ට භාර දුන්නට පස්සේ විගණකාධිපතිතුමාටයි, පළාත් පාලන කොමසාරිස්තුමාටයි, ජනාධිපතිතුමාටයි හැම තැනටම ලියුම් දාලා මේක කෙරෙන්නේ නැහැ කියලා. මොකක්ද එතකොට මට තියෙන තත්ත්වය. මට කියන්නකෝ මොකක්ද තත්ත්වය කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙමයි. ඇත්තටම වැරැද්දක් තියෙන හින්දා නේ මේ ප්‍රශ්නය මෙහෙම මතු වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද මතු වෙන ප්‍රශ්නය. ඕකට මුකුත් කමිටුත් නැතුව, මුකුත් නැතුව යන්න දුන්නා නම් ඔය ප්‍රශ්න මුකුත් නැහැනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙමනම් සභාපතිතුමා මේ සභාවට මන්ත්‍රීවරු විදියට පත්වෙලා ඇවිල්ලා වැඩක් නැහැ. කොමසාරිස්තුමාටයි, ඔබතුමාටයි, මේකෙ ඉන්න නිලධාරීන්ටයි ඕන විදියට කරන්න පුලුවන් නම් අපි මන්ත්‍රීවරු විදියට පත්වෙලා ඇවිල්ලා වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ඒක නෙමෙයිනේ මේ අහන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නැහැ ඒක තමයි සභාපතිතුමා. මේ වැරැද්දක් තිබ්බිච හින්දනේ කරේ. දැන් අපි මුලින් කිවුවානේ අඟල් හතරේ ගල් දාන්නේ නැතුව පාරක් හදන්න බැහැනේ ඇත්තටම. ඒක දාපු එකේ ප්‍රතිඵලයක් විදියටනේ නගරිගෙවත්ත පාරේ ගල් ගොඩවල් ගැහිලා තියෙන්නේ. අපි ඒක දැක්කා.

ඒ කර්මාන්ත ගැන අපිට අවබෝධයක් තියෙන නිසා තමයි අපි මේ දේ කිව්වේ. ඒක හරියාකාරව දැනටත් නොකරනවා නම් මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නොකෙරෙනවා කියලා කොහොමද කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එදා දැන් අපි ගිහිල්ලා කළුපහන පාරේ රජ ගෙදර වත්ත වෙන්දේසි ඉඩම බැලුවා. අඟල් හතරේ ගල් දාලා තිබුණේ නැහැ. ඊට පස්සේ තමයි අඟල් හතරේ ගල් දාලා තිබුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනිත් හරියේ දාලා නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ ඉඩමට අනුමැතිය දීලද තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට අනුමැතිය දීලා නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඉතිං මම මේ කියන්නේ අපෙන් මන්ත්‍රීවරු විදියට ඇහුවම උත්තර දෙන්න එපැයි. එහෙමනම් අපේ සභාවෙන් වැරැද්දක් වෙලා තියෙනවා. ඒ වැරැද්ද නිවැරදි කර ගන්න තමයි අපි මේ සටන ගෙනියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. මම ඒක පිළිගන්නවා. එතකොට පළාත් පාලන කොමසාරිස්තුමාට, ජනාධිපතිතුමාට, විගණකාධිපතිතුමාට දාන්නේ මොකටද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒකත් මම කියන්නම්. එතනදී අපි හපුගල නාගහවත්ත ඉඩමට බලන්න ගියා. ඒකෙත් එහෙම දාලා නැහැ. ඒක නිසයි අපි එහාට දැම්මේ මෙහෙත් කෙරෙන්නේ නැති හින්දා. ඒකයි මේකට අත්සන් කරේ ඇත්තටම. මෙතුමා ඒ යෝජනාව ගෙනාවා. ලියුම හැදුවා. ඒක අපි කියවලා බලලා අත්සන් කරා. නිකං අත්සන් කරේ නැහැනේ. ඉතිං ඒ ගැන මම නම් කියන්නේ මේකෙන් හැල්ලු වෙනවා නම් අපි මේ සභාවේ ඉඳලා වැඩක් නැහැ සභාපතිතුමා. ඒක මම මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මම ඒක නෙමෙයිනේ කිව්වේ. දැන් ඔයගොල්ලෝ ඒ කර්මාන්ත 14 ක් ගෙනල්ලා ඒකට සම්පූර්ණයෙන් අවශ්‍ය මේවා ටික කරලා නඩු දාන්න කියලා කිව්වානේ. ඒ 14 ටම ඔයගොල්ලෝ මේවා ඔක්කොටම යවන කොට මට මොකක්ද මෙතන තියෙන තත්ත්වය. මට ඒකට උත්තර දෙන්නකෝ. මෙතන සභාපතිවරයා විදියට ඔයගොල්ලන්ට ඒ නිදහස දුන්නට පස්සේ මට සභාපතිවරයා විදියට මෙතන තියෙන තත්ත්වය මොකක්ද කියලා කියන්නකෝ. ඒකටත් උත්තර දෙන්නකෝ. මම කියන්නේ අපේ සභාවෙන්ද මේ දේවල් කරේ. ඔයගොල්ලොත් දන්නේ නැහැ සුගත් මන්ත්‍රීතුමා මෙතන වෙන දේ. මෙතන වෙන දේට ඔයගොල්ලොන්වත් අන්දලා තියෙන්නේ. මෙතන වෙන දේ මම හොඳටම දන්නවා. ඔයගොල්ලන්වත් අන්දලා ගහන ගේම් එක මම හොඳට බලනවා. ඒවාට නඩු දාන්න දෙන්නකෝ. ගිහිල්ලා බලලා නඩු දාන්න. එතකොට ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒවා ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නඩු දාපු ටික දෙන්නකෝ. මෙතන මේ ඔක්කොම කරන දේ මම දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා එහෙම යට මොකක් හරි තියෙනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යට නෙමෙයි. ඔබතුමා ගැන සියලු කාරණා මම දන්නවා අබේසේකර මන්ත්‍රීතුමා. අමුතුවෙන් සඳහන් කරන්න ඕන නැහැ. නඩු දාන්න ලැස්ති කරපු ඒ 14 ගැන විස්තර ටික දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කිව්වා ඉඳගෙන සැලසුම් කමිටුව එක්ක කතා කරන්න අපිව සම්බන්ධ කරනවා කියලා. ඒක කරේ නැහැ. ඊළඟට අපි ආවා එදා සැලසුම් කමිටුවට. ඉස්සරහ වාඩි වෙලා ඉන්නවා මෙහේ ඉන්න පර්ලි මිස්. අරහෙන් එතකොට කියනවා මන්ත්‍රීතුමා ඔහෙන් ඉන්න කියලා. මම හිතුවා වෙන මොකක් හරි ප්‍රශ්නයක්ද කියලා. මම ඇයිද කියලා ඇහුවම කොරෝනා නිසා කියලා කිව්වා. ඔබතුමා මේක අහගෙන ඉන්න. මේක ඔබතුමා කියපු එකක් නෙමෙයි. මම කිව්වේ ඒ තරම් උද්දච්ච තැනක ඉන්නේ ඒ නිලධාරිණිය. අහන්න එතන හිටියා පර්ලි මිස්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. මේක තේරුම් ගන්න ඕන කතාවක්. සති තුනකින් ආවේ නැහැ අදාළ නිලධාරිණිය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- බෝලෙ පාස් කරනවා ඔබතුමන්ලාට. සභාවටයි බලතල තියෙන්නේ අපිට නෙමෙයි කියලා කියනවා. මේක එදා කිවුවේ නැද්ද කියලා අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සති තුනකින් ඒ නිලධාරිණිය ආවේ නැහැ. අපේ විෂය නිලධාරිණිය නිරෝධායනය කරලා ඉන්නේ දැනටත්. මාසයක් වෙනවා දැන්. ඒ නිලධාරිණිය සති තුනකින් ආවේ නැහැ. බෝපෙ පෝද්දල නම් පැත්ත පළාතක යන්න එපා කියලා කාර්යාලයෙනුත් කියලා. ගෙන්න ගත්තේ දාහක් පොරොන්දු මධ්‍යයයේ. කිසි කෙනෙක් කිට්ටුවට ගෙන්වන්නේ නැහැ. ඔතනින් උඩට කවුරුවත් ගෙන්වන්නේ නැහැ කියලා දාහක් පොරොන්දු දීලා තමයි මිස්ව මෙතනට ගෙනාවේ. ඇත්ත කතාව ඒක. ඔය හැම පැත්තම බලාගෙන මෙතන වැඩ කරන්න පුලුවන්ද, මිනිස්සු කෑ ගහනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- එතකොට මම අහන්නේ ගරු සභාපතිතුමා මූණ ඉස්සරහ ඉඳගෙන ඉන්නවා පර්ලි මිස්. අරයා එතකොටම තමයි කිවුවේ මෙහේ එන්න එපා මන්ත්‍රීතුමා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මෙහෙමයි ඉතිං. ඒ අය කම්ටුවට වාඩිවෙන බව දැන ගෙනයි එන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මේවා චෙක් කරන කොට එතනට නැහැ. මෙන්න මේ අයට තමයි කොරෝනා තියෙන්නේ. කුණුහරුප. ඒ තරම් බයයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කොහොමත් මම උපදෙස් දීලා තියෙන්නේ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂකතුමාවයි, එන්.බී.ආර්.ඕ. එකේ බන්දුල මහත්තයවයි, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමාවයි සාකච්ඡාවකට ගෙන්වන්න ඉදිරි සති දෙක තුළ. මම ඒකට උපදෙස් දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, ඇත්තටම දැන් මේ ප්‍රශ්නය මේ තරම් අර්බුධයකට ලක් වෙන කාරණයක් වෙන්නේ නැහැ. ඔබතුමා කමිටුව පත් කරලා, කමිටුවට බලතල දීලා කමිටුවත් නිරීක්ෂණය කරලා අදාළ නිර්දේශ සහ යෝජනාවලියක් අපි දුන්නා. ඒ දුන්නට ඒකෙන් තෝරා ගත් කිහිපයක්ම අපි කිවුවා. ප්‍රධානම දේවල් ටිකක් ඒ. අපි පහයි ඉස්සෙල්ලා යෝජනා කරේ. 14 ක් කිවුවට 14 ටම කරන්න ඕනකමක් තිබුණේ නැහැ. අපි කිවුවේ මේකට යම් උදාහරණයක් හැටියට කරොත්, යම් ක්‍රියාමාර්ගයක් ගත්තම අනිත් අයටත් ඒක අත්දැකීමක් වේවි. ඒ මිනිස්සුන්ටත් බලපෑමක් වේවි. ඒ නිසා වහාම ක්‍රියාත්මක කරන්න කියලා කිවුවේ. ඊළඟට අපි කිවුවා මේ අවුරුදු පහ ඇතුළත කර්මාන්ත වල අඩුපාඩු තියෙන ඒවා වහාම ඒ ආයතන දැනුවත් කරලා ඒ ගැන සභාව දැනුවත් කරන්න කියලා. හැබැයි එහෙම දැනුවත් කරාද කියලා තාම සභාව දන්නේ නැහැ. අපි ඒක පැහැදිළිව කිවුවා. ඒ අයට දැනුම් දෙන්න වහාම මේක කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැනුවත් කරලා තියෙන්නේ. සියලු අයව දැනුවත් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඉතිං දැන් එහෙමනම් ඒ අයගේ ප්‍රතිචාර ආවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ප්‍රතිචාර ආවා. ප්‍රයිම් ලෑන්ඩ්ස් ආයතනය ප්‍රතිචාර දැක්වූවා. ඒ අය මෙතන කරන ඉඩමට අවසර දෙන්න කලින් ඉවර කරනවා කියලා කිවුවා. දැන් ඔය කරනවානේ රොස්වුඩ් වත්තේ එකක්. එකේ අනුකූලතා සහතිකය ගන්න කලින් කරනවා කිවුවා. නගරිගෙවත්තේ එකට ඒ කිවුවේ. ඒකේ අඩුපාඩු ඉවර කරනවා කියලා ඒ අය එකඟ වෙලා ඉන්නේ. ඊට පස්සේ බ්ලූ ලයින් සමාගම ඇවිල්ලා කිවුවා දෙසැම්බර් 31 ට කලින් ඉවර කරනවා කියලා. තව ඒෂියන් ක්‍රෙඩිට් ආයතනයත් ප්‍රතිචාර දක්වලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ඒ නිසා තමයි ගරු සභාපතිතුමනි, අපි යෝජනා කරේ මේ ක්‍රියාවලිය ගැන. සද්භාවයෙන් මේක දේශපාලන වශයෙන් ගත්තම සියළුම පාර්ශවයන් නියෝජනය වෙනවා. ඒකෙ ගැටළුවක් තිබුණේ නැහැ. ඒ අතරේ අපි කවුරුත් එකඟතාවයකට ආවා මේ සම්බන්ධයෙන් අපි නීත්‍යානුකූලව කරන්න පුලුවන් මැදිහත්වීම් කරමු කියලා. ඒකට වෙන වෙන ප්‍රශ්න තියා ගන්න ඕන නැහැ. මේක ඔබතුමාට නෙමෙයි කලින් ආව අයටත් බලපාපු, අපිත් දැන් මුහුණ දීලා ඉන්න, ඔබතුමාගෙන් පස්සෙත් කවදා හරි මුහුණ දෙන්න සිද්ධ වෙන තත්ත්වයක්. ඒ නිසා මේක කාටද කියලා අදාළ නැහැ. මේ සභාව ඇතුළේ ගන්න පරිපාලන ක්‍රියාවලියෙන් එළියේ සිද්ධ වෙන කර්මාන්ත සම්බන්ධයෙන් වන ක්‍රියාවලියක් අපි මේක ඇතුළේ නිවැරදිව හැසිරුවේ නැත්නම් ඒවා දිගින් දිගට ප්‍රශ්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා මන්ත්‍රීතුමා. මම වැඩි සද්භාවයෙන් මේක කරන්න කිවුවේ. ඔය එකක්වත් මගේ කාලයේදී කරපුවා නෙමෙයි. මට ඇත්තටම හිතෙනවා පුලුවන් නම් ඕක පළාත් පාලන කොමසාරිස්තුමාටයි, විගණකාධිපතිතුමාටයි කියලා විසඳගන්න. මම කිසි එකකට ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. පුලුවන් තැනකට ගිහිල්ලා බේර ගන්න. එහෙම හිතෙන්නේ නැද්ද මන්ත්‍රීතුමන්ලාට. ඔය කවුරු මෙතන හිටියත් ඒක හිතෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතනින් තමයි ක්‍රියාමාර්ග ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කවුරු මෙතන හිටියත් ඒක හිතෙනවා. මේ කාගේවත් පව් මම ගෙවන්න හදනවා මිනිස්සුත් තරහා කර ගෙන. අන්තිමට මේ ලෝකයටම පිටපත් දදා ලියුම් යවනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාට විරුද්ධව නෙමෙයි මේ ක්‍රියාවලිය ගියේ. ඔබතුමාට පෞද්ගලික දෙයක් කරන්න නෙමෙයි ගියේ. මේක ඔබතුමාගේ වැරැද්දක් කියන එකක් නෙමෙයිනේ. ඔබතුමාගේ පෞද්ගලික ප්‍රශ්නයක් විදියට ඔබතුමා කලබල වෙන්න එපා. ඔබතුමා ගැන වැරැද්දක් කියනවා නෙමෙයි. මේ ක්‍රියාවලිය ගැන තියෙන වැරැද්ද ඉදිරිපත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ වැරැද්දක් නැත්තේ මොකද මන්ත්‍රීතුමා. මට කියලා මෙතනින් මේ ප්‍රශ්න බේරගන්න බැරි හින්දානේ උඩට දාන්නේ. විහිළු කතානේ මේවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙමයි. ඔය කාරණයේදී ඔබතුමා පැහැදිළිව කිවුවානේ. දැන් අපි එකඟතාවයන් කිහිපයකටම ආවානේ. ඔබතුමා කිවුවා නිරීක්ෂණය කරලා වාර්තාවක් දෙන්න කියලා. අපි ඒක දුන්නා. ඒ දුන්නට පස්සේ අපි එවෙලේ තීරණයකට ආවා මේ සියල්ලටම නෙමෙයි ප්‍රමුඛතාවය අනුව තෝරාගත් කාරණා කිහිපයකට නීතිමය ක්‍රියාමාර්ග ගමු කියලා. අනිත් සියල්ල දැනුවත් කරමු. අඩුපාඩු තියෙන ඒවාට එන ප්‍රතිචාර, සභාගත කරලා අපි කිවුවා සභාව දැනුවත් කරන්න කියලා. එතකොට ඒ ක්‍රියාවලිය ඉස්සරහට ගියේ නැහැ. අතන නඩු යන එකක් දෙකක් යන්න ඇති. නමුත් මේක ක්‍රමවත්ව ගියේ නැති හින්දා තමයි මේ ලියුමට අපි කමිටුවක් හැටියට අත්සන් කරේ. එහෙම නැතුව මේක ඔබතුමා කරපු නැති හින්දා ඔබතුමාව අපහසුතාවයට ලක් කරන්න පෞද්ගලික විරෝධතාවයකින් කරපු දෙයක් නෙමෙයි. මේක ගැන වැරදියට තේරුම් ගන්න එපා. අපි කවුරුත් එකඟව, ඔබතුමත් එකඟව මේ කමිටුවට බලතල දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ. ඔබතුමන්ලාට අපි නිලධාරියෙකුත් දීලා තියෙනවා. ඔබතුමන්ලාට ඒ කමිටුව විදියට ඇවිල්ලා මට කියන්න තිබුණා සභාපතිතුමා මෙන්න මේ දේවල් වෙන්නේ නැහැ කියලා. මේකෙ කොහෙද අබේසේකර මන්ත්‍රීතුමා, මෙන්න ප්‍රතිඵල තියෙනවා ඒකෙ එවපු ඒවාට.

අනතුරුදායක, අනවසර හා අවිධිමත් ඉදිකිරීම් සහ ඉඩම් කටයුතු සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම. (සේනක පල්ලියගුරුගේ, පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත)

කමිටු පත්කරලා ඔක්කොම කරලා තියෙනවා ක්‍රියාත්මක වෙලා නැහැ. මේකෙ තියෙන්නේ එහෙමනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉතිං ගරු සභාපතිතුමා අපි ඔය කාරණය ඔය ලියුමෙන් නෙමෙයිනේ කිවුවේ. ඊට කලින් අපි සභාවට වාර්තා දීලා මේවා සම්බන්ධව සාකච්ඡා කරලා එකඟතාවය අරගෙන ක්‍රියාත්මක වෙන්න කියලා තීන්දු තීරණ ගත්තානේ. ඒකනේ අපි කියන්නේ. මේ දක්වා එහෙම ගනිපු ඒවා ඔබතුමා දැන් කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ තියෙන්නේ පිටපත් දාපුවා. විගණකාධිපතිතුමාට, ආණ්ඩුකාරතුමාට, පළාත් පාලන කොමසාරිස්තුමාට කරන්නනේ මේ දාලා තියෙන්නේ. ඔය දාලා තියෙන්නේ මොකටද, මම අහන්නේ ඔය දැම්මේ මොකටද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට ඉහළින් තියෙන අදාළ ආයතනය ඒ. ඉතිං ඒ අයව දැනුවත් කරාට කමක් නැහැ. මොකක්ද ඒකෙ තියෙන වැරැද්ද. ඒකෙ තියෙන වැරැද්ද මොකක්ද කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔයගොල්ලෝ අහලා තියෙනවද ගෙදර ප්‍රශ්න පිටට දෙන්න හොඳ නැහැ කියන එක. අහලා තියෙනවාද එහෙම එකක්. අපි කටයුතු නොකර ඉඳලා තියෙනවාද, මේ සම්බන්ධව. මම අහන්නේ එකම දෙයයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මට ඒක පැහැදිලි කරන්න ඉඩ දෙන්න. ඔබතුමා සුගත් මන්ත්‍රීතුමා, මම ගියා තරංගා ලැන්ඩ්ස් ආයතනය වෙන්දේසි කරන ඉඩමට. යනකොට දාලා තිබුණේ නැහැ කිසි දෙයක්. ගල් එක්කහු කරලා අඟල් හතරේ ගල් දාලා හදන්න කියලා කිවුවා. කරාද ඒක. දැන් ඔබතුමන්ලා අපි ගියානේ වටරැක. ගිහිල්ලා ඉවර වෙලා කරන්න කිවුවා. ගල් ටික එකතු කරලා අඟල් හතරේ ගල් දාලා කරන්න කිවුවා. කරාද ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරානේ ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, මම දැන් අභියෝග කරනවා ඔබතුමාට, ඕන කෙනෙකුට. මම ගුණවර්ධන මහත්තයාටත් කතා කරලා කිවුවා කට්ටිය ඉන්න කොට. මට කිවුවා නැහැ, අපි හරියට චෙක් කරලා බලලා, කඩලා බලලා කිවුවා කරන්නේ. මම කිවුවා ඔබතුමා ඒ නිර්දේශ කරපු දහපොළක් විතර මම කියන්නම් ඒ කාලය තිබුණේ නැහැ කියලා. අඟල් හතරේ එක ගලක් තිබුණේ නැහැ කියලා කිවුවා. මොකද දාලා නැහැ, දැම්මේ නැහැ. දැන් මොකක්ද කරේ පේන්න තැන් තැන්වල ටික ටික දාගෙන ගියා. දාගෙන ගිහිල්ලා අර තිබුණ විදියටම දැම්මා. දාලා නිකං හිටියා විතරක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඒකනේ මේක අපිට ගත්තේ. එවෙලේ ගියා. අපි දැක්කා අඟල් හතරේ ගල් නැහැ කියලා. අපි කිවුවා ඒවා ගලවන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගැලෙව්වේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම යද්දීත් අපේ තාක්ෂණ නිලධාරි එක්ක අඟල් හතරේ ගල් එලලා තිබුණා. අපි තාක්ෂණ නිලධාරි අධීක්ෂණයෙන් තමයි ළඟ ඉඳලා ඒක කරවාගත්තේ. නොගියම දේවල් වෙනවා ඇති. ඒක තමයි අවුරුදු පහේ ගිවිසුමකට යන්නේ. ඒක හින්දා ඒක නැතුව, ඒවා නවත්වලා සියලු දේවල් අපෙන් කරන්න තීන්දු කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා එදා ඒකෙ හරි තීන්දුව ගත්තා නම් හරි. ගල් අඩුක් කරලා තාක්ෂණ නිලධාරීට බලන්න එන්න කියන්න ඕන. එහෙම කියලා ගත්තා නම් ඒ ටික හරියට කෙරෙනවා. දැන් මොකක්ද කරේ තැනින් තැන ගල් මේවා කරා. මම කියන්නම් ඕන නම් නැති තැන් ටික. මම අභියෝගය භාර ගන්නවා. ඒක මම ඔබතුමාට බොහොම පැහැදිලිව කිවුවා.

ඊළඟට යන්න නගරිගෙවත්ත ඉඩමට, කපුහෙම්පලට, ඉන්ග්ලන්ඩ් හිල් එකට. බලන්න ඒකෙ එක අඟල් හතරේ ගලක් දාලද කියලා. දාලා නැහැ. ඉතිං එතකොට අවුරුදු පහේ ගිවිසුම තියෙනවා කියලා කියනවා. මුන් යනකොට කැඩිච්ච තැන් ටික හදලා යාවි. එතකොට අනිත් තැන් නිකම්ම කැඩෙනවා. එහෙම එකක් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ. අපිට ඉංජිනේරුවෙක් දෙන සහතිකයට අභියෝග කරන්න බැහැ. ඒක හැමදාම මේ සභාවේ මතුවෙන ප්‍රශ්නයක්. අපිට ඉංජිනේරුවෙක් අන්තිමට දෙනවා ඒ අයගේ අධීක්ෂණය යටතේ මේක කරා කියලා. අපිට ඒකට අභියෝග කරන්න බැහැ. ඒක හින්දා තමයි සම්පූර්ණයෙන්ම ඒවා මුකුත් නැතුව ඇස්තමේන්තු හදලා සභාවෙන් කරන්න තීරණය කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ යෝජනාව මුලින්ම ගෙනාවේ මම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක නිසා තමයි කිවුවේ. දැන් ඉස්සරහට එන ඒවාටනේ අපි ඒ ක්‍රියාමාර්ග ගන්නේ. දැන් මෙතෙක් කරපු ඒවාට අපි වගකියන්න ඕනනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක නිසා තමයි අවුරුදු පහක ගිවිසුමක් ගහලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ගිවිසුම වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩක් නැත්තේ නැහැ. ඒ අයට තවත් මෙහේ වෙන්දේසියක් කරන්න ඉඩ දෙන්නේ නැහැ එක්කෝ. කරොත් ඒකට අනුමැතිය දෙන්නේ අරක ඉවර කරාට පස්සේ. නැතුව කොහොමද කියන්නේ. දැන් නගරිගෙවත්තේ එක ගැන කියනවානේ. රොස්වුඩ් වත්තේ එකට අවසර දෙන්නේ නැහැ නගරිගෙවත්තේ එකේ වැඩ අවසන් වෙනකම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කොන්දේසි දාන්න ඕන හින්දා තමයි අපි මේ බලපෑම් කරන්නේ. නැතුව වෙන මොහොතකටවත් නෙමෙයි. ඒක නිසා තමයි කරන්නේ. ඒ බලපෑම නොකරන තාක්කල් ඒක වෙන්නේ නැහැනේ. දැන් ඔබතුමාට මේ බලපෑම් කරන්න සිද්ධ වුණේ අපි කතා කර ගනිපු

නිසානේ. ඔබතුමාගේ කාලෙට කලින් එහෙම එකක්වත් වුණේ නැහැනේ. එහෙම වෙච්ච නැති එකේ අඩුපාඩුව නිසානේ අපේ සභා අරමුදල් වලින් ලොකු බරපැනක් දරන්න සිද්ධ වෙලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවාද, ඔය ගියාට පස්සේ වෙනම ගිහිල්ලා තියෙනවා. වැඩක් නැහැ. ඔය දේවල් කතා කරලා වැඩක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ දේවල් ගැන සභාව දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙච්චර දෙන්න කියලා ඉල්ලපු අය ඉන්නවා. මම මේක මෙච්චර වෙලා නොකිය හිටියා. එහෙම ඉල්ලපු අය ඉන්නවා. අපි ලෙඩ අදිනවා හිර වෙන්න. ඒක හින්දා ඔය ගොල්ලන්ට මේක කරන්න දෙන්නේ නැහැ. අපිට මෙච්චර ගාණක් දෙන්න මේකට නිශ්ශබ්ද වෙලා ඉන්නම් කියලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඔය කමිටුව විසුරුවන්න යෝජනාවක් මම දැන් ගේනවා. ඔය කවුද කියලා කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුද කියලා කියන්න. වගකීමෙන් කියන්න.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපේ ගෙවල් වලටත් ආවා. මම කියලා යැවුවා අපි සල්ලි වලට විකිණෙන මන්ත්‍රීවරු නෙමෙයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මෙතන ඒක අවංකවම කියන්න බැහැ. කියන්න බැරි හේතුව මම කියන්නම්. මට පුද්ගලිකව හමුවුණොත් කවුද නොකියා මම කියන්නම්. මට කියන්න බැහැ. අපිත් බොහොම හිතවත්. සමහරු හිතවත්. එහෙම අය ඉන්නවා. ඒක හින්දා කියන්න බැහැ. මම අවංකවම මේ කියන්නේ අදාළ ආයතන වලට ගිහිල්ලා මට මෙන්න මේ දේවල් වලට ඕන කියලා ඉල්ලගෙන ගියපු අය ඉන්නවා. එහෙම නම් වෙන්දේසිකාරයොන්ගේ ඒ තැන් වලට යන්න ඕන නැහැ. මට මේකට යන්න ඕන, අරකට යන්න ඕන කියලා ඉල්ල ගනිපු අය ඉන්නවා. මම කියන්නේ ඉන්නවා. නැත්තේ නැහැ.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා සභාපතිධූරයේ ඉඳගෙන කියපු කතාව අපි හෙළා දකිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ කමිටුවේ අපිත් ඉන්නවා. අපි කවදාවත් එහෙම කරලා නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිළිව කියන්න ඒක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කවුද කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒ අදාළ ආයතන වලින් අහලා කියන්නම්.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙහෙමයි. තම තමන්ගේ දැනුම් මට්ටම අනුව හිතාගන්න පුලුවන් කවුද කියලා. ඒක බොහොම පැහැදිළි කතාවක්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිළිව ඒක දන්නවා.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවාද, එහෙම ඒවා ඕන තරම් තියෙනවා. අර මීපාවල ගෑණු මනුස්සයාගෙන් ලක්ෂ දෙක ගනිපු කට්ටිය මෙතන ඉන්නවා. අර මීපාවල පැත්තේ නවාතැන කියලා මොකක්ද එකෙන් ගනිපු අය ඉන්නවා. කරුණාකරලා කියන්න. අපි මේ අය ගැන අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවට දීලා මේවා කරන්න බැරි ඇයි. ඇයි එහෙම කරන්න බැරි. ඒ ආයතන තියෙන්නේ ඒකටනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කමිටුව නියෝජනය කරන්නේ මන්ත්‍රීවරු. එහෙම නොකරන මන්ත්‍රීවරු හැටියට ඒ අය අපි විශ්වාස කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේ සභාපතිවරයා හෝ ලේකම්වරයාගෙන් එක්කෙනෙක් කියලා මම කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක එහෙම හිතා ගන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය කිසිදු එකකට අනුමැතිය දීලා තියෙන්නේ අපි නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ එහෙම නෙමෙයි කියන්නේ. මම මේවට ලෙඩ අදිනවා මට මෙච්චර ගාණක් දුන්නොත් පැත්තකට වෙලා ඉන්නවා කියනවා. ඉතිං ඒකනේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ලෙඩ අදින්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඕක කියන්න හේතුව මොකක්ද දන්නවද, අපි මේ කමිටුවට පත් වෙලා තියෙනවා. මම නම් මේ වෙන කොට එක වෙන්දේසිකාරයෙක්ගේවත් දොරකොඩ ළඟට ගිහිල්ලා නැහැ. ඒක පැහැදිළිවම හෘද සාක්ෂිය අනුව කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා ඔබතුමා කියන එකේ යම් සත්‍යතාවයක් තියෙනවා. අපිත් මන්ත්‍රීවරු කාලයේ අපි ගිහින් සටන් කරා. නමුත් වැඩේ යද්දි අපිත් විකිණිලා බලනකොට. අපේ නමුත් කියලා අරගෙන තිබුණා. අර ආපු මන්ත්‍රීවරයාටත් දෙන්න ඕන මෙහෙම මෙහෙමයි කියලා තිබුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක තමයි ප්‍රශ්නය. අපි නොදැනුවත්ව අපිව විකිණෙන්න බැහැ මෙහෙම. මොකද අපි එවැනි මැදිහත්වීමක් කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙන් හොරා කන එක නවත්වන එක නෙමෙයි වෙන්නේ, හොරා කන එකට උල්පන්දන් දෙන එක වෙන්නේ. තේරුණාද, මේක නවත්වන එක නෙමෙයි වෙන්නේ. ඒක හින්දා තමයි මම දිගටම අබේසේකර මන්ත්‍රීතුමා එක්කත් කිව්වේ සභාවේ අධීක්ෂණය යටතේ සභාවෙන් ඇස්තමේන්තු හදලා සභාවේ අනෙක් කර්මාන්ත කරන විදියට ලේස්ති කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට මුකුත් කරන්න බැහැ. කෙරෙන්නේ අපෙන්. අවුරුදු පහේ ගිවිසුම් ගහන්නත් බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අවුරුදු පහේ ගිවිසුම කියන්නේ කුණුහබ්බයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අවශ්‍යයත් නැහැ. ඒක කෙරෙන්නේ අපෙන්. ඔය ප්‍රශ්නය හින්දා මම ඒක නොකිය නොකිය ඉඳලා කියන්න සුද්ධ වුණා. මෙහෙම ප්‍රශ්නයකුත් මෙතන තියෙනවා. තේරුණාද, මෙහෙම අර්බුදයකුත් එක්ක මේ යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඕක නිරවුල් කරන්නකෝ. අපි දිගින් දිගට මේක සම්බන්ධව කතා කරලා වැඩක් නැහැ. ගරු සභාපතිතුමනි, ඒ සිද්ධිය සිද්ධ වෙන්නේ පහුගිය කාලයේ ඒවාටනේ. දැන් ඉස්සරහට ඒවා සිද්ධ වෙන්නේ නැහැනේ. ඒවාට හරි ක්‍රියාමාර්ග ගන්න. එච්චරයි. දැන් ඔබතුමා මෙතන සාකච්ඡා කරේ මේ ලියුමක් සම්බන්ධයෙන්. ඒකටත් අපි කිව්වේ ඒක. අපේ නිදහසට කාරණය කිව්වේ. ඒ කියන්නේ අපි මේ ලියුම යොමු කරේ ඔබතුමාට හෝ කාටහරි පෞද්ගලිකව ප්‍රශ්නයක් ඇති කරන්න නෙමෙයි. මේ ලියුම ඔබතුමා කියවනවිටත් ඒක කිව්වා. ක්‍රියාමාර්ග ගන්න යෝජනා වෙලා තියෙනවා. ඒවා සම්බන්ධව ක්‍රියාමාර්ග අරගෙන නැහැ. සභාගත කරන්න කියලත් කිව්වා ඒ යෝජනා. ඒ යෝජනාව ක්‍රියාත්මක කරන ආකාරය සභාගත කරන්න කියලා කිව්වා. ඒවා ලැබිලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් අපි දීපු යෝජනා හා නිර්දේශයන් එක්ක එකඟතාවයකට ආවා. ඒවා ක්‍රියාත්මක වුණ විදිය දැනුම් දුන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කියන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි. ඒක නොවුණ නිසානේ ඔය සිද්ධිය සිදු වුණේ. එහෙම නැත්නම් ඔය සිද්ධිය ඔහොම වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළවෙනි එක හපුගල බටුවන්තුඩාවේ මවුන්ට්කැල්වරි පුද්ගලික පාසල ඉස්සරහ ඉඩමේ එකට අවසර දීලා තියෙන්නේ. එන්.බී.ආර්.ඕ. රිපෝට් දීලා තියෙන්නේ. ඒක කවුරුත් දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අපි ඉංජිනේරුවෝ නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒකනේ කිවුවේ බන්දුල මහතා ඇතුළු ඒ සියලු අය ගෙන්වනවා. එතකොට අහන්න පුලුවන් මේක දුන්නේ කොහොමද කියලා.

ඊට පස්සේ බටුවන්තුඩාව පාරේ ග්‍රෑන්ඩ් පැනරෝමා ඇක්සස් ආයතනය වෙන්දේසි කරන ලද ඉඩම. මේකෙ අක්කර හතරක් වෙන්දේසි කරන්නේ නැහැ කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට අවසර දීලා හදපු ගෙවල් කොහොමද හදලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට දීලා තියෙනවා ප්‍රදේශවාසීන්ගේ නොහික්මුණු ක්‍රියාවන් නිසා මෙම තත්ත්වය උද්ගත වෙලා තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක වැඩක් ඇති එකක් නෙමෙයි. ඒ කියන්නේ බියර් බොන ඒවා අරවා මේවා ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නිවැරදි කරලා තියෙන්නේ දැන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නිවැරදි කරලා එතන වැට ගහන්න. එතන ඉඩම අපිට දීලා තියෙන එක වැරදියි. ඒක වෙනයි. නමුත් ඒකෙත් ඉඩමේ මායිමටම කපලා තියෙනවා. දැන් මේවා අපේ තාක්ෂණ නිලධාරී එක්කත් ගිහිල්ලා අපි පෙන්නුවා. පෙන්වලා අපේ මන්ත්‍රීවරු ටික එකින් එකට ගියා. දැන් ඔබතුමා යන්න බලන්න. අර තට්ටු තුනේ ගෙදර හදලා ඉවරයි. ඒක පැත්තකට දාන්නකෝ. අර එහායින් හදනවා ගෙයක්. කෙහෙන්ද වතුර බැහැලා යන්නේ. දැන් මේ තියෙන ඒවායින් කොහොමද යන්නේ කියලා බලන්න. මොකක්ද වෙන්නේ කියලා බලන්නකෝ. එන්.බී.ආර්.ඕ. එක දීපු නිර්දේශ අනුව ක්‍රියාකරලා තියෙනවද කියලා බලන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් සඳහන් කරපු රජගෙදර වත්ත වෙන්දේසි ඉඩමේ කාණු පද්ධතිය විධිමත් කරන්න එදා අපි කතා කරා. අනිත් පැත්තේ කාණු වලට දැල් නෙට් එකක් දාන්න කතා කරා. ඒ ටික අපිට කරන්න පුලුවන් විදියට දැනුම් දීලා තියෙන්නේ.

ඊට පස්සේ වටරැක කළුපහන, සමෘද්ධි කාර්යාලය අසල එක. මේක ඒකටම අදාළයි. මේක සභාවෙන් හදන්න තියෙන්නේ. ඒ හතරවෙනි ප්‍රශ්නයට අදාළ එක සභාවෙන් කරන්න ඕන එකක්.

වටරැක කළුපහන පාරේ නගරිගෙවත්ත වෙන්දේසි ඉඩම හරහා ඇති කොහුමෝලට යන මාර්ගය අපි ප්‍රයිම් ලෑන්ඩ් ආයතනයට හදන්න කියලා තියෙන්නේ. මම කලින් කිවුවා වගේ මේක කරලා ඉවර කරන්න කලින් ඒක කරාවි. එතකොට ඒ ටික හරි.

කලේගාන ප්‍රාදේශීය සභාව පිටුපස ඇති වී.සී. පාරේ ගල් බැම්මේ ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා අර වටරැක ඉඩමට අනුමැතිය දෙනකොට පොඩ්ඩක් බලන්න. දැන් අර පාරක් හදලා තියෙනවානේ. දැනට පාර වහලා තියෙන්නේ. එක්කෝ ඒ පාර අයින් වෙන්න ඕන, පස්සේ හදපු පාරක් නම්. එක්කෝ ගේ අයින් වෙන්න ඕන ගේ පස්සේ හදපු එකක් නම්. ඒක ටිකක් සලකා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද, මොන පැත්තේ එකද ඔය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඔය ඉඩම සේනාරත්න මහත්තයාලගේ ගෙවල් ගාව එක. දැන් ඔය සේනාරත්න මහත්මයා මෙතනට ඇවිල්ලා මේ සභාව ගාව වාඩි වෙන්න කතා කරලා ලොකු මේවා එකක් කරා. මම මෙතන වාඩි වෙනවා කියලා සේනාරත්න මහත්මයා කිවුවේ. මේ සභාව දූෂිත සභාවක්, හොරු ඉන්නවා කියලා කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිරාලගේ ගෙදර වහළ කපලානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** වහල කපලා තියෙනවා. ඔය සේනාරත්න මහත්තයා තමයි කිව්වේ එයා සභාව ගාව වාඩි වෙනවා, මේවා කරනවා කියලා. අපේ ගෙදරත් ඇවිල්ලා කතා කරා. මෙතන මහා විනාශයක් කරා පහුගිය කාලේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ මොකක් හරි වෙන්න ඇති. එහෙම තමයි මන්ත්‍රීතුමා විරෝධය පානවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඉතිං එතුමාගේ ඉල්ලීම මම ඉටු කරන්න ඕන. අපිත් එක්ක ඡන්දය ඉල්ලපු මහත්තයෙක්. ඒක හින්දා මම දන්නේ නැහැ ගේ පස්සේ හැඳුවද, පාර පස්සේ හැඳුවද කියලා. සභාපතිතුමාටත් චෝදනා කරා. සභාවටත් චෝදනා කරා එතුමා. ඉතිං මම කියන්නේ එතුමා වෙනුවෙන් ඒ කටයුත්ත කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔහොමම තමයි අර බටුවන්තුඩාවේ ඇක්සස් එකේ ඉඩමට අනුරුද්ධ කරේ. අපේ ගෙදර ඉස්සරහට ඇවිල්ලා මැරුණේ නැති එක විතරයි පපුව හිරවෙලා. හැමදාම එනවා. මම උදේට නැගිටින්නේ ඒ මිනිහා ඇවිල්ලා නිසා. මේක කරන්න දෙන්න එපා මෙහෙම මෙහෙමයි කියලා අන්තිමට පන්සලේ රැස්වීම තියලා අපි විරුද්ධව කතා කරන කොට මිනිහා පක්ෂව කතා කරනවා. ඔන්න තත්ත්වය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එතුමා පැදුරක් අරගෙන ඇවිල්ලා සභාව දවසට වාඩිවෙනවා කියලා කිවුවා දූෂිත සභාවක් කියලා. යන්තම් ඒක නැවතිලා තියෙනවා දැන්. ඒ හින්දා නීතියේ ඒ පැත්තත් බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කලේගාන ප්‍රාදේශීය සභාව පිටුපස ඇති වී.සී. පාරේ ගල් බැම්මේ ප්‍රශ්නය ගැන ඒ වෛද්‍යවරයා ඇවිල්ලා කතා කරා. දැන් අයින දිගේ වතුර බස්සවන්න එකඟතාවයකට ඇවිල්ලා තියෙනවා.

ඊට පස්සේ හපුගල සුධර්මාරාම පන්සල අසලින් කාගිල්ස් ෆුඩ්සිටිය පිටුපස ඇති එක. අංක 10 යටතේ ඒක තියෙන්නේ. මේක ගොවිජන සේවා එකෙන් නඩු දාලා පරාද වෙච්ච එකක්. ඒ අනුව අනුමැතිය දීලා තියෙන්නේ. මගේ කාලයේ නෙමෙයි ඊට කලින් දීලා තියෙන්නේ. දැන් අපි ඒ අනුමැතිය තාවකාලිකව අවලංගු කරලා තියෙනවා. ඒකට විරුද්ධව අපි ක්‍රියාමාර්ගයක් ගන්නවා. ඒකට ගොවිජන සේවා එකෙන් නඩුවක් දාලා පරාද වෙලා තියෙන්නේ. නමුත් අපි මෙහෙන් අනුමත කරලා දීලා තිබුණා. ඒක තාවකාලිකව නවත්වලා තියෙන්නේ. අපි නැවත ඒකට නීත්‍යානුකූලව ක්‍රියාමාර්ගයකට යන්න ලේස්ති කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා දැන් ඔබතුමා දන්නවා මෙතන හදන ගොඩනැගිල්ලට කොහොම අඩිතාලමක්ද දාන්න ඕන කියලා. අපි හදන ගොඩනැගිල්ලට පිහිටි පොළව වෙලත් කොහොම අඩිතාලමක් දාන්න ඕනද කියලා දන්නවා. අරක හදලා තියෙන්නේ වෙලක. ගොවිජන සේවා එකේ කතාව පැත්තකට දාන්නකෝ. කවුරු කොහොම නිර්දේශ කරලද අර ගොඩනැගිල්ල හදන්න දීලා තියෙන්නේ. අර ළමයිනේ ඉන්නේ අන්තිමට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි දන්නේ නැහැ. ඒකෙ කාලෙන් කාලෙට තට්ටුව තට්ටුව උඩට යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙන් අනුමත කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අඩිතාලම කොහොමද දන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන තාක්ෂණ නිලධාරීට සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි ඒ. ජී. පී. එස්. ගුණසේකර මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සභාවෙන් අනුමත කර ඇති බවත්, අඩිතාලම ඉදිකිරීම වරලත් ඉංජිනේරු ගුණවර්ධන මහතාගේ අධීක්ෂණය යටතේ සිදු කර ඇති බවත්,
- අඩිතාලම තට්ටු හතරකට සරිලන සේ අඩි 5 X 5 බේස් දමා ඇති බව.
- පහල කොටස සඳහා වරලත් ඉංජිනේරුවරයාගේ උපදෙස් මත අනුකූලතා සහතිකය ලබා ගෙන ඇති බව.
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභාපතිතුමා ඇත්තටම සතුටු වෙන්න ඕනනේ. මොනවා හරි වැඩක් දැන් කෙරිලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නෙත් ඒකයි. නොකර ඉඳලා නැහැනේ. මෙච්චර මේ කෙරිච්ච එකේ ඇයි උඩට දාන්නේ. මම අහන්නේ එච්චරයි. මම නොකරපු ඒවා ගැන කිවුවේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා සභාව දැනුවත් කරේ දැන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මම දැන් මේකෙ අවුරුදු කීයක් ඉන්නවද, මමත් ඔය සියළු දෙනා එක්ක වැඩ කරලා තියෙනවා. අනිත් අයට කරෙත් ඔහොම තමයි. මටත් ඔහොම කරන කොට තේරෙනවා මට වෙන්නෙත් ඒක තමයි කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මාත් එක්කම. මාත් එක්ක තමයි අනිත් හැම වැඩක්ම කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙච්ච තැන් තියෙනවානේ. මම ඒක ඕන වෙලාවක කියනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙච්ච තැනුත්, පක්ෂ වෙච්ච තැනුත් කියන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙච්ච තැනුත් තියෙනවා පක්ෂ වෙච්ච තැනුත් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට අර මූණ බලන්න බැහැ, මේ මූණ බලන්න බැහැ. එහෙම බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම උදාහරණයක් කියන්නම් ඕන නම්. ඇක්සස් ඉඩමේ ප්‍රශ්නයට මම විරුද්ධයි. අබේසේකර මන්ත්‍රීතුමා පක්ෂයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකටද පක්ෂ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇක්සස් ඉඩමට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මතක තියා ගන්න. ඔබතුමාට බොහොම හොඳට තෝරලා දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුලින් පක්ෂව නෙමෙයිද හිටියේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කතා කරන දේ අහගෙන ඉඳලා උත්තර දෙන්න. ඒ ඉඩමම තියා ගන්නකෝ. ඔබතුමා බොහොම පැහැදිළිව කිවුවා. මම යෝජනාවලුත් ගෙනල්ලා කිවුවා. මිනිස්සුන්ට සල්ලි ඕන වුණාම ඉඩම් විකුණනවා. ඒක ගන්න ඕන. ඒකට මම යෝජනා කරා එක්කෝ ඒක සභාවට ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අභියෝග කරනවා. ඔබතුමා ඒකෙදි විරුද්ධ මතයක් ප්‍රකාශ කරපු තැනක් පෙන්වන්න මට සභා වාර්තා ගෙනල්ලා. පස්සෙනේ විරුද්ධ වුණේ. වැඩේ ඔක්කොම ගියාට පස්සේ විරුද්ධ වුණා. බටුවන්තුඩාව පන්සලේ තිබුණ රැස්වීමේදීවත් එක වචනයක්වත් ප්‍රකාශ කරේ නැහැ ඔබතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අහගෙන ඉන්න කියන දේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔයගොල්ලෝ දන්නවද ඇක්සස් එකෙන් දැන් කියන කතාව. මෙන්ඩිස් මහත්තයාව මම ගෙන්වන්නම් බොරුනම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගෙන්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇක්සස් එකෙන් ඔබතුමා ඉස්සෙල්ලා සල්ලි ගත්තා. දෙවෙනි පාරත් ඉල්ලලා නොදීපු හින්දා ඔබතුමා විරුද්ධ වුණා කියන එක කියන්නේ. මෙන්ඩිස් මහත්තයා දැන් ගෙන්වන්නම්. ඇත්ත කතාව අපි දන්නවා. පළවෙනි පාර ඔබතුමා පක්ෂයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ගන්න ඒවා විතරක් නෙමෙයි ඔබතුමා හදපු පාර මාස දෙකක් තුනක් තිබුණේ නැහැ කැඩුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වතුර ටැංකිය පාර. ඇක්සස් එක ලවා දැම්මා ඒක. ඔබතුමා ගනිපු ඒවා මම කියන්නම්. ඊයේ පෙරේදත් ගත්තේ නැද්ද නවාතැනෙන්. අහගන්න එපා මේවා එක. අනේ බබා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහෙන්ද ගත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරිගේ ඉඳන් දන්නවා. මම අභියෝග කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙන්ඩිස් මහත්තයාව එක්කන් එන්නම්. අහමු මූණට. මම අහන්නද, මම මේක මෙන්ඩිස් මහත්තයාගෙන් අහනවා. මම අනිත් එක අභියෝග කරනවා. ඇක්සස් ඉඩමට විරුද්ධව කතා කරපු එක වචනයක් පෙන්වන්න. මම නම් කියලම කියනවා. මම මෙතෙක් නොකිය හිටියා මේවා. අනිත් මන්ත්‍රීවරු අද මේවාට අහුවෙලා තියෙන්නේ. මම බොහොම විවෘතව කියන්නේ තේරුණාද, අනිත් මන්ත්‍රීවරු අහුවෙලා ඉන්නේ. නමුත් විකිණිලා ඉන්නේ අද වෙනකොට. ඒක තේරුම් ගන්න ඕන. මෙන්ඩිස් මහත්තයාව ගෙන්වලා අහමු ඕන නම්. එකගද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අහන්න ගෙන්වලා මේ සභාවට. සභාවේදී හැබැයි, පිටදී නෙමෙයි. මේ සභාවට ඇවිල්ලා කියන්න ඕන. නැත්නම් වැඩක් නැහැ. සභාව පවත්වන වෙලාවට ඇවිල්ලා කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මිනිස්සු කියන්න බයයි. ඒ මිනිස්සු වෙන්දේසි කරලා ඉවරයි. කිවුවොත් නයි වගේ එළව එළවා පහර දෙනවා. ඇත්ත කතාව. නයි වගේ එළව එළවා පහර දෙනවා මිනිස්සුන්ට කිවුවොත්. ඒක නිසා ඒ මිනිස්සු කියන්න බයයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔබතුමා ගනිපු ඒවා කියන්නේ නැත්තේ සභාපතිකමේ ඉන්න හින්දා. නැත්නම් ඒවා කියනවා මෙහෙම මෙහෙමයි කියලා. මේ අහගන්න මට එකක් පැහැදිළි කරන්න ඕන. මොකද දන්නවාද ඇක්සස් ඉඩමේ ප්‍රශ්නය ගැන. ඔබතුමා දන්නවා ඒක සමරවීර මහත්තයාගේ ඉඩම. සමරවීර මහත්තයා කියන්නේ මාත් එක්ක අවුරුදු 13 ක් ඉස්කෝලේ ගියපු මනුස්සයා. මතක තියා ගන්න. එතකොට ඒ මනුස්සයාගේ දේට මට විරුද්ධ වෙන්න බැහැ. හැබැයි මම ඉඳගෙන කිවුවා මේ කැල්ලට නම් ඉඩ දෙන්න බැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔන්න බලන්න ප්‍රතිපත්ති වල හැටි. ඔන්න ප්‍රතිපත්ති හොඳේ. දැන් ඇක්සස් එකට විරුද්ධව සටන් කරනවා. නමුත් දැන් කියන්නේ එවෙලේ සටන් කරන්න බැහැ මගේ යාළුවා සමරවීර නිසා කියලා. යාළු කතා ඒවා බැහැ කියලා ඔබතුමා දැන් කිවුවා. පුදුම කතානේ මේවා. හතරබීරි කතා. ඔබතුමා දැන් කියපු සමරවීර මහත්තයාගේ ප්‍රශ්නය මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කිවුවේ ඒ මිනිස්සුන්ට සල්ලි ඕන. දාන්න ඔක්කොටම. සියලු දේවල් ඔක්කොම නීත්‍යානුකූලව දාන්න. මෙහා කැල්ලේ පාර විතරයි දානවා කිවුවේ. අපි දිගින් දිගටම විරුද්ධ වුණා. ඔබතුමා ඒක බලන්න ගිහිල්ලා. පන්සලේ තිබුණ සාකච්ඡාවේදී සියළුම දෙනා ඇවිල්ලා තිබුණේ මොකටද, විරුද්ධ වෙච්ච මිනිස්සුත් අයින් වුණා සමරවීර මහත්තයා නිසා. නමුත් එකක් තියෙනවා. ඒක නිවැරදිව කරන්න ඕන කියන එක කිවුවේ. ඒක නිවැරදිව කරන්න, ඒකට දීපු කොන්දේසි වලට කරන්න කියලා කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම එකක් අහන්නම් ඔබතුමාගෙන්. ඔබතුමාට මම අභියෝගයක් කරනවා. මේ මන්ත්‍රීවරු ඔක්කොම ඉස්සරහ මම ඔබතුමාට අභියෝගයක් කරනවා. ඔබතුමා දැන් මෙතන ඉඳන් ඇක්සස් එකට විරුද්ධව කතා කරනවා. මම අභියෝග කරනවා පන්සලේ තිබුණ රැස්වීම තිබ්බේ කර ගන්නම බැරි කොට. තේරුණාද, ඒකත් මගේ විරෝධතාවය උඩ තිබ්බේ. එවෙලේ හර්ෂ මන්ත්‍රීතුමයි, මමයි විතරයි විරුද්ධව හිටියේ. මම අභියෝග කරනවා ඔබතුමා ඊට කලින් එක වචනයක් ඇක්සස් ඉඩමට විරුද්ධව කතා කරපු තැනක් මට පෙන්වන්න. මම අද සභාපතිධුරයෙන් අයින් වෙනවා. මම අද සභාපතිකම දාලා යනවා. ඔබතුමා මට එක වචනයක් පෙන්වන්න ඒ දිනයට කලින්. ඇත්ත කතාව මේකයි. අප්පිරියයි ගත්තම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අප්පිරියකම මම කියන්නම්. හොඳට කියන්නම් අප්පිරියකම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ටවර් එකට මම අවුරුදු අටක් නඩු කිව්වා. කට්ටිය සල්ලි ගත්තා. ගන්න විදියත් කියනවා ඒ දවස්වල හෙල්මට් එකට දා ගෙන ගියා කියලා. මම අවුරුදු අටක් නඩු කියලා ටවර් එක ගැලෙව්වේ. ඕවා ගැන අහගන්න එපා මගෙන්. මේකෙ කරපුවා අහගන්න එපා මගෙන්. අපිත් බබ්බු වගේ නිශ්ශබ්දව ඉන්නවා සභාව ගෙනියන්න ඕන නිසා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කමිටුවෙන් පැත්තකට වෙනවා. සටන් කරලා කියනවා කියලනේ මේ කියන්නේ. මම කමිටුවෙන් පැත්තකට වෙනවා. ඔබතුමාට සියළු සහයෝගය දෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක ස්වභාවධර්මයෙන් වෙනවා මන්ත්‍රීතුමා. ගරු සභාපතිතුමා, ගරු සභාවෙන් ඉල්ලනවා බොහොම ගෞරවයෙන්. සභාව කරගෙන යන්න ආවේ න්‍යාය පත්‍රයකට අනුව. න්‍යාය පත්‍රයෙන් පිට හැම දෙයක්ම කතා කරන්න එපා. බුද්ධිමත් මන්ත්‍රීවරු ඒවා අහගෙන ඉන්නවා. අපි දේශපාලනයට අළුත් වුණාට ඉපදිලා අවුරුදු 49 ක් වෙනවා. ගරු සභාපතිතුමා, ඒක නිසා බොහොම පැහැදිළිව කියනවා මේක මෙහෙම තර්කානුකූලව කරගෙන යන්න එපා. ඒ සියළු දේ වෙන කොට මේ සියල්ල අපි නොදන්නවා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වුණාට මන්ත්‍රීතුමා මන්ත්‍රීවරු දැනුවත් වෙන්න ඕන තත්ත්වය මේකයි කියලා. මොකද, අන්තිමට වෙන්නේ තමනුත් මුදල් ගත්තා කියන මට්ටමට යනවා. අන්තිමට තමන් දන්නෙත් නැහැ. මම අර මන්ත්‍රීවරයත් එක්ක ආවේ, එයාටත් දෙන්න ඕන කියලා තමයි ගන්නේ. ඒකත් දැනුවත් කරන්න ඕන තේරුණාද, වෙන්දේසිකාරයන්ගෙන් ගාණ ලොකුවට ඉල්ලන්නේ ඒකයි. ලක්ෂයක්, දෙකක් නෙමෙයිනේ ඉල්ලන්නේ. ඉල්ලන්නේ අරයට දෙන්න ඕන, මෙයාට දෙන්න ඕන කියලා. නම් කියලා ඉල්ලන්නේ. ඒ වාර්තා දාලා ගන්නේ කට්ටියටම දෙන්න ඕන කියලා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්වත් විකුණලා ගන්නේ මේ සල්ලි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක සභාපතිතුමා, ඔබතුමයි සභාවයි විතරක් නෙමෙයි මුළු බෝපෙ පෝද්දල ජනතාවම දන්නවා කවුද මොකක්ද කරේ කියන එක. ඒක හංගන්න දෙයක් නෙමෙයි. ඒක නිසා හාරන්න හාරන්න කුණුගොඩ ගඳයි මන්ත්‍රීතුමා. කරුණාකරලා මේක නවත්වලා සභාව කරගෙන යන්න. ඒවා මේ බෝපෙ පෝද්දල ජනතාව දන්නවා. ඒ නිසා තමයි ඔය මට්ටමට අද වැටිලා තියෙන්නේ. ගරු සභාපතිතුමා සභාව කරගෙන යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාව කරගෙන යන්න ඉතිං සභාපතිතුමා දැන ගන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ සභාවේ දැන් විශාල කතා රාශියක් ඇති වුණා. මමත් 2002 වර්ෂයේ ඉඳන් මේ සභාවේ ඉන්නවා. පරණ මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ වන තෙක් නම් මම කාගෙන්වත් සල්ලි අරගෙනත් නැහැ. සල්ලි අරගෙන කියලා කවුරුවත් පෙන්වලත් නැහැ. මම හිතන්නේ දැන් සභාවේ හිටපු මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ට නඩුවක් යනවා මහාධිකරණයෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දන්නේ නැහැ කවුරුවත්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** හිටපු අයට නඩුවක් යනවා. සල්ලි අරගෙන ඒවා ඔප්පු වෙලා මහාධිකරණයේ නඩුවක් යනවා. ගනිපු අයට නඩුවක් යනවා. එහෙම ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා මම ඔබතුමාගෙන් එකක් අහන්නද, මම ඒකට එකක් අහන්නද, ඔබතුමා ඒකට හෘද සාක්ෂියට අනුව උත්තර දෙන්නකෝ. අවංකවම උත්තර දෙන්නකෝ. අබේසේකර මන්ත්‍රීතුමා මේ ඇක්සස් ඉඩමට පස්සේ කාලෙක විරුද්ධ වුණා ඇරෙන්න මුල්දී විරුද්ධ වුණාද කියලා ඔබතුමා කියන්නකෝ. මට කියන්නකෝ ඔබතුමා හිටපු මන්ත්‍රීවරයෙක් විදියට ඒක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මට ඇත්තටම ඒක මතකත් නැහැ. හැබැයි රැස්වීමක් තිබුණා බටුවන්තුඩාව පන්සලේ. ඒ රැස්වීමට අපිත් ගියා. එතකොට මාදුගොඩ සභාපතිතුමා හිටියේ ඒ දවස්වල. ඒ රැස්වීමට ගිහින් අපි විරුද්ධ වුණා කියලා අපිට එළියට බැහැලා එන්න දුන්නේ නැහැ. අපිට ගහන්නත් කට්ටිය වට කරා අපි ඒකට විරුද්ධ වුණා කියලා. ඒ ගමේ කට්ටිය සංවිධානය කරගෙන අපිට ගහන්න සූදානම් වෙලා හිටියා ඒකට විරුද්ධ වුණා කියලා. ඒ ඇක්සස් ඉඩම හදන්න අනුමැතිය නොදෙන්න කටයුතු කරා කියලා. ඒ වගේ වාතාවරණයක් තිබුණේ. එතකොට දහනායක මන්ත්‍රීතුමත්, ඕකට විරෝධතාවයක් දක්වලා තිබුණා. ඒ දවස් වල අපිත් විරුද්ධ වුණා. මම එදා ඉඳලා සභාවේ කියන දෙයක් තමයි, මේ සභාවේ යම්කිසි සංවර්ධන යෝජනාවක් කරනවා නම් අපේ සභාවේ ඉන්නවා තාක්ෂණ නිලධාරිතුමෙක්. තාක්ෂණ නිලධාරිතුමා කියනවා මේක කරන්න, අරක කරන්න කියලා. ඒ විදියට කරනවා නම් කාටවත් සල්ලි දෙන්න අවශ්‍යතාවයක් නැහැ. මේකෙ වෙලා තියෙන දේ මම දන්නේ නැහැ මොකක්ද කියලා. වෙන්දේසිකාරයෝ එහෙම කියනවා. සමහර වෙන්දේසිකාරයෝ බොරුවටත් කියනවා අරයා ගත්තා, මෙයා ගත්තා කියලා. එහෙම කියලා කුලප්පුත් කරනවා. සමහර කට්ටිය එනවටත් එහෙම කියනවා ඇති. ඒක නිසා බේරෙන්න අරයට දුන්නා, මෙයාට දුන්නා කියලා කියනවා ඇති. උන්ටත් හොඳ අවස්ථාවක් මේක. මුන් බොරුවට කියනවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ අරයට දුන්නා, මෙයාට දුන්නා කියලා. මම දන්න තරමින් මගේ හොඳම හිතවතෙක් තමයි මංචනායක මහත්තයා. වෙන්දේසි ඉඩම් සම්බන්ධව නෙමෙයි දන්නේ. සෙන්චරි ෆිනෑන්ස් එකේ මංචනායක මහත්තයා එදා ඉඳලම මගේ හිතවතා. මම එයත් එක්ක තාමත් වැඩ කරනවා. මාත් එක්ක තාමත් හිතවත්. එයත් මට කියනවා මේ බෝපෙ පෝද්දල සංවර්ධන කටයුතු වලට ඉදිරිපත් වෙන්න බැහැ කියලා. මොකද බේරෙන්න බැහැ කියලා කියනවා. එහෙම ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය උත්තර තියෙන්නේ. ඔය ඇතිනේ හොඳටම.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එවැනි වාතාවරණයක් තමයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට බේරෙන්න බැරි සභාපතිගෙන්ද, මන්ත්‍රීවරුන්ගෙන්ද, මට උත්තරයක් දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම නමින් කියන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එක එකාට සල්ලි දෙන්න ඕන නැහැ හරියට කරනවා නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක තමයි මමත් කියන්නේ. මම මේ සභාවේදී නිතරම කිවුවේ දෙන සංවර්ධන යෝජනා දෙන්නේ තාක්ෂණ නිලධාරීන්. තාක්ෂණ නිලධාරීන්ගේ ඇස් පොට්ට වෙන්න ඕන මේක බොරු වෙනවානම්. තාක්ෂණ නිලධාරීන් දෙන එක හරියට දුන්නා නම් ඒ මිනිස්සු හරියට කරන්න එපැයි. එහෙම කරහම සත පහක්වත් දෙන්න ඕනත් නැහැ ඒ මිනිස්සු. ඒ මිනිස්සුන්ට හරියට කරන්න පුලුවන් නම් මොකටද සල්ලි දෙන්නේ කියලා කියන්න. මම කියපු විදියට වැඩේ කරලා තියෙනවා කියලා කියන්න පුලුවන්නේ. තාක්ෂණ නිලධාරීන් කියපු විදියට වැඩ කරලා තියෙනවා කියලා කියන්න පුලුවන්නේ. නැත්නම් නඩු යනවා කියලා කියන්න පුලුවන්. සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන වැඩ කටයුතු වලට මිනිස්සු එන්නේ නැති හේතුව තමයි මේකෙන් බේරෙන්න බැහැ කියලා කතාවක් මේකෙ යනවා. මේක කැත නමක්. අපේ බෝපෙ පෝද්දල බලප්‍රදේශය කියන්නේ විශාල ඉඩම් වෙන්දේසි සිදු වෙච්ච බලප්‍රදේශයක්. මේක ගාල්ල නගරයට ආසන්නයි. ඒ වගේම අධිවේගී මාර්ගයට ආසන්නයි. ඒක නිසා දැවැන්ත සංවර්ධන යෝජනා සිදු වෙන බලප්‍රදේශයක් මේක. හැබැයි මේ මිනිස්සු මෙහෙට එන්නේ නැහැ. මේකෙන් දැන් ටික ටික ඈත් වෙනවා. හේතුව මොකක්ද මේකෙ බේරෙන්න බැහැ. නමුත් මේකට එක එක්කෙනාට චෝදනා කර කර ඉඳලා හරියන්නේ නැහැ. කරන වැඩක් හරියට සාධාරණව කරා නම් කිසි අවුලක් වෙන්නේ නැහැ. හැබැයි මම නම් මේ වන තෙක් සත පහක්වත් අරගෙන නැහැ. කාටහරි එහෙම ආරංචි වෙලා තියෙනවා නම් කියන්න. මම මේකට ඉදිරිපත් වෙලා හොයලා බලලත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අනිත් එක මේකයි. වෙන්දේසි ආයතනයේ අය අහන්නේ සභාපතිවරයාට දෙනවා නම් තව කමක් නැහැ කියලා. ඇත්ත කතාව මේ. ඔබතුමා ගන්නෙත් නැතුව මන්ත්‍රීවරු ඇවිල්ලා ඉල්ලන කොට අපි කොහෙමද ඇහුවා දෙන්නේ. ඔන්න ඔය පිළිබඳව අහන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ඕක බරපතල චෝදනාවක්. මේ කමිටුව විසුරුවනවා නම් වඩා හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඉතිං හොඳම උදාහරණයක් ආවේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඕක බරපතල චෝදනාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කෙලින්ම කියනවා. මෙන්ඩිස් මහත්තයා ඇවිල්ලා අර කතාව කිවුවානේ. මට නම් කරලම කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභාවට ඇවිල්ලා කියන්න කියලා කියන්න. මම ලෑස්තියි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, එහෙම ගනිපු මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් ඉන්නවද මෙතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම් කරලම එක්කෙනෙක්ව කිවුවේ. දැන් එක්කෙනෙක්ව නම් කරලම කිවුවා. ඕවා අහු වෙන්න කරන්නේ නැහැනේ. අහවලාට මෙහෙම දුන්නා කියලා කියනවා. මම කියලා තියෙන්නේ මටත් එපා, නිලධාරියෙකුටවත් එපා, වෙන කාටවත් දෙන්න ඕනත් නැහැ කියලා. වැඩේ හරියට කරනවා නම් එච්චරයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔබතුමා කිවුවා ටවර් කතාව ගැන. දැන් ඒක හරි වැදගත්. ඒකට මහාධිකරණයේ නඩුවක් තියෙනවා. කාට කාටද චෝදනා තියෙන්නේ කියලා මම ඒ තියෙන සියළු වාර්තාවල් ටික ඊළඟ සභාවේදී සභාගත කරනවා තමුන්නාන්සේලාට බලා ගන්න. එතකොට බොහොම පැහැදිළිව බලා ගන්න පුලුවන් මොකක්ද කියලා ටවර් ගහපු කතාව. ඒකෙ චෝදනා කරලා තියෙනවා. හතර දෙනෙකුට විරුද්ධව නඩු දාලා තියෙනවා. ඒකට පද්මසේන මාවැල්ල මැතිතුමාට,

දහනායක මැතිතුමාට, අමිල නුවන් මැතිතුමාට, ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාට නඩු දාලා තියෙනවා. මම ඒක සභා ගත කරනවා. එතකොට තමුන්නාන්සේලා ඒවා බලා ගන්න. ඒ මුළු ලිපිගොනුවම මම සභාගත කරනවා. එතකොට බලාගන්න පුලුවන් මොනවද වෙලා තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ලිපිගොනුව බැලුවම බලා ගන්නත් පුලුවන්. අනිත් දේත් කියන්නම් ඕන නම්. මන්ත්‍රීවරු දැන ගන්න ඒකත්. මගේ කොට්ඨාශයේ එකක් ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක අහපු හින්දා කිවුවේ. නැත්නම් මම මේක කියන්න හිටියේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක ඔයගොල්ලෝ අනිත් පැත්තට හිතන්නකෝ. මගේ කොට්ඨාශය. මටත් සල්ලි දෙන්න ආවා. බොරු කියන්න ඕන නැහැනේ. සල්ලි දෙන්න ආවා. මම ගාණත් කියන්නම්. ලක්ෂ පහක් දෙන්න ආවා ටවර් එකට. ඇත්ත කතාව මම මේ කියන්නේ. ලක්ෂ පහක් දෙන්න ආවා. මම ගත්තේ නැහැ. ගන්න ඕන අය ගත්තා. අරගෙන කිවුවා දිල්රුක්ගේ මතය හදලා දෙන්නම් කියලා. මට එහෙම කිවුවනේ. නමුත් ඒ මිනිස්සු සල්ලි වියදම් කරාට වැඩේ කෙරුනේ නැහැ. මම ඒකට නඩුවක් දැම්මා. මම ඒක ගැලෙව්වා. ඒ අය බලහත්කාරයෙන් භූගත කරන්න ගියා. එයාලා අවසර අරගෙන තියෙනවා කිවුවා සභාවෙන්. ඒ පාර මම භූගත කරපුවා ඔක්කොම ගැලෙව්වා. වැඩ කරන්න කරන්න මම ගැලෙව්වා. ඒ අය ඒපාර මට විරුද්ධව නඩුවක් දැම්මා. අපි අවසර අරගෙන තියෙන්නේ මෙයා කරන්න දෙන්නේ නැහැ කියලා නඩුව ගියා. මමත් ගෙනාවා ඔක්කොම. මීටර් 60 ක් ඇතුළත පදිංචි අයගෙන් අවසර ගන්න ඕන. ඔයගොල්ලෝ මේක ගැන හිතන්න. මම මේ කට්ටියගේ දැන ගැනීම පිණිස කියන්නේ. වෙන මුකුත් නෙමෙයි. තම තමන්ගේ නැණ පමණින් දැන ගන්න ඕන හින්දා කියන්නේ. එතකොට නිකම්ම නිකං හතර දෙනෙකුට විරුද්ධව නඩු දානවා ඒ අය. තමන් සල්ලි වියදම් කරපු අයට තමයි නඩු දැම්මේ. ඇත්ත කතාව ඒක. තමන් සල්ලි වියදම් කරපු අයට තමයි නඩු දැම්මේ. එහෙම නම් මටත් නඩු දාන්න එපැයි. මමත් සල්ලි ගත්තා කියලා නඩු දාන්න පුලුවන්නේ. දැන් මාත් එක්කනේ වැඩිම තරහා තියෙන්නේ. එහෙම නම් මටත් නඩු දාන්න එපැයි සල්ලි ගත්තා කියලා. මේකට මගේ නම නැහැ. මට නඩු දැම්මේ ඒ අයගේ වැඩේ කරන්න දෙන්නේ නැහැ කියලා විතරයි. ඔන්න ඕකයි යථාර්ථය. මේවායේ තව කතා කරන්න කරන්න තව දේවල් එළිවේවි. ඒකයි වැඩේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, දැන් ඔබතුමා එවැනි අයවනේ මේ කමිටුවට පත් කරේ. ඔබතුමා බරපතල වරදක් කරා. දැන් ඔය සම්බන්ධව නිතර නිතර කතා වෙලා මුදල් සම්බන්ධව චෝදනාවට ලක් කරනවා. විශේෂයෙන්ම ප්‍රේමලාල් අබේසේකර මන්ත්‍රීතුමාව චෝදනාවට ලක් කරනවා. නමුත් එහෙම පුද්ගලයෙක්ව මේ අනවසර ඉදිකිරීම් සම්බන්ධ කමිටුවටත් නම් කරනවා. ඔබතුමානේ නම් කරේ අපිව. එතකොට ඔබතුමා එතනදී සැලකිලිමත් වුණේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා නම් නොකරා නම් මොකද වෙන්නේ. දැන් අබේසේකර මන්ත්‍රීතුමානේ ඕක දිගින් දිගට කතා කරලා මේ ප්‍රශ්නය ඇති කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේකයි එතුමාගෙන් අපිට ගන්න පුලුවන් දෙයක් තියෙනවා නම් ගන්න. ඔබතුමන්ලා අතීතයේ එකට ඉඳලා කරපු දේවල්නේ තියෙන්නේ. අපිත් ඒ නරාවලටම තමයි යොමු කරේ. ඔබතුමා බරපතල වරදක් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මන්ත්‍රීවරුන්ට පරිස්සම් වෙන්න ඒක කිවුවේ. වෙන කතාවක් හින්දා නෙමෙයි කිවුවේ.

හපුගල, පැලවත්ත, අපේගම හන්දියට යාබදව ඉදිකරන ලද දහනායක හාඩ්වෙයාර් ආයතනයට නඩු දාන්න ප්‍රසිත් වල්ගම නීතිඥතුමාට භාර දීලා තියෙන්නේ.

හපුගල වටරැක ආදාදොළ පාළම අසල දසනායක වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයටත් ලිඛිතව දැනුම් දීලා ඒකටත් නඩු දාන්න මූලික අදියර සකස් කරලා තියෙන්නේ.

හපුගල, තරංගා ලෑන්ඩ් සේල් මගින් වෙන්දේසි කරන ලද පැතුම් උයනේ පාරවල් හදන්න කියලා ලිඛිතව දැනුම් දීලා තියෙන්නේ.

ලීඩ්ස් ඉන්ටර්නැෂනල් පාසලට නඩු දාලා තියෙනවා. විශ්වනාත් අරඹෙවෙල නීතිඥතුමාට භාර දීලා තියෙන්නේ. ඔය 14 ටම ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා නීතිඥවරුන්ට භාර දෙන කොට අපිවත් සම්බන්ධ කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේවාට සම්බන්ධ කර ගන්න දෙයක් නැහැ. ඔබතුමන්ලා ගිහිල්ලා නීතිඥවරුන් එක්ක කතා කරන්නකෝ. කතා කරලා ඒවා කරන්න. මම ඕනත් නැහැ අපි බලපෑම් කරන්නේ නැහැනේ. එපා කියන්නෙත් නැහැනේ. ඒ ටික කර ගන්න. විශ්වනාත් අරඹේවෙල, ප්‍රසිත් වල්ගම නීතිඥ මහත්වරුනේ ඉන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඒකට කියන්න ඕන ඇත්තටම මම දැන් උසාවියට ගියාම ප්‍රසිත් වල්ගම නීතිඥතුමා කිව්වා මාසයක් වෙනවා කියලා ඔය ලියුම හදලා. ඒකත් එක්කම මම ඔබතුමාට ගෙනල්ලා දුන්නේ. එහෙම කරලා තමයි ඒ ලියුම යැව්වේ. දැන් නීතිඥ මහත්වරුන්ට නඩු භාර දෙන කොට අහන්න ඕන මේ නඩුවේ මේ මේ සාධක තියෙන්නේ ඔබතුමාට පුලුවන්ද කියලා මේ නඩුව දිනලා දෙන්න. ඒක බොහොම පැහැදිළිව අහලා තමයි නඩු භාර දෙන්න ඕන. එහෙම නැත්නම් නඩුව තියාගෙන ඔහේ ඇද ඇද යනවා. මම ඒක කිව්වේ විශ්වනාත් අරඹේවෙල නීතිඥතුමාට නෙමෙයි. විශ්වනාත් අරඹේවෙල කියන්නේ ඉතා දක්ෂ නීතිඥයෙක්. ඒක වෙනම කතාවක්. නමුත් ඒ අයට හරි දත්තයන් දෙන්නේ නැත්නම් ඒ අයට නඩුව ගෙනියන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 03.** 2021 වර්ෂය සඳහා රු. 200,000.00 ට වැඩි වියදම් වලට බැඳීමට අවසරදීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 2021 වර්ෂය සඳහා සේවක මණ්ඩලයේ සහ මන්ත්‍රී මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම් අනුමත කිරීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බැහැයි කියන්නේ නැහැ කවුරුවත්. ඒක එපැයි කියන්නෙත් නැහැ. බැහැයි කියන්නෙත් නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** 2021 වර්ෂය සඳහා රු. 200,000.00 ට අඩු අනෙකුත් ගෙවීම් අනුමත කිරීමේ බලතල ගරු සභාපතිතුමාට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** 2021 වර්ෂය සඳහා රු. 200,000.00 ට වැඩි අනෙකුත් ගෙවීම් අනුමත කිරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 2021 වර්ෂය සඳහා ටෙන්ඩර් මණ්ඩල බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** 2021 වර්ෂය සඳහා ගිණුම් අතර මුදල් මාරු කිරීමේ බලතල මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** 2021 වර්ෂය සඳහා කර්මාන්ත ඇස්තමේන්තු අනුමත කිරීමේ බලතල තාක්ෂණික සේවා කමිටුවට පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** 2021 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන විෂයන් සම්බන්ධව සේවා අවශ්‍යතාවය මත තීන්දු තීරණ ගැනීමේ බලතල නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** 2021 වර්ෂය සඳහා පරිසරය සහ පහසුකම් විෂයන් සම්බන්ධව සේවා අවශ්‍යතාවය මත තීන්දු හා තීරණ ගැනීමේ බලතල පරිසරය සහ පහසුකම් කමිටුව වෙත පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** කාරක සභා සතු බලතල විශේෂ වූ සේවා අවශ්‍යතාවයන් මත අදාළ කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කිරීමට ගරු සභාපතිතුමා වෙත බලතල පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**13.** පෝද්දල සුසාන භූමිය සඳහා වෙන් කරන ලද භූමියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ගරු සභාපතිතුමා මෙතන ආදාහනාගාරය හදන්න හැදුවනේ. මේක දෙකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේක දෙකක්. මේක අර කලින් ආදාහනාගාරය හදන්න ගිහිල්ලා විරුද්ධ වෙච්ච එක. ඒක අදාළ මාර්ග පද්ධතිය සකස් කරලා ඒ අනුව තමයි කරන්නේ. ඒවා ඇතුළත් වෙන්න ඕන. තාප්පය බඳින්න ඕන වටේට. ඒ අතරතුර තවත් වැඩ කොටසක් තියෙනවා ඒකෙ. නොදිරන කුණු එකතු කරන්නේ. දිරන ඒවා දාන්නේ නැහැ. ඒ කියන්නේ පොලිතින් වගේ දේවල් දාන්න හදන්නේ. මොකක් හරි ප්‍රශ්නයක් වුණොත් විතරයි ඒක කරන්නේ. එකතු කිරීමේ මධ්‍යස්ථානයක් විදියට තමයි මේක පාවිච්චි කරන්නේ. තියෙන ඒවා ඔක්කොම එතනට ගෙනිහින් දාලා එතනින් කරන්න යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඒක වටේට ආවරණය කරන්න වේවි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එතකොට ඒ ඉඩමේ මිහිදන් කිරීමේ කටයුතු සිදු වෙන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක එතනට යොදවලා තියෙන එක අපරාධයක් ඉතිං. ඒ වගේ වැඩකට යොදවන එක අපරාදේ. පාවිච්චි වෙන්නේ නැහැ දැනට.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** ප්‍රාදේශීය සභාව සතු කාර්යාල ගොඩනැගිලිවල ඇති සුළු අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට සහ ජනෙල් සහ දොරවල්වල ඇති අඩුපාඩු සකස්කොට සහ තීන්ත ආලේප කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**15.** ප්‍රධාන කාර්යාලයේ වතුර ටැංකිය තබා ඇති ආධාරක කුළුණ යට කොටස අබලි ද්‍රව්‍ය රැස්කර තැබීම සඳහා ගබඩාවක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියන්නේ මේ ටැංකියේ යට කොටස.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**16.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2020-11-26 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| අතිරික්ත වූ වැය විෂයන් | | | ඌනතා වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|
| **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම** | **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම** |
| 305-09 | වෙනත් වියදම් | රු.100,000.00 | 205-02 | සම්බන්ධතා සේවා - ඖෂධ | රු.100,000.00 |
| 209-01 | ප්‍රාග්ධන වැය (උපකරණ වැය) | රු.700,000.00 | 109 | ප්‍රාග්ධන වැය (උපකරණ වැය) | රු.700,000.00 |
| 209-01 | ප්‍රාග්ධන වැය (උපකරණ වැය) | රු.600,000.00 | 509-01 | ප්‍රාග්ධන වැය (උපකරණ වැය) | රු.600,000.00 |
| 103-02 | ඉන්ධන හා ස්නේහක තෙල් | රු.250,000.00 | 205-09 | වෙනත් වියදම් | රු.350,000.00 |
| 503-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | රු.100,000.00 | | | |

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොළඹින් ලැබෙන ඖෂධ මේ පාර ලැබුණේ නැහැ. මේ පාර සභා අරමුදල් වලින් තමයි ඒක දරන්න වෙන්නේ. ඒකට තමයි මේ මාරු කිරීම කරේ. මෙතන ලක්ෂ හයක් මාරු කරේ සී.සී.ටී.වී. කැමරා පද්ධතිය සවි කිරීමට ගෙවීම් කරන්න.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**17.** නරාවල, මුලන සුසානභූමිය මාර්ගය රෝහණ විජේරත්න මාවත නමින් නම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ වගේම කියන්න ඕන මේක එක නමක් නෙමෙයි. නම් දෙකක් තියෙන්නේ. ඒක නිසා ඒ අයගේ ගෙවල් වලින් විමසීමක් කරන්න. මේකට වෙනම නමක් යෝජනා වෙලා තියෙන්නේ. ඒක නිසා සමිති වලින් ඉල්ලීම් කරාට අපි ඒ නිවැසියන්ගේ ගෙවල් වලින් අහලා හොයලා බලලා ඒක කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඒ විරෝධතා කැඳවන කොට ඒ නිවෙස් දෙකෙන් ඒකට එකඟතාවය ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දෙන්නෙක්ගේ නමක් මේක. රෝහණ විජේරත්න කියන්නේ නම් දෙක එකතු කරහම එන එක නමක්. ඒක නිසා දෙපැත්තෙන්ම අහන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** අනිත් එක මේකට රණවිරුවෝ දෙන්නෙක්ගේ නම් දෙකක් තියෙන්නේ. සමිතිය වැඩි ගෞරවයක් දෙන්න තමයි මේ ඉල්ලීම කරලා තියෙන්නේ. නමුත් මේකේදී වෙන අර්ථයක් යන නිසා මේක විමසලා බලලා කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කලිනුත් ඕකට යෝජනාවක් ආවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. කලිනුත් ඕක ආවා. රණවිරුවෙක්ගේ නමින් තිබුණේ. රණවිරුවෙක්ගේ නමින් එක මාර්ගයයි නම් කරන්න පුලුවන් බලප්‍රදේශයටම. මේක ගැන හොයලා බලලා කරමු. මේක අනුමත කරලා තියමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**18.** 2011 වර්ෂයේදී මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වටරක නැගෙනහිර සහන ග්‍රාම සංවර්ධන සමිතිය විසින් හපුගල, අපේගම, අබේසුන්දරවත්ත හරස් මාර්ගයේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි යොදා සංවර්ධනය කටයුතු සිදු කිරීම වෙනුවෙන් රු.488,752.42 ක මුදලක් සහා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ පිළිබඳව අපිට අවබෝධයක් නැහැ. 2011 දී කරපු කර්මාන්තයක් මේක. ඒක පොඩ්ඩක් බලලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන කියන්නම්. ඒකට අදාළ ලිපි ගොනුව තියෙනවා. ඒක සම්පූර්ණයෙන්ම අධීක්ෂණය කරන්න පුලුවන්. එතකොට ඒ වෙන කොට මොන හේතුවක් නිසාද කියලා මම දන්නේ නැහැ කර්මාන්තය අසමත් කියලා ගෙවීම් නොකර තිබුණා. මෙහෙන් කරපු එකක් නෙමෙයි මේක. මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදල් ආපු එකක්. ඊට පස්සේ මේක දිගින් දිගට ගියා. දැනට අවුරුදු නමයක් විතර වෙනවා මේකට. අද වෙන කොටත් පාර හොඳම මට්ටමේ තියෙනවා. අදාළ අය ඉල්ලීමක් කරලා තිබුණා කාලය ගැන සලකා බලලා ගෙවීම් කරන්න කියලා ඒ අයට. මොකද වැඩේ කරලා තියෙන්නේ. ඒකෙ අපි අනිත් හැම තැනින්ම, පළාත් පාලන ඉංජිනේරුවරයාගෙන් නිර්දේශය අර ගත්තා. එතුමත් කියන්නේ වැඩේ හොඳට තියෙනවා කියන එක තමයි. මොකද දැනට අවුරුදු නමයක් වෙනවා මේක කරලා. අද වෙනකොට එක දශමයක්වත් මුකුත් වෙලා නැහැ. පරීක්ෂණය සමත්වුණ ඒවා මේ වෙන කොට කැඩිලා විනාශ වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක කෙටියෙන් ඉවර කරමු. මේක කරලා තියෙන්නේ මග නැගුම ව්‍යාපෘතියෙන්. මගනැගුම ව්‍යාපෘතියෙන් ප්‍රාදේශීය සභාව දැනුවත් කරලා තියෙනවද මෙම මාර්ග සංවර්ධනය කරන්න කියලා. ඉල්ලීම් ලිපියක් එවලා තියෙනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කර්මාන්තය කරලා තියෙන්නේ අපෙන් ගිවිසුම් අත්සන් කරලා. සභාවෙන් ගිවිසුම් අත්සන් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපිට කරන්න කියලා ලියුමක් එවලා තියෙනවද මග නැගුම ව්‍යාපෘතියෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අනුව තමයි කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම නම් සල්ලි එහෙන් එන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සල්ලි එන්නේ නැති හේතුව මොකක්ද දන්නවද. මේක පරීක්ෂණයෙන් අසමත් නිසා ගෙවීම කිරීම අත්හිටුවලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක ගැටළුවක් නැහැ. මම විරුද්ධ වෙන්නේ නැහැ මේක ගෙවන්න කියන එකට. හැබැයි අධිභාරයක් ගෙවන්න ආවොත් මට ඒක ගෙවන්න හැකියාවකුත් නැහැ කියලා මම සඳහන් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මේකට අදාළ ඔක්කොම තියෙනවා බලන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** වගකීම අරගෙන ගෙවන්න. මට අධිභාර ගෙවන්න හැකියාවක් නැහැ කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාට විස්තර ලබාදීලා තියෙනවා. ඒක බලන්න. පළාත් පාලන කොමසාරිස් නිර්දේශ කරලා තියෙනවා ඒක ගෙවන්න. සභා අරමුදලින් ගෙවන්න පුලුවන් නම් ගෙවන්න කියලා තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඕක ගෙවලා අපිට අධිහාර ගෙවන්න බැහැ. මම නම් වහාම ඉවත් වෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ වගේ ප්‍රශ්නයක් ඇති වුණා ගිංතොට. පාර කොන්ක්‍රීට් කරලා ඉවර වුණාට පස්සේ පාරේ කොටසක් කැපුවා. තාම සල්ලි හම්බවුණේ නැහැ. ගන්න බැහැ. ඒ ආයතනය ඒක නැවැත්තුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා දීපු විස්තර ටික බැලුවද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සල්ලි ගෙන්වා ගන්න පුලුවන්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සල්ලි ගෙන්වාගන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සල්ලි ගෙන්වා ගන්න බැහැ. ඒ යෝජනාව අනුමත කරනවා. හැබැයි මට පෞද්ගලිකව අධිහාර ගෙවන්න බැහැ කියන එක සඳහන් කරන්න කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ මේක අහන්න. මේ ටික කියෙව්වද. අවුරුදු නවයක් වෙනවා පාර දැනට හදලා. පාර අදටත් හොඳම තත්ත්වයේ තියෙනවා. ඒ අය ඉල්ලීම් කරා පුද්ගලික හේතු මත ඒ අයගේ ගෙවීම් ප්‍රතික්ශේප කරේ කියලා. එක එක හේතුමත ඒ අයගේ ගෙවීම් ප්‍රතික්ශේප කරා කියලා කියනවා. ඊට පස්සේ අපි මේ ප්‍රශ්නය යොමුකරා පළාත් පාලන කොමසාරිස්ට. ඉංජිනේරුවරයා හරහා පරීක්ෂණය කරා. ඉංජිනේරුවරයාගේ නිර්දේශ එවලා තියෙවා. කොමසාරිස්ගේ නිර්දේශයත් එවලා තියෙනවා. නැවත අපි මාර්ග සංවර්ධන අධිකාරියෙන් ප්‍රතිපාදන ඉල්ලලා යැවුවා. ඒ අය කිවුවා මේක ඒ අයට ගෙවන්න හැකියාවක් නැහැ කියලා. නැවත අපි පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරා. මේක අපිට ගෙවන්න පුලුවන්ද කියලා. ඒපාර කිවුවා සභාවේ එකඟතාවය අනුව ගෙවන්න පුලුවන් නම් ගෙවන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශය මේ පාර සම්බන්ධයෙන් ලැබිලා තියෙනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ඔය දීපු ඒවාගේ එක තියෙනවානේ. පුද්ගලික වශයෙන් මම කතා කරා. අපි එවලේම විරුද්ධ වුණා කොන්ක්‍රීට් කැට අසමත් ඒවාට දෙන්න එපා කියලා. නමුත් අනිත් පාරවල් කැඩෙද්දී අදටත් ඒ පාර හොඳටම තියෙනවා. මම දන්නේ නැහැ ඒක හින්දා මේක මන්ත්‍රීවරු සතු දෙයක්. මට පුද්ගලික වශයෙන් මගේ සම්බන්ධයක් තියෙන කෙනෙකුත් නෙමෙයි මේ. ඒකට ඕන තීන්දුවක් ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම පොඩ්ඩක් දැන ගන්න කැමතියි. දැන් මේක 2011 වර්ෂයේ යෝජනා වෙලා කරපු සංවර්ධන කටයුත්තක්. එතකොට මේකෙ ගිණුම් ගත කරපු, වැය කරන්න වෙන් කරපු ප්‍රතිපාදන සභාවට යොමු කරලා තියෙනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව ගිවිසුම්ගත වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව ගිවිසුම්ගත වුණ එක නෙමෙයි මම අහන්නේ. ඒ අදාළ ප්‍රතිපාදන සභාවට ලැබිලා තියෙනවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. අපි බිල් යැවුවට පස්සේනේ මුදල් එවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක යවන්න ඉතින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැහැ කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් අනුමත කරලා තියෙනවා කිවුවානේ. අදාළ තාක්ෂණ නිලධාරි නිර්දේශ කරලා තියෙනවා නම් ඒ නිර්දේශයට යටත්ව අදාළ තැන්වලට ඒක යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්න දේ කියන්නේ. අපි දෙයක් නොකරන්න නම් යවන්න ඕන කොහාටද, පළාත් පාලන දෙපාර්තමේන්තුවට. ඒකට තමයි යැවුවේ. ඇත්ත කතාව එහෙට

යැවුවේ. නමුත් ඒකෙ ඉංජිනේරුවරයාගේ සහතික අරගෙන පළාත් පාලන කොමසාරිස් නිර්දේශ කරලා තියෙනවා මේකට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක දීලා තියෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. දැන් පරීක්ෂණයක් එන්නේ නැහැනේ එහෙන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ආයේ ඒ අයට පරීක්ෂණ කරන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආයේ පරීක්ෂණ කරන්න බැහැ. ඒ අය ඔක්කොම කරලා එවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ගෙවීමට අදාළ ප්‍රතිපාදන වෙන්වන්නේ මාර්ග සංවර්ධනය අධිකාරියෙන්ද එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ගෙවීමේ ප්‍රශ්නයක් නැහැ. දැන් ඒ අය කියන්නේ සභා අරමුදලෙන් ගෙවන්න කියලා සභාව එකඟනම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අන්න ඒක තමයි මම කිවුවේ. සභා අරමුදලෙන් ගෙවීමේදී මේකෙ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිනේ මේකට ගිවිසුම් අත්සන් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි ගිවිසුම් අත්සන් කරන්නේ ඒ මොහොතේ මග නැගුම ව්‍යාපෘතියෙන් එන මුදල් වලින් ගෙවන්නනේ. ඒ මොහොතේ මග නැගුම ව්‍යාපෘතියෙන් මුදල් වෙන් කරපු ඒවාටනේ ගිවිසුම් අත්සන් කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මෙහෙන් කර්මාන්ත කරා. කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාත්, තව කොටසක් මෙහෙන් කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙහෙන් කරාට, එහෙන්නේ මූල්‍ය ප්‍රතිපාදන එවන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඔය මෙහෙන් කරපු එකක්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ප්‍රතිපාදන ඇවිල්ලා නැහැ නේද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතකොට මේක සම්බන්ධව සභා අරමුදලෙන් ගෙවන එකට නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ නේද. නැත්නම් මොකක් හරි වෙලා අධිභාරයක් ගෙවන්න ආවම මේ තීන්දුව ගනිපු අය තමයි ඒකට වග කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකට ප්‍රකාශයක් ඔබතුමා කරන්න ඉතිං.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ වියදම් දැරීම සම්බන්ධව හෝ ගිණුම්කරණයේදී හෝ වෙනත් කටයුත්තකදී හෝ ඒවා නීත්‍යානුකූලව කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය කොන්ත්‍රාත් දෙකයිද. තුනයිද කොහෙද කරලා තියෙන්නේ. පුද්ගලිකව ඇවිල්ලා කතා කරා. ඊට පස්සේ කොන්ත්‍රාත් කරලත් නැහැ. සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත් වලින් අයින් වෙලා මේ ප්‍රශ්නය එක්ක. මම දන්නේ නැහැ. කැමැත්තක් කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක ගෙවන්න එපා කියලා නෙමෙයි කිවුවේ. පෞද්ගලිකව විරෝධයක් නැහැ. මෙතුමා මතුකරෙත් ඒකයි. නීත්‍යානුකූලභාවය සම්බන්ධව ගැටළුවක් නැත්නම් ඒ ගෙවීම කරන්න. නැත්නම් ප්‍රශ්නයක් ආවොත් පෞද්ගලිකව ගෙවන්න වෙන්නේ. එහෙම නීත්‍යානුකූලභාවය සම්බන්ධව තහවුරුවක් තියෙනවා නම් ඒ ගෙවීම නැවත පෙරලා අපිට වගකීමක් හැටියට පැවරෙන්නේ නැත්නම් මේ ගෙවීම කරාට ගැටළුවක් නැහැ. ඒකයි මම කියන්නේ. එහෙම නැතුව ගෙවනවා නම් අපේ විරෝධතාවයක් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා. මේ ගැටළුව සම්බන්ධව ලේකම්තුමාට සභාව දැනුවත් කිරීම සඳහා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>කාරක සභා අවස්ථාව</u>**

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී,

- 2011 වර්ෂයේදී කර්මාන්ත පහක් ඉටු කිරීම සඳහා වරාය සහ මහාමාර්ග අමාත්‍යාංශය මගින් රුපියල් ලක්ෂ විසි පහක ප්‍රතිපාදන අප ප්‍රාදේශීය සභාව වෙත වෙන්කර ඇති බව.
- එම කර්මාන්ත පහෙන් මෙම කර්මාන්තයේ පමණක් මෙම ගැටලුව පැන නැගී ඇති බව.
- කර්මාන්තවල වැඩ අවසන්කර අදාළ බිල්පත් සහ සහතික ඉදිරිපත් කළ පසු මුදල් ප්‍රතිපූර්ණය කිරීම සිදු කර ඇති බව.
- ප්‍රාදේශීය සභාවේ කොමසාරිස් පාලනය පැවති කාලයේද මේ සඳහා ගෙවීම් කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වූ බව.
- මෙම කර්මාන්තය සිදුකරන ලද කොන්ත්‍රාත්කරුට අසාධාරණයක් සිදුවී ඇති බැවින් මෙම ගැටළුව සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දුන් බව.
- මෙම කාර්මාන්තය සඳහා තාක්ෂණ නිලධාරි වාර්තාවක් සහ ඉංජිනේරු වාර්තාවක් ලබාගත් බව සහ නැවත වරක් මෙම කර්මාන්තය සඳහා ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා සිටිබව.
- මෙම කර්මාන්තය සඳහා සභා අරමුදලින් ගෙවීම් සිදු කිරීම සහා තීන්දුවක් මත සිදුකරන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් නිර්දේශ කළ බව.
- මෙය බල ප්‍රදේශයේ කර්මාන්තයක් ඉටු කිරීම වෙනුවෙන් අසාධාරණයට ලක් වූ පාර්ශවයක් සඳහා සිදුකරන සාධාරණයක් බව.
- සභා අරමුදල් සම්බන්ධ වගකීම මහා සභාව සතු බව.
- මීට අමතරව මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ට ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, දැන් මේක කරලා තියෙන්නේ සභාවේ අනුමැතිය ඇතුව. එතකොට ඒ සමිතිය ඉල්ලීම කරාට සමිතිය කර්මාන්ත කරන්නේ නැහැ. කවුරු හරි පුරවැසියෙක් කරලා තියෙන්නේ යම් කිසි ලාභයක් බලාගෙන. නමුත් මේකෙ ගෙවීම් හිරවෙලා තියෙනවා අවුරුදු ගාණක්. මේක පරීක්ෂා කරලා තාක්ෂණ නිලධාරීන්ගෙන් වාර්තාවක් අරගෙන තියෙනවා. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඇහුවම මේ මුදල් මෙහෙන් ගෙවන්න කියලා තියෙනවා. එතකොට මම කියන්නේ දැන් මන්ත්‍රීවරු මතු කරන ප්‍රශ්නය මේක ගෙවුවොත් කවදා හරි මේ අයට ගෙවන්න වේවිද කියලා තමයි මේ නොකියා කියන්නේ. ඒක නිසා මේක ලේකම්තුමා ඇතුළු ඔබතුමන්ලා සැලකිල්ලට යොමු කරන්න. ඔහුට අසාධාරණයක් වෙලා තියෙනවා. ඒක නිසා ඒ සාධාරණය කරන්න කොමසාරිස්තුමාගේ ලියුම පදනම් කරගෙන. එතකොට අපේ කාටවත් ප්‍රශ්නයක් වෙන එකක් නැහැ මම හිතන්නේ. මොකද පුරවැසියෙක් හැටියට අපේ ප්‍රදේශයේ වැඩ කරලා තියෙනවා. ඒක අපිට වඩා දැනුම තියෙන තාක්ෂණ නිලධාරීන් තහවුරු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකෙ ඕන නම් තව කතාවක් කියන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම තව ඉල්ලීමක් කරනවා සභාවෙන්. මේ පරීක්ෂණය අසමත් වෙච්ච නිසානේ මේ ප්‍රශ්නය වෙලා තියෙන්නේ. මේ සභාවෙන් තවත් මේ වගේ කර්මාන්ත කරලා පරීක්ෂණය අසමත් වුණොත් ඒකටත් ගෙවන්න වෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉංජිනේරුතුමා නිර්දේශ කරනවා නම් දෙන්න පුලුවන්. දැන් මේකට අවුරුදු නමයකට පස්සේ ඉංජිනේරුතුමා නිර්දේශ කරනවානේ. තාමත් හොඳයි කියලා තියෙනවා. පරීක්ෂණය අසමත් නම් හොඳ වෙන්නේ කොහොමද. අවුරුදු නමයක් දැන් ගිහිල්ලානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එහෙම නම් කොහොමද පරීක්ෂණය අසමත් වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා කියන්නේ පුද්ගලිකව හිතාමතා කරා කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට විරුද්ධව නඩුවක් දාන්න කියන්න.

**ගරු මන්ත්‍රී ජේ.ජී. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ මාර්ගය පිහිටලා තියෙන්නේ මගේ බල ප්‍රදේශයේ. ඇත්ත වශයෙන්ම මේ කොන්ත්‍රාත් එක කළ පුද්ගලයා පිළිබඳව බැලුවට පස්සේ අපිට ප්‍රශ්නයක් නැහැ. අපිට එහෙම

ගැටළුවක් තිබුණත් ඒක මෙතනට අදාළ කරගන්නේ නැහැ. ව්‍යාපෘතිය සභාව විසින් නිරීක්ෂණය කරලා සභාවේ අධීක්ෂණය යටතේ සිදු වෙච්ච දෙයක්. නමුත් පරීක්ෂණයේදී කැටවල ප්‍රමිතිය අඩු නිසා තමයි මේ ගැටළුව මතුවුණේ. එතකොට අපිට මේක මග නැගුම ව්‍යාපෘතියෙන් කරපු අනෙක් ව්‍යාපෘතිවල ප්‍රතිපාදන එවුවා. මේකට ප්‍රතිපාදන එව්ලා නැහැ. මේක ප්‍රතිපූර්ණය කරන්න වෙන්නේ ඒ නිසා සභා අරමුදලෙන්. එහෙම ප්‍රශ්නයක් විතරයි මෙතන තියෙන්නේ. දැන් මේ පාරේ මම නිතර ගමන් කරනවා. මේ පාර ඉතාම හොඳ තත්ත්වයේ තියෙනවා. ඒක මම විශ්වාසයෙන් යුතුව කියනවා. නමුත් තාක්ෂණික ගැටළුවක් ඇවිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම විවෘතව කියන්නම්. මම මේකත් කියන්න ඕන. මට නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. මේක ගෙවුවත් එකයි. නැතත් එකයි. මොකද මේක කරේ මෙහේ වැඩ කරපු කෙනෙක්. මෙහේ සුපර්වයිසර් වැඩ කටයුතු කරපු රංජිත් කියලා කෙනෙක් කරේ. මම එතකොට මන්ත්‍රී කාලේ. දවසක් ප්‍රාදේශීය ලේකම් එකට යනකොට ඔය රංජිත් කියන කෙනා හිටියා ප්‍රාදේශීය ලේකම් එකේ. එදා මෙතන වැඩ කරන දවසක්. මම ඇහුවා ඔයා කොහොමද අද මෙතන ඉන්නේ කියලා. ඔයා වැඩ කරන්න ඕන, කොන්ත්‍රාත් කරන්න නෙමෙයිනේ ඇවිල්ලා ඉන්නේ කියලා කිවුවා. ඔයා ඇවිල්ලා තියෙන්නේ රස්සාව කරන්න කියලා කිවුවා. ඔයා මොකද ඇහුවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කරන්නේ. එයා එහෙමම ඇවිල්ලා එදා ඉඳන් රස්සාවෙන් අයින්වුණා. මම අහපු වචනයට රස්සාවෙන් අයින් වුණා. මෙහේ සුපර්වයිසර් වැඩ කටයුතු කරේ. ඉතින් දැන් ඉල්ලීමක් කරනවා. ඒ මිනිහාගේ රස්සාවත් නැති වුණා. හෘද සාක්ෂියට අනුව පොඩි සාධාරණයක් තියෙනවා ඔය මිනිහට ඕක ගෙවන්න පුලුවන් නම්. මම දකින්නේ ප්‍රශ්නයක් නැහැ. මන්ත්‍රීවරු කැමති, අකමැතිකම අනුව ප්‍රශ්නයක් නැහැ. කැමති නම් ගෙවමු. නැත්නම් නිකන් ඉමු. මම මේ කිවුවේ වෙනත් කාරණාවක්. අදාළ කාරණයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි විරෝධතාවයක් නෙමෙයි මතු කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර රංජිත් කියලා කෙනෙක් වැඩ කරේ සිල්වගේවත්තේ. සුපර්වයිසර් වැඩ කටයුතු කරේ. මාස හයක් හතක් වැඩ කරේ. මාදුගොඩ සභාපතිතුමා බඳවා ගත්තේ. මාස ගාණයි වැඩ කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හරි සාධාරණයක් කරන්න ඕන මනුස්සයෙක් වැඩක් කරාට පස්සේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කොමසාරිස්තුමාගේ ලිපියේ සඳහන් වෙනවා මේකෙ මාර්ගය හොඳ තත්ත්වයේ පවතින බැවින් ගෙවීමක් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන ගැටළුව තියෙන්නේ එකම දෙයයි. සභා තීන්දුව දෙනවද නැද්ද කියන එක විතරයි. නීත්‍යානුකූල පැත්තේ අනිත් ඔක්කොම වැඩ ටික හරි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභා තීන්දුව අපි දෙන්නම්. හැබැයි අධිහාර ගෙවන්න අපිට බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අධිහාරයකට යටත් වෙන්න බැහැ අපිට. ඒකයි මේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පළාත් පාලන කොමසාරිස්තුමා සභාවේ අරමුදලෙන් ගෙවන්න කියන එකට අධිහාරයක් වුණොත් පළාත් පාලන කොමසාරිස්තුමත් මේකෙ චූදිතයෙක් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කරමු. පළාත් පාලන ඉංජිනේරුතුමාගේ සහ පළාත් පාලන කොමසාරිස්තුමාගේ නිර්දේශයන් ලැබී ඇති බැවින් ගෙවීම් කටයුතු කරන්න මහා සභාව තීන්දු කරමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතකොට අධිහාරයක් ගෙවන්න ආවත් ඒ අයත් එක්ක එපැයි යන්න. පළාත් පාලන කොමසාරිස්තුමා නිර්දේශයන් දීලා තියෙනවා. සභා තීන්දුවක් ගන්න තියෙන්නේ. ඇත්ත කතාව මේකනේ. අපි කොන්ත්‍රාත්කරුවන්ට අපේ වැඩ දෙනවා. යම් යම් අඩුපාඩුත් තියෙනවා. සල්ලි ගෙවපු ඒවා මාස තුනෙන් කැඩිච්ච ඒවත් තියෙනවා. ඇත්ත කතාව ඒකනේ. මනුස්සයෙක් සල්ලි යටකරලා හදපු පාර අවුරුදු නවයක් ගිහිල්ලත් හොඳ මට්ටමේ තියෙනවානම් අපි එතනදී සාධාරණයක් කළ යුතුයි. ඒ නිසා තමයි මම ඒ යෝජනාව ස්ථිර කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට විරෝධයක් නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** තමන්ගේ හතුරුකම් වලට එහෙම කරනවා. ඉතින් එහෙම කරා කියලා මේ මනුස්සයට එහෙම වුණා නම් ඒක අසාධාරණයි. ඒක අපි පිළිගන්නවා. සල්ලි යට කරලා හදපු පාර තාම හොඳ මට්ටමේ තියෙනවා නම් ඒක ඇත්තටම හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරපු කෙනා මාත් එක්ක තරහයි. මාත් එක්ක අද වෙනකම් මුහුණ බලන්නේ නැහැ. එවන්නේ වෙන කෙනෙක්. ඒ මිනිහා එන්නේවත් නැහැ මාත් එක්ක කතා කරන්න එදායින් පස්සේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා එහෙම නම් අපි සභාවේ තීන්දුවක් ගමු. ඉංජිනේරු වාර්තාව අනුව අපි ගෙවනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉංජිනේරු වාර්තාව අනුව සහ කොමසාරිස්තුමාගේ නිර්දේශ අනුව ගෙවීම් කරමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා තව කාරණයක් පැහැදිලි වෙනවා. මේකෙදි අපි ඒක මතුකරා. සමහර දේවල් නියමිත ප්‍රමිතියක් නැති වුණාට පස්සේ ප්‍රශ්න මතුවෙන නිසා ඔබතුමා යෝජනාවක් ගෙනාවනේ. දැන් වෙලා තියෙන්නේ ඒකෙ අනිත් පැත්ත. අදාළ නිලධාරීන් දිය යුතු දෙයක් නොදී ඉඳලා තියෙනවා. නොදෙන්න ඕන ඒවා දීපු නිසානේ අපි තර්ක කරේ. දැන් ඒකෙම අනිත් පැත්ත සිදුවෙලා තියෙනවා. මේකෙ විලෝමයත් සමානයි. නොදන්න ඕන ඒවා දුන්නා වගේම දෙන්න ඕන ඒවා නොදී ඉන්නත් පුලුවන්. ඒකයි මම කිවුවේ මේකට මොකක් හරි ක්‍රමවේදයක් හදන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට වෙච්ච දේත් මම කියන්නම්. ඒ මිනිස්සු කොන්ත්‍රාත් ගැන දන්නේ නැහැ. අලුතෙන් කරන්න ආපු කට්ටියක්. අනිත් කොන්ත්‍රාත්කරුවන් කරන්නේ කැට ඉස්සෙල්ලා හදනවා. වෙනම කැටයක් පරීක්ෂණයට යවනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේකට ඇත්තටම වුණේ මොකක්ද කියලා මම කියන්නම්. මේක මමත් දන්නවා. මේක මාර්ග සංවර්ධනය අධිකාරියෙන් නෙමෙයි අධීක්ෂණය කරේ. මාර්ග සංවර්ධන අධිකාරිය මේ වගෙ බලු වැඩ කරනවා තමයි. මම ඒකට තව උදාහරණයක් කියන්නම්. 2015දී අපේ ආණ්ඩුව ආව ගමන්ම මමත් සරික්කදූව පාර සංවර්ධනය කරා. ඔබතුමන්ලාගේ ලයිට් හදන කට්ටිය යනකොට දකිනවා ඇති. පාර ලස්සනට තියෙනවා අවුරුදු ගාණක් ගියත්. හැබැයි පාර හදනකොට කියලා තිබුණා දෙපැත්තෙන්ම කොන්ක්‍රීට් දාලා කැටගල් අල්ලන්න කියලා. දෙපැත්තට පටියක් එනවානේ. දෙපැත්තෙන් පටියක් දාලා කැටගල් අල්ලන්න පුලුවන්ද. එතකොට කැටගල් කපන්න වෙනවානේ. ඒකට ඒ මිනිස්සු කරේ එක පැත්තක පටිය දාලා කැට ගල් ටික අල්ලලා අනිත් පැත්තේ පටිය දැම්මා. ඒකට මේ අයට ලක්ෂ හතරක් සල්ලි කැපුවා. ඇත්තටම එතන වැරැද්දක් මුකුත් නැහැ. පාර තාම හොඳට තියෙනවා. ඒ වගේ බලු වැඩ කරනවා මාර්ග සංවර්ධන අධිකාරියෙන්. එහෙම කරා කියලා කොන්ත්‍රාත්කරුට සාධාරණයක් නොකර ඉන්න බැහැ. ඒ මනුස්සයට මුකුත් කරන්න බැහැ පාර හොඳට තියෙනවා නම්. ඒක නිසා අර කොන්දේසි වලට යටත්ව ඒක ගෙවන්න අනුමත කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**19.** 2021 වර්ෂය සඳහා මොන්රෝවියා වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර ප්‍රදේශයේ ගෙවතු වගා කටයුතු සිදුකරන පවුල් වෙත නොමිලේ බෙදා දීම සඳහා කිලෝ 25 ඇසුරුම් (පොහොර උර) 10,000ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා මුද්‍රණය කරලා ගන්නේ. නොමිලේ මේවා බෙදා දෙන්නේ. අපිට වියදම යන්නේ මුද්‍රණය කරන පොහොර උර වලට විතරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක හොඳ අදහසක් ගරු සභාපතිතුමා. මේකට පොහොර උර දස දහසක් ගන්නේ මේ බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් දස දහසකටද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දස දහසක් හෝ පන්දහසක්. එක්කෝ දෙකට බෙදලා දෙනවා. ප්‍රමාණය වැඩි නම් දෙක ගානේ බෙදනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකෙදි නිර්ණායක මත පදනම්ව හොඳ ක්‍රමවේදයක් හදාගත යුතුයි. මොකද දන්නවාද. ඇත්තටම වවන මනුස්සයට ඕන මේක ලැබෙන්න. එක්කෝ වැවීමට සූදානම් කරලා, ඒකට කාගේ හරි නිර්දේශ අරගෙන මේ ප්‍රමාණය ඕන කියලා දෙන්න ඕන. නැත්නම් නිකම්ම මේක බෙදලා දුන්නට පස්සේ මේකෙ ඇත්ත අරමුණ ඉෂ්ඨ වෙන්නේ නැහැ. මම කියන්නේ මේක අපිට නොමිලේ

ලැබෙන එක ඇත්ත. අපිට පොඩි වියදමක් යන්නේ, ඒකත් ඇත්ත වෙන්න පුලුවන්. නමුත් ලැබිය යුතු නියමිත අයට ප්‍රතිලාභයක් සහ ප්‍රතිඵලයක් ලැබෙන කෙනෙකුට මේක යනවා නම් තමයි වටින්නේ. මම ඒකට ඔබතුමාට යෝජනා කරනවා මේක ක්‍රමවේදයක් යටතේ බෙදා හරින්න කටයුතු කරනවා නම් හොඳයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**20.** 2021 වර්ෂය සඳහා වොට් 150 අධිබල එල්.ඊ.ඩී වීදි පහන් කට්ටල 200ක් සහ සාමාන්‍ය වීදි පහන් කට්ටල 300ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ පාර මොකක් හරි කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** හිඟ ලයිට් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමාට හිඟ ලයිට් ටිකක් තියෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**21.** නාවින්න, කොහොඹන්ගේවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඇමතිතුමා සංවර්ධනය කරන්න කියපු පාර.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ මොන පාරද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කහදූව වත්තේ, ගාමිණී මහත්තයාලගේ ගෙවල් වලට එහා පැත්තේ පාර.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අරලියවත්තේ පාරත් හදලා දෙන්න සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**22.** නැණසල මධ්‍යස්ථානයේ දෛනික ගෙවීම් පදනම මත සේවය කරනු ලබන එච්.පී.ජී. සඳමාලි මිය අවශ්‍ය සියලු අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බැවින් පරිගණක ක්‍රියාකරු තනතුරේ ඇය හට පුද්ගලික වන සේ සේවය ස්ථිර කිරීමට නිර්දේශ කර ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේකෙ දීර්ඝ කාලයක් සේවය කරලා තියෙනවා. ඒක හින්දා කරන්න පුලුවන් දේ බලන්න. විශේෂ මොකක් හරි මේවා කරලා ඒක කරන්න.

ඊළඟට අනෙක් සේවකයන්ගේ සේවය ස්ථිර කරන්න පහුගිය කාලයේ චක්‍රලේඛනයක් ආවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සේවකයන්ගේ සේවය ස්ථිර කරන එක තාවකාලිකව නවත්වලා තියෙන්නේ රැකියා ලක්ෂයේ ප්‍රශ්නය හින්දා. ඒකට ආණ්ඩුකාර ලේකම්තුමිය කිව්වා පළාත් පාලන දෙපාර්තමේන්තුවට බලපාන එකක් නැහැ කියලා. ගිහිල්ලා කතා කරන්න සේවය ස්ථිර කරගන්න පුලුවන් කියලා කිව්වා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒකටත් අපි ඉල්ලීමක් කරා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකටත් මම ඉල්ලීමක් කරලා තියෙන්නේ. මම ඒ අයත් එක්ක ගිහිල්ලා ආණ්ඩුකාර ලේකම්තුමියව හමුවෙලා තියෙන්නේ. මෙයාවත් එක්කගෙන ගියා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**23.** කලේගාන පොළ පිහිටා ඇති භූමියේ වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නියමිත බැවින් 2021 වර්ෂය සඳහා කලේගාන පොළ ටෙන්ඩර් කිරීම අත්හිටුවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ටෙන්ඩරය ගත්තේ නැහැ කොහොමත්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** පොළේ වෙළෙන්ඳන්ට වෙළඳාම් කරන්න තැනක් අපි යෝජනා කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඊළඟ එකේ තියෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**24.** කලේගාන පොළ තාවකාලිකව වක්වැල්ල පැරණි පොළ පිහිටි භූමිය වෙත ගෙන යාමටත්, වක්වැල්ල පොළ පිහිටි භූමිය පොළ පැවැත්විය හැකි ලෙස සංවර්ධනය කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එතනට ටෙන්ඩර් එකක් දාන්න ඕනද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන හදලා ඉවර වුණාට පස්සේ ටෙන්ඩර් එක දාන්න ඕන. දැන් දැන්වීම දාලා තිබුණේ කලේගාන පොළ කියලා. ඒ ටෙන්ඩර් එක අත්හිටෙව්වා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 25.** ආදාහනාගාරය, පොළ භූමියේ ඉදිවන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඇතුළු අප බල ප්‍රදේශයට වැදගත් සංවර්ධන කාර්යයන් 2021 වර්ෂයේදී ඉටු කිරීමට බලාපොරොත්තු වන බැවින් අප සභාවේ සේවයේ නියතු තාක්ෂණ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් අවලංගු කොට තව වසරක කාලයක් අප ප්‍රාදේශීය සභාවේ සේවය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදි මන්ත්‍රීතුමා සමහරු කැමැත්තෙන්ම යනවා. සමහරුන්ට අපි ඉල්ලුවා ඔය කාරණා කියලා. නමුත් ඒවා පිළි අරගෙන තිබුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒකට මගේ විරෝධතාවය සඳහන් කරලා යවන්න. අපි දේශපාලඥයෝ විදියට රාජ්‍ය සේවයේ ස්ථාන මාරුවීම් වෙන ඒවාට ඉල්ලීම් කිරීම සුදුසු දෙයක් නෙමෙයි මම හිතන්නේ. දැන් අපේ ගුණසේකර මහතා ඉන්නවා, කමණි මහත්මිය ඉන්නවා. දක්ෂ, වැදගත් තාක්ෂණ නිලධාරීන් දෙපලක් ඒ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නම් වශයෙන් ඕන නම් කියන්න පුලුවන්. දිනූෂ මහත්මයා කොහොමත් යනවා කියන එක දැන් දිගින් දිගට කාලයක් තිස්සේ ඉඳන් කිය කිය ඉන්නවා. ගුණසේකර මහතාට අපි අභියාචනයක් ඉදිරිපත් කරා. නමුත් ඒ අභියාචනය පිළි අරගෙන තිබුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපි සභා තීන්දුවක් අරගමු. මම සියලුම දෙනා හැටියට ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කාරණය කියලා අපි අභියාචනයක් ඉදිරිපත් කරා. අපිත් කැමතියි. ඕන නම් සභා තීන්දුවක් විදියට යවන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපි ඉල්ලීමක් කරමු දේශපාලන අධිකාරියෙනුයි, සියලු දෙනාගෙන්ම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දිනූෂ මහතාට අදාළ වෙන්නේ නැහැ හොඳද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක දෙන්නටම කියලා දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ මන්ත්‍රීතුමා. දිනූෂ මහතා දිගින් දිගට මගෙන් ඉල්ලනවා ස්ථාන මාරුව යන්න. දැන් මේ ප්‍රශ්නයකුත් තියෙනවානේ. ඒකත් කියන්න එපැයි. මට කොට්ඨාශ, වසම් අයින් කර කර ඉන්නත් බැහැනේ. උප සභාපතිතුමා එක්ක වැඩ කරන්න බැහැ කිව්වා. ඒපාර එතනට දැම්මා ගුණසේකර මහතාව. එතකොට වැඩිපුර දුන්නේ නැහැ. එකෙන් අඩු වුණා. ඊට පස්සේ චනක මන්ත්‍රීතුමා එක්ක වැඩ කරන්න බැහැ කිව්වා. මම දැන් ඒකට දාන්න හැදුවා. ඔක්කොම අයින් කරලා බැහැනේ. දිනූෂ මහතා මෙහෙට ගෙන්වලා කමණි මිස්ව එතනට දාන්න හැදුවේ. ඒකට දිනූෂ මහතා එකඟ වුණේ නැහැ. දිනූෂ මහතා කියන්නේ මට එහෙම බැහැ, මෙහෙන් ස්ථාන මාරු යනවා කියලා. එහෙම ස්ථාන මාරු යන්න කැමති එකේ අපිට සභා තීරණ අරගන්න බැහැ ඒ කාරණය සම්බන්ධව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ ක්‍රමවේදය නතර කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන ක්‍රමවේදයද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාව හැටියට ඕන බලප්‍රදේශයක වැඩ කරන්න ඕන. ඒක අතන වැඩ කරනවා. මෙතන වැඩ කරනවා කියලා කියන්න බැහැ. එහෙම වැඩ කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමට නිලධාරීන් අරහෙට මෙහෙට දාන්න එපා. වැරැද්දක් තියෙනවා නම් ඒ වැරැද්ද නිවරදි කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක හින්දා අපි ඉල්ලීමක් කරේ. එයාට මෙතන වැඩ කරනවා කියලා කියන්න බැහැනේ. සභාවේ පරිපාලනය ඒක තීරණය කරන්න ඕන. වැඩ කරන්නේ කොතනද කියන එක සභාවේ පරිපාලනය තීරණය කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එයා ලබන අවුරුද්දේ මුල ස්ථාන මාරු යනවා. ඒක හින්දා මාරු කරන්න එපා කිවුවා. මට ඉන්න බැහැ ස්ථාන මාරු යනවා කියලා කිවුවානේ. එහෙම ස්ථාන මාරු යන්න කියලා කිවුවට පස්සේ නැවත ඉල්ලලා යවන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කැමැත්තෙන් ස්ථාන මාරු යනවා නම් අපිට ගැටළුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ ස්ථාන මාරුව කරන්න. ගුණසේකර මහතාව තියා ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එයා කැමැත්තෙන් ස්ථාන මාරු යනවා නම් ඒක කරන්න. මම තාක්ෂණ නිලධාරීන් එක්ක කතා කරලා මේ යෝජනාව කරලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට පරිපාලන වශයෙන් කරන්න පුලුවන් එතුමාව මෙහෙට දාලා කමණි මිස්ව එහෙට දාන්න. ඒකටත් බැහැ කිවුවා. මම ස්ථාන මාරු යන්න කිවුවා ඉන්නේ. ඉතින් මම ස්ථාන මාරු යන්න කිවුවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එහෙම කැමැත්තෙන් ස්ථාන මාරු යනවා නම් ඒකෙ ගැටළුවක් නැහැ. මම බල කරලා කියන්න කියනවා නෙමෙයි. පොදු ඉල්ලීමක් කරන්නේ. පුද්ගලයා නම් කරලා කරන්න බැහැනේ. ඒකට විරෝධතා මත තියෙනවා නම් සඳහන් කරගන්න ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 26.** දීර්ඝකාලීන ගැටළුවක්ව පවතින ජස්ටින් කන්ද හරහා ගැමුණු මාවත දක්වා ඇති ඇළ මාර්ගයේ අවසාන කොටස සඳහා සභාවේ ජේ.සීබී යන්ත්‍රය යොදා කාණු කපා ප්‍රමාණවත් පරිදි සිලින්ඩර් යොදා ජලය බැස යාමට සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 27.** මාකන්වත්ත පළමු අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා**

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා සහ මගේ ආදරණීය මන්ත්‍රීවරුනි ලේකම්තුමා ප්‍රධාන සෙසු නිලධාරීන්ගෙන් අවසරයි.

ගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමාටත්, මගේ කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට දායකත්වය ලබා දීපු අනෙකුත් මැති ඇමතිවරුන්ටත් මාගේ ස්තුතිය පුද කරනවා. ඒ වගේම 2021 වර්ෂයේදී කාටවත් ලෙඩක් දුකක් නැතුව සනීපව වෛරය, ක්‍රෝධය, මාන්නය තුරන් කරලා අපි සියලු දෙනාම සහයෝගයෙන්, එකාමෙන් ගම සංවර්ධනය කරන්න දායකත්වය ලබා දෙන්න කියලා ගරු මන්ත්‍රීතුමාලාගෙන් සහ සෙසු නිලධාරීන්ගෙන් මම ඉල්ලා සිටිනවා.

**28.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අයත් කලේගාන කොට්ඨාශයේ පාරවල් ගැසට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 29.** වටරැක නැගෙනහිර, ජංගුව වත්තට යන මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 30.** ජය මාවතේ (ටයිනි පාර) ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 31.** මිහිඳු මාවතේ දෙවන පටුමග කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 32.** මිහිඳු මාවතේ පිං ළිඳ අසළ තිබෙන පාරේ කොටසක් සංවර්ධනය කර තිබෙන අතර, පාරේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 33.** සමනළ උයන, දෙවන පටුමගේ ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 34.** සමනළ උයන, පළමු පටුමගේ මීටර් 50ක පමණ ප්‍රමාණයක් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 35.** වයිනේරු කන්දට යන පාරේ වැට යට සිට උඩට කොන්ක්‍රීට් කණු හතරක් යොදා ආරක්ෂිත වැටක් සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** වයිනේරු කන්දට තාක්ෂණ නිලධාරීන් ගිහින් බැලුවා. කොන්ක්‍රීට් කට්ට තියෙන නිසා හදන්න බැහැ කිවුවා. නමුත් ඔබතුමා දකින්න ඇති ඒ පැත්තේ ගියාම වම් පැත්තේ කොන්ක්‍රීට් කට්ටටම කාණුව තියෙන්නේ. කන්දක් වගේ ඒක හරිගස්සවලා තියෙන්නේ. ඒක හින්දා මම යෝජනා කරේ උඩ ඉඳලා කණු හතරක් බැඳලා ආරක්ෂිත වැටක් හරිගස්සවලා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 36.** බංගලාවත්ත මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 37.** සෙන්ට්‍රීටාස්, පස්වන පටුමගේ කාණු පද්ධතියක් කපා දෙපැත්ත කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 38.** නාගරුක්ඛාරාම පන්සලට යන පාරේ කාණු පද්ධතිය ජේ.සී.බී යන්ත්‍රය යොදා වතුර බැසයාමට සකස්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 39.** රට්ටම්බිගේවත්ත පාරේ කොන්ක්‍රීට් කට්ටටම තාප්ප බැඳ ඇති හෙයින් එය නැවැත්වීමට තාක්ෂණ නිලධාරිතුමා ඔවුන්ට දැන්වූවත් එය ක්‍රියාත්මක නොකර ඔවුන් තාප්ප බැඳ ඇත. එබැවින් පාර මැන තාප්ප ඉවත්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පළමුවෙන්ම ගරු සභාපතිතුමනි, මගේ යෝජනා සම්බන්ධයෙන් කතා කරන කොට මම යෝජනා ඉදිරිපත් කිරීමේදී ඉන් දෙකක් න්‍යාය පත්‍රයෙන් ඉවත් කොට දැනුම් දීලා තියෙනවා. ඒක සම්බන්ධව මට පොඩි ගැටළුවක් මතු වුණා ගරු සභාපතිතුමනි, එකක් පරිපාලනමය කටයුතු කෙරෙහි බලපාන ප්‍රශ්න වලට අදාළ නොවන කාරණයක් කියලා ඒකට හේතුව කියන්නේ. මෙතනදීම ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රතිවිරෝධතාවයක් මතු වුණා. මම මතු කරේ ඉස්සෙල්ලා අර පාර සම්බන්ධ ප්‍රශ්නයේදී වැරදි නිර්දේශ මත ගෙවීම් අත්හිටුවීම සම්බන්ධයෙන්. ඒකට දැන් ඔබතුමා නැවත ගෙවන්න කියන කාරණය එක්ක මම මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඉංජිනේරු මහත්වරු කරපු දෙයක් මිසක් අපි කරපු දෙයක් නෙමෙයි ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙවැනි කාරණා නිසා නිලධාරීන්ගේ විෂය පථයට අදාළව එයාට තියෙන සුදුසුකම් මත, එයාට ඒ බලය පැවරිලා තියෙන එක ඇත්ත. හැබැයි අපිට ඒ මතුවෙච්ච ප්‍රශ්න ගොඩක් තියෙන නිසා පාරවල් සම්බන්ධ ප්‍රශ්නය ගැන දිගටම කතා කරා. ඒ ගැටළුවට විසඳුමක් හැටියට තමයි මම කිවුවේ මේකට ක්‍රමවේදයක් හදන්න කියලා. සාධාරණ ක්‍රමවේදයක් වෙන විදියකින් මේක තහවුරු කර ගැනීමට සකස් කරන්න කියලා කිවුවේ. එක පුද්ගලයෙක් කරන නිසා ප්‍රශ්න පැන නැගිලා අතුරු ප්‍රශ්න ඇවිල්ලා සභාවට ඒකෙ ප්‍රශ්න මතු වුණා. වැරැද්දක් කියනවා නෙමෙයි මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මන්ත්‍රීතුමා මෙහෙමයි. ඔබතුමා කියන කාරණයේ කොටසක් ඇත්ත. මමත්, 100% ක් එකග නැහැ මේකට. අඩුපාඩු තියෙනවා. අපි දැකපු අඩුපාඩු තියෙනවා. කමිටුවේ අපි කට්ටියත් එක්ක යද්දී මතුවෙච්ච අඩුපාඩු තියෙනවා මේ දේවල් කිරීමේදී, උදාහරණයකට දැන් අබේසේකර මන්ත්‍රීතුමා කියපු සෙන්චරි ෆිනෑන්ස් එකෙන් කරපු වෙන්දේසි ඉඩමේ ජල ටැංකිය සම්බන්ධව බරපතල ප්‍රශ්නයක් තියෙනවා. මේවා සම්බන්ධව ප්‍රශ්න තියෙනවා නැත්තේ නැහැ. ඒ වගේම තමයි දැන් මේ කමිටුවට තමයි මේ දේවල් කරන්න වෙලා තියෙන්නෙත් තාක්ෂණ නිලධාරීන්ට දිගින් දිගට කියපුවා නොවුණ එක තුළ. ඒක නිසා තමයි කමිටු පත් කරේ. ඒ සියලු කාරණා ඇත්ත. නමුත් මම කැමති නැහැ මන්ත්‍රීතුමා සභා තීන්දු අරගෙන නිලධාරීන්ව එක තැනකට හේත්තු කරන්න. මම සභාපතිවරයා විදියට ඒ වගකීම ගන්නම්. ඒ හින්දා තමයි මම ඔබතුමාගේ ඒ යෝජනාව අයින් කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම මතු කරෙත් ඒ කාරණය. නැත්නම් වැරදි මතයක් යනවා නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියපු එක වැරදි නැහැ. ඒකනේ මම කිවුවේ. වෙච්ච වැරදි තියෙනවා. මම උදාහරණයක් කිවුවේ. අපි ඒක දැනගන්න ඕන මන්ත්‍රීතුමා. ඒක මගෙත් අඩුපාඩුවක්නේ. අපේ නිලධාරීන්ගෙන් ඒ මට්ටමේ වැරදි වෙනවා නම් සභා තීන්දු අරගෙන කටයුතු කරන්න

ඕන නැහැ. අපිට ඒ වැරැද්ද නිවැරදි කර ගන්න ක්‍රමවේද තියෙනවා. ඒකට අපි සභා තීන්දු ගන්න ඕන නැහැ කියන එක තමයි මගේ හැඟීම තියෙන්නේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ සම්බන්ධව හරි. ඔබතුමා ඒ වගකීම අරගෙන ඉදිරියේදී ඒකට ක්‍රියාමාර්ග ගනීවි කියන විශ්වාසය අපි තියා ගමු. මම යෝජනා කරපු දේට වැරදි මතයක් ගියා. මට ආරංචි වුණා මම නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරා කියලා මතයක් යනවා. ඒක වැරදියි, එහෙම වුණා නම්. එහෙම අදහසකින් නෙමෙයි මම ඒක කරේ. ප්‍රශ්න ගොඩක් මතු වෙච්ච වෙලාවේදී අපිට සාධාරණ ක්‍රමවේදයන් ඕන කියන තර්කය මත ඒක කරේ.

ඊළඟ කාරණය තමයි බටුවන්තුඩාවේ පීල්ල සම්බන්ධ ප්‍රශ්නය. හැබැයි ඔබතුමා ඒකට කලින් කරපු යෝජනාවකුත් තිබුණා. මම ඒක දැනුවත්ව තමයි මේක යෝජනා කරේ. ඒකෙදි ඔබතුමා කිවුවේ පොකුණ කොන්ක්‍රීට් කරලා කරන එකක් සම්බන්ධයෙන්. මම හැබැයි යෝජනා කරේ ඒක නෙමෙයි. මේ පැවිල්ල කාලේ එන ජල පහර කාණුව දිගේනේ එන්නේ. ඒක ක්‍රමවත් කරලා යවන්න ඕන. ඒකෙන් තමයි මඩ එකතු වෙන්නේ. මම යෝජනා කරේ ඒ අර්ථයෙන්. පොකුණ වෙනස් කරනවා කියලා නෙමෙයි යෝජනා කරේ. ඔබතුමා ඒකත් මේකෙන් අයින් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අයින් කරේ නැහැ. මම කිවුවා ඒ හා සම්බන්ධ යෝජනාවක් දැම්මා කියලා මතකයි, ඒක බලන්න කියලා. ලියනගේ මන්ත්‍රීතුමත් යෝජනාවක් දැම්මා ඒකට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මමත් යෝජනාවක් දැම්මා ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ ඒක බලලා එක සමාන යෝජනාවක් තියෙනවා නම් මේක දාන්න එපා කියලා. මම නම් කරලා කිවුවේ නැහැ. අරක නම් අයින් කරන්න කියලා කිවුවා. මම මෙතුමාට කිවුවේ මේක බලලා ඒ සමාන යෝජනාවක් තියෙනවා නම් දාන්න එපා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රශ්නයක් නැහැ. අපි කිවුවෙත් ඒක බලන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක තිබුණා. ලියනගේ මන්ත්‍රීතුමා ඔය යෝජනාව ගෙනාවා. මඩ එකතු වෙන්න දෙන්න එපා, මඩ අයින් කරන්න කියලා යෝජනාව ගෙනාවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ඇත්තටම වැදගත්. වහින්නේ නැහැ මේ කාලයේ. මේ කාලයේදී මොකක් හරි කරන්න පුලුවන් නම් වියදම අවම වේවි.

**40.** හෝළුවාගොඩ කුඹුරුයායේ වී වගාව සිදු කිරීමට නොහැකි බිම් විකල්ප තාවකාලික බෝග වගා කිරීම සඳහා භාවිතා කිරීමේදී අදාළ ඉඩම් හිමියන්ට සහ ප්‍රදේශයේ ගොවි ජනතාවට ප්‍රමුඛතාවය දී අදාළ ප්‍රතිලාභ සාධාරණව බෙදීයන නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කරන මෙන් අදාළ ආයතන දැනුවත් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හෝළුවාගොඩ වෙල්යායේ පැවති සාම්ප්‍රදායික වී වගාවට ඇති හැකියාව අඩු වෙලා කුඹුරු අත්හැරීම නිසා අළුත් ව්‍යාපෘතියක් දැන් ඒකට වෙනම ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ මන්ත්‍රීතුමා ඔබතුමාගේ වැඩි දැනුවත් වීම පිණිස මම මේක කියන්නේ. මේකෙ අක්කර 14 ක පවරා ගැනීමේ කටයුතු වල දැනට අවසාන අදියරේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අක්කර 14 ක් ද, 13 ක් ද ගරු සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 13 ක් නැත්නම් 14 ක්. ඒකෙ සියළු කටයුතු අවසන් මට්ටමේ තියෙන්නේ. පර්චස් එකකට රුපියල් පන්දහසක මුදලක් තමයි ගෙවන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒක නිවැරදි කරනවා සභාපතිතුමා. කුරුණියකට රුපියල් පන්දහසක මුදලක් තමයි ගෙවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුරුණියකට රුපියල් පන්දහසක මුදලක් තමයි ගෙවන්නේ. කෝටියකට වැඩි මුදලක් ඒකට වෙන් කරන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන්. රමේෂ් පතිරණ ඇමතිතුමාගේ යෝජනාවක් මේක. ඒකෙ වැවක්, ඇවිදින මංතීරුවක්, වෙනම ළමා උද්‍යානයක් හදලා ඒ ආකාරයෙන් වැඩසටහනක් යනවා. ඒක සභාවට තමයි පවරලා දෙන්නේ. නඩත්තු කටයුතු ඔක්කොම සභාවට තමයි පැවරෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒකෙන් අක්කර 11 ක් පාරේ යටි පැත්තෙන් ගන්නේ. මම මේ යෝජනා කරේ දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා රජයේ මහජන මුදල් වැය කරමින් දැන් තියෙන කුඹුරු යායේ කලවිටි හදලා ඒක පවරලා තියෙනවා ව්‍යාපෘතියක් හැටියට කරගෙන යන අයට. මේකෙ ප්‍රශ්නය තියෙන්නේ රටේ පොදු මහජන මුදල් යොදවලා කරන කාර්යයේ ප්‍රතිලාභ ඒ ඉඩම් හිමියන්ට ලැබෙන්නේ නැහැ. අර අක්කර 11 වෙනයි, අනෙක් පැත්තේ අක්කර දෙක වෙනයි. ඒක අර කියපු ව්‍යාපෘතියට නෙමෙයි මේකෙ වෙනත් ක්‍රියාවලියක් තමයි තියෙන්නේ පාරෙන් උඩ කොටසට. ඒකට මම යෝජනා කරන්නේ රජයේ මුදල් යොදවලා ඒ මුදලින් විශාල මුදල් ප්‍රමාණයක් ඒකට වියදම් වෙනවා. ඊට පස්සේ ඒ කුඹුරු ඉඩම් හිමියන්ගෙන් ඒ කොටසත් පවරා ගන්න ඕනද ඇහුවම ගොවිජන සේවා එකෙන් කිවුවේ ඒක පවරා ගන්නේ නැහැ කියලා. සමහර ගොවියෝ කැමති නැහැ එහෙම පවරලා දෙන්න. ඒ සිද්ධියට මම මැදිහත් වුණා. කෙටියෙන් කියනවා නම් එයාලගේ ඉඩම් එයාලා වවන්නම් කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඔය කියන එක පැහැදිළි නැහැ. හරියට පැහැදිළිව කියන්නකෝ. දැන් ඔය කෙරිච්ච එක ගැන මොකද කියන්නේ. දැන් ඔය වවලා තියෙනවානේ. ඒක ගැන මොකද කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි මම මේ කියන්නේ. ඒක වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් ඇළවල් ගොඩ දාලා තියෙන්නේ කළවිටි කරන්න. මහජන මුදල් යොදවලා පවරා ගෙන තියෙන පුද්ගලික ඉඩම් කොටසක් තියෙනවා. ඒ අයට ගෙවීමක් කරලා නැහැ. එකඟතාවයක් අර ගත්තා මේක සංවර්ධනය කරන්න ඉඩ දෙනවා කියලා. ඒ වෙනුවට ඒ අය කරනවා නම් ඒ අයට ඉඩ දෙනවා කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙච්ච දේ හොඳද, නරකද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ යෝජනා කරේ විකල්ප, තාවකාලික බෝග සඳහා වගා කරන්න. ඒවා කරන්නේ වෙන කරන්න දෙයක් නැති නිසානේ. වී වගා කරන්නේ නැත්නම්, ඒක කරන්න බැරි කමක් තියෙනවා නම්, විකල්ප බෝග වලට තියෙන ඉඩකඩ ක්‍රියාත්මක කරන්න ඕන. ඒකට යන ක්‍රමවේදය ඇතුළේ අදාළ ඉඩම් හිමියන්ටවත්, ප්‍රදේශයේ ගොවියන්ටවත් ප්‍රතිලාභ ලැබෙන එකක් නෙමෙයි මේ වෙලා තියෙන්නේ. ඒකයි කාරණය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ අදහස වැරදියි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමාගේ ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කතා කරලා ඉවර වුණාට පස්සේ උත්තර දෙන්න ඔබතුමා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒකට උත්තරයක් දුන්නොත් හොඳයි ඔබතුමාට. ගරු සභාපතිතුමා ඉන්දික මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධව මට සාකච්ඡා කරන්න ඕන. හේතුව මගේ කොට්ඨාශය තුළ සිදු වෙන සිදුවීමක් මේක. ගරු ඇමතිතුමා දිගින් දිගටම ඒ සම්බන්ධව සාකච්ඡා කරමින් පවතින අවස්ථාවට සම්බන්ධ වෙමින් බලලා තියෙන නිසා යම් දැනුමක් ඒ ගැන තියෙන නිසා මේ කතා කරන්නේ. ඉන්දික මන්ත්‍රීතුමාගේ යෝජනාව වන්නේ ඉඩම්හිමියන්ට ප්‍රමුඛතාවය දීලා වගා කිරීමේ කටයුතු කරන්න කියලා. හැබැයි ගරු සභාපතිතුමා අපි දැනුවත්ව අවුරුදු විසි පහක තිහක කාලයක් කෙරිච්ච නැති කුඹුරක් පාළුවට යන කොට මොනවා හෝ යෝජනාවක් ගෙනල්ලා ඒක යම්කිසි ආකාරයකින් ක්‍රියාත්මක කරලා තියෙනවා. හැබැයි ඒ කුඹුරු ඉඩම්හිමි අයිතිකාරයෝ මම සම්බන්ධ කර ගෙන තියෙනවා. ඒකෙ ඉන්න ඉඩම් අයිතිකරුවන්ගේ නම් මම මෙතන කියන්නම්. ඒ සියළුදෙනා මේකට බොහොම එකඟයි. හැබැයි ඒ අයට හැකියාවක් නැහැ ඔය ආකාරයට මේ වගාව කරන්න. ඒ කුඹුරට බැහැලා මේ විදියට වගාව කරන්න ඒ අයට හැකියාවක් නැහැ. මම පුද්ගලිකව ඒ අය එක්ක කතා කරලා තියෙනවා. එහෙම ඉන්නවා නම් මාත් එක්ක කතා කරන්න කියන්න. එතකොට ඒ කිසි කෙනෙක් මෙහෙම කියන්නේ නැහැ. බොහොම හොඳයි අපිට ඔහොම කුඹුරට බැහැලා කරන්න බැහැ, මේ කරන වැඩේ හොඳයි කියලා කියන්නේ. හැබැයි අයිතිය සම්බන්ධ ප්‍රශ්නය තමයි ඒ අයට නිරාකරණය කර ගන්න ඕන. ඒකට ඇමතිතුමා කිවුවා අනිවාර්යයෙන්ම අයිතිය සම්බන්ධ ප්‍රශ්නය නිරාකරණය කරලා දෙනවා කියලා. එතකොට අක්කර 13 න් අක්කර 11 ක් පාරෙන් පහළින් ගන්නත්, අක්කර දෙකක් පාරෙන් උඩහින් ගන්නත් තමයි කරන්නේ. අක්කර දෙකේ තමයි වගා කරන්නේ. ඒ වගා කරන හැම භූමියක්ම ඒ ආකාරයෙන්ම ප්‍රදර්ශනාත්මකව ඔය එල දරණ විදියට වගාවක් කරන්න මම හිතන්නේ නැහැ ගමේ කවුරුවත් ඉන්නවා කියලා. මම ඒක බොහොම පැහැදිළිව කියනවා. මේක ගමට වෙන විදියකට යන්න පුළුවන් හෙට වෙන කොට. හැබැයි වගා කරන්න පුලුවන්. ඔය ආකාරයට වගා කරන්න පුලුවන් අය බොහොම අඩුයි. මේක යෝජනා කරේ ඇමතිතුමා. ඇමතිතුමා තමයි

මේක ඉදිරිපත් කරේ. ඇමතිතුමා තමයි පුද්ගලයන්ව ඉදිරිපත් කරේ. ඇමතිතුමා තමයි මේක පුද්ගලයන්ට භාර දුන්නෙත්. ඒ ක්‍රියාදාමය බොහොම සාර්ථකයි. ඉතිං ඒක අපි අනිවාර්යයෙන්ම අගය කළ යුතුයි. ඇමතිතුමාට බොහෝමත්ම ස්තුතිවන්ත විය යුතුයි ඒක යෝජනා කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව. මොකද, බලයක් ඇතුව තමයි මේක කරන්න ඕන. බලයක් නැත්නම් මේක කරන්න බැහැ. හැකියාව තිබුණට බලයක් නැත්නම් මේක කරන්න බැහැ. ඉතිං එතුමා බලය පාවිච්චි කරලා ඒ හැකියාව අනුව සුදුසු පුද්ගලයෙකුට ඒක දීලා තියෙනවා. හැබැයි ඒ ඉඩම් වල අයිතිය සම්බන්ධ ප්‍රශ්නය පිළිබඳව එතුමා බොහොම පැහැදිළිව කිව්වා අයිතිකාරයන් සමඟ මේක නිරාකරණය කරලා දෙනවා කියලා. ඒ අයිතිකාරයොනුත් කැමතියි මේක කරනවාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගෙන් නොකියවුණු දෙයක් මම කියන්නම්. මෙතනදී ඇත්තටම දැන් ඒක කරන හින්දා තමයි මෙහෙම කියන්නේ. අවංකවම හෘද සාක්ෂිය අනුව අපි මේක බලමුකෝ. මේක කරන හින්දා තමයි ඇස් ඇරිලා ඔය ගැන කතා කරන්නේ මෙච්චර කල් අවුරුදු 40ක් විතර ඕක පුරන් වෙලා තිබුණා. නමුත් ඇමතිතුමාගේ අරමුණ තිබුණේ මෙච්චරයි. එහෙම නම් දේශපාලන වශයෙන් බැලුවත් මේක කරන්නේ අපේ කෙනෙක් නෙමෙයිනේ ඇත්ත කතාව ගත්තම චන්ද්‍රලාල් මහත්තයා ගැන. නමුත් ඇමතිතුමාගේ අදහස තිබුණේ වෙන දෙයක්. මේකෙදී තාක්ෂණය දන්න කෙනෙක් ලවා මේ වැඩේ කරන්න ඕන. කවුරුවත් අත ගැහුවේ නැහැ. ඇත්ත කතාව කියන්න ඕන. දැන් ඕන තරම් කට්ටිය ඉඳීවි. නමුත් දැන් කට්ටිය හිටියත් මම හිතන්නේ නැහැ ඔය මට්ටමට කර ගන්න පුළුවන් කෙනෙක් ඉඳීවි කියලා. කරන්න අමාරුයි පළවෙනි කාරණය. අනෙක් එක අපි වුණත් හිතුවා මේක එක වැස්සක් ආවා නම් සම්පූර්ණයෙන් ඉවරයි කියලා. ඒ අවධානම අරගෙන තමයි ඒක කරේ. තවත් කාරණාවක්. මෙතනදී මේ අය ඒක කරේ හෙට වුණත් දාලා යන්න බලාගෙන. මේක ආදර්ශයක් විදියට විතරයි කරේ. අනිත් ටිකේ වේලී ටික දැන් කපාගෙන යනවා. ඇමතිතුමා කිව්වා ගමේ අය ඉන්නවා නම් ඉදිරිපත් කරන්න කියලා. එන්න කියන්න කියලා ඒ අයට ඕක කරන්න කියලා කිව්වා. චන්ද්‍රලාල් අබේගුණවර්ධන මහත්තයාගෙන් උපදෙස් ඔක්කොම තැනට ඇවිල්ලා කියලා දෙන්නම් කියලත් කිව්වා. ගමේ අයට එකතු වෙලා කරන්න කියලා තියෙන්නේ. මේකෙන් වුණේ මන්ත්‍රීතුමා ආදර්ශයක් දෙන එක. තව කාරණයක්, ඊයේ දිනයේදී මම පුදුම සතුටක් ලැබුවේ. ඊයේ තිබුණා දකුණු පළාතේ රැස්වීමක්. ඊයේ මාතර විශ්ව විද්‍යාලයේ වැඩසටහනක් තිබුණා බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ඒක තිබුණේ ඉදිරියට එන වැඩ සමඟ යළි ගමට වැඩසටහන සම්බන්ධව. ඒ සම්පූර්ණ වැඩසටහන යද්දී පළාතේ ඉන්න සියළුම කැබිනට් ඇමතිවරු, පළාත් සභාවේ හිටපු ඇමතිවරු, මන්ත්‍රීවරු, ප්‍රාදේශීය සභා සභාපතිවරු, සියළුම රාජ්‍ය අංශවල නිලධාරීන් හිටියා රැස්වීම් ශාලාව පිරෙන්න. එතනදී ඕක ගැන බොහොම හොඳ කිව්වා. ඡායාරූප දාලා වීඩියෝ දාලා. මේක ගැන බොහොම වර්ණනාවක් කරා ඇමතිතුමා ගැන කියලා. මෙතෙක් කල් අවුරුදු හතළිහක් පුරන් වෙලා තිබුණ කුඹුරට මෙන්න කරපු දේ. මේ වගේ තමයි වෙන්න ඕන කියලා කිව්වා. බෝපෙ පෝද්දල කියලා නමත් කිව්වා. අපිට ඒක ලොකු දෙයක් වුණා එවෙලේ. අපිට ආඩම්බරයක් බෝපෙ පෝද්දල කිව්වම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒකෙ හිමිකාරීත්වයත් ලැබෙන්නේ මෙහෙට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ යෝජනාව තියෙන්නේ මෙහෙමයි. මම දැන් ඒක කියන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලංකාවේ හොඳම ගොවියට තේරුණ කෙනෙක් තමයි චන්ද්‍රලාල් මැතිතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** චන්ද්‍රලාල් මහතාගේ පෞද්ගලික හැකියාව සම්බන්ධයෙන් අවතක්සේරුවට ලක් කිරීමක් හෝ එහෙම නැත්නම් මේ වෙනත් කටයුත්තක් සම්බන්ධව පෞද්ගලික කාරණාවක් නෙමෙයි මම මේ කතා කරේ. මම මේකෙ යෝජනා කරන්නෙම වෙන දෙයක්. ඔබතුමා කිව්වා මේ කුඹුරු අවුරුදු 40 ක් තිස්සේ පුරන් වුණා කියලා. මේ කුඹුරු අවුරුදු 40 ක් තිස්සේ පුරන් වුණේ නැහැ. අපි පොඩි කාලේ ඔය කුඹුරු යායම කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරාට වැඩක් වුණේ නැහැනේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කාලේ කුඹුරු යාය කරා. මෑත කාලයේදීත් තැනින් තැන කුඹුරු කරා. මිනිස්සුන්ට ප්‍රශ්න ගොඩක් තිබුණා මේවා කරද්දි. වැස්සෙන් කුඹුරු යාය යටවෙලා යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2002 දී මට මතකයි හේමකුමාර ඇමතිතුමා වප් මඟුලක් පවා ඕතන කරා. ඒක කර ගන්න බැරි වුණානේ. ඩික්සන් රාජා සභාපතිතුමා ගෙදර ගියෙත් ඔය මඟුල හින්දානේ. ඇත්ත කතාව ඒක කරගන්න බැරිවුණ එකටත් අවුරුදු 18 ක් වෙනවානේ. අබේසේකර මන්ත්‍රීතුමා ඇම දැම්මේ ඕකට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඩික්සන් රාජා සභාපතිතුමා ගෙදර ගිය එක වෙනම කතන්දරයක්නේ. යෝජනාවේ මම කිවුවේ මෙහෙමයි. දැන් මෙතුමා කිවුවා ගමේ කවුරුවත් නැහැ කියලා මේක කරන්න දෙන්න. ඒක නිසා මේක දෙන්න වුණා කියලා කිවුවා. එහෙම කාරණයක් නැහැ. මේ ප්‍රදේශයේ ගොවියෝ ඉන්නවා. කරන්න පුළුවන් අය ඉන්නවා. ඒ අය ඉදිරිපත් වෙනවා. ඉස්සරහටත් ඉදිරිපත් වේවි. නමුත් ප්‍රශ්නය තියෙන්නේ ඒකට මොනවා හරි තාක්ෂණය තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එළවලු විකිණීමෙන් මුල් දවස් තුනේ ආදායම ලක්ෂ දහයයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** වෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළවෙනි දවසේ පිපිඤ්ඤා ආදායම දෙලක්ෂ අසූ පන්දාහයි. ඒ පිපිඤ්ඤා වලින් ආපු ආදායම විතරයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම අහන්නේ මෙහෙමයි. රජයේ මුදල්නේ ඔය සංවර්ධන වැඩ කටයුතු වලට යට කරේ. ඕක ගොඩ දැම්මේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ දකින දැකිල්ලේ වැරැද්ද මන්ත්‍රීතුමා ඕක. ඇත්ත කතාව ඒක. කොරහේ කිඹුල්ලු දකිනවා. ඒක ගැන අපි ඇත්තටම සතුටු වෙන්න ඕන. ඒ වගකීම ගන්නේ නැහැ කවුරුවත්. ඒ අවධානම කවුරුවත් ගන්නේ නැහැ. ඔබතුමා මේ කතා කරන්නේ අද තත්ත්වය. නමුත් මේ මිනිහා මේවා වවද්දි අපිත් හිතුවේ එක වැස්සක් ආවම ඒක ඉවරයි කියලා. වෙලාවට පාර ළඟටම ඇවිල්ලා, වේල්ල ළඟටම ඇවිල්ලා වතුර පාර නැවතුණා. කෙම් කටයුතු කරලා කරන වැඩක්ලු ඒක. ඒක හින්දලු එහෙම වුණේ. ඒවා කරන්නේ කෙම් වලට. ඒ අර සූර්යයා උදා වෙන එක බලලා එහෙම කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඔහොම කිවුවට ඔය ඉඩම් හිමියන්ගෙන් ඕවා පවරා ගන්නවා කියලා එයාලා දන්නෙත් නැහැ. කොටසක් කැමති වුණා තමන්ගේ ඉඩම්වල වගා කරන්න කැමතියි කියලා. ගොවිජන සේවා එකේ රැස්වීමේදී ඒ පුද්ගලයෝ ගොවියන්ට කිවුවෙත්, ඒ ඉඩම් හිමියන්ට කිවුවෙත් තමන්ගේ කොටස තමන්ට දෙනවා කියලා. අයිතිය සම්බන්ධව ප්‍රශ්නයක් නැහැ. තමන් කරන්න කැමතියි නම් තමන්ට දෙනවා. මොකද ඒ මිනිස්සු ඒක ප්‍රශ්න කරා. ඒක ගොඩදාන කොටත් කුඹුරු තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ දේ කෙටියෙන් කියන්නකෝ. දැන් මේ කරපු දේ වැරදිද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේක වැරදි තැනකට අරගෙන යන්න එපා. කරපු දේ වැරදියි කියලා නෙමෙයි කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මොකක්ද කිවුවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාව කරන්නේ මෙහෙමනේ. යෝජනාව පැහැදිළිව කිවුවේ ඒකනේ. ප්‍රදේශයේ ඉඩම් හිමියන්ගෙන් ඉදිරිපත් වෙන අයටයි, ඒ ඉන්න ගොවියන්ගෙන් ඉදිරිපත් වෙන අයටයි ප්‍රමුඛතාවය ලබා දෙන්න කියලා කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙනවා. කැමති අය ඉන්නවා නම් එවන්න. වේලි කපලා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඔක්කොම කරලා දෙන්නම්. පැළ ඉන්දන්න කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතන කලවිටි තියෙන සමහර ඉඩම් හිමියෝ ඒවා දෙන්න කැමති වුණේ නැහැ. ඒ අය කිවුවා තමන් ඒවා පුද්ගලිකව කරන්නම් කියලා. ඒවා පෞද්ගලික ඉඩම්නේ. ඒවා සින්නක්කර ඉඩම්. ඒ නිසා මගේ යෝජනාව තිබුණේ මේකට වෙනම දෙයක්. රජයේ මුදල් මේකට වැය කරලා පුද්ගලයොන්ට ලාභ ලබන්න විතරක්, ව්‍යාපාරිකයෝ ඉලක්ක කර ගන්නේ නැතුව ඒ ප්‍රදේශයේ ඉඩම් හිමියන් සහ ගොවි ජනතාවටම මේකෙ ප්‍රතිලාභ එන විදියට නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කරන්න කියන යෝජනාව කරේ. ඒ යෝජනාව වැරදියිද කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** කොට්ඨාශයේ මන්ත්‍රීතුමා විදියට මේ යෝජනාව මම හෙළා දකිනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා හෙළා දකින්නේ මොකක්ද.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඇස් දෙකට මේක දකින්න බැරි කෙනෙක් ඒක කියන්නේ. මම කියන්නේ එහෙම කියන එක වැරදියි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඒ ප්‍රදේශයේ මිනිස්සුන්ට ගිහිල්ලා කියන්න ඒ අයට දෙනවට මම විරුද්ධයි කියලා. ප්‍රදේශයේ ජනතාවට ප්‍රමුඛතාවය දෙන්න කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට හෝළුවාගොඩ වෙල්යාය ගැන විනාඩියක් කතා කරන්න ඕන. මම හිතන්නේ ඇත්තටම එකක් තියෙන්නේ කෘෂිකර්මය කියන එක දියුණු කරන්නේ නැත්නම් මේ රටට ඉස්සරහට යන්න අමාරුයි. ඉතිං ඇත්තටම එකක් තියෙන්නේ, මට හිතෙන්නේ මේ රටේ තමන්ගේ විෂය නොවුණත් ප්‍රශස්තම සමීක්ෂණය කරලා තියෙන්නේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා. එතුමා නීති ක්ෂේත්‍රයේ කෙනෙක් වුණාට එතුමා තමයි ඒක කරලා තියෙන්නේ. මම ඒ ලියවිල්ල වෙනම දෙන්න මේවා කරන්නම්. එතුමා බොහොම පැහැදිළිව කියනවා කළුතර දිස්ත්‍රික්කය සහ ගාල්ල දිස්ත්‍රික්කය කෘෂිකර්මයේදී වී වගාව සඳහා උනන්දු කරවන්න එපා කියලා. ඒ කියන්නේ මොකද හේතුව එදා තිබුණ තත්ත්වය අනුව මේක කරන්න බැහැ කියලා කිවුවේ. ගිං ගඟ ක්‍රමවේදයෙන්වත් ඒක වුණේ නැහැනේ. ඉතිං වෙනත් බෝග සඳහා යන්න කියනවා. මම හිතන්නේ දැන් ඒකට ගිහින් තියෙනවා. ඒකට සතුටු වෙනවා පෞද්ගලිකවම. ඉතිං එකක් තියෙනවා මේ ක්‍රමයේදී අර කියපු දේ ගැන මුලින්ම කට්ටිය ගෙනල්ලා සාකච්ඡා කරා. අයඩම්මි ගෙනල්ලා සාකච්ඡා කරා නම් හොඳයි. ඒක නැතුව හරි දැන් පටන් අරගෙන යන එක හොඳයි. හැබැයි එක ප්‍රශ්නයක් තියෙනවා ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කෙරෙන්නේ නැහැ කවදාවත් ඒක කරා නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක අත අරින්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම ගමෙන් මුලදී විරෝධයක් තිබුණා. ඒක ඔබතුමාගෙත් තිබුණානේ. අපෙත් තිබුණා. ඇත්තටම මෙයාට මොකටද දුන්නේ කියලා එකක් තිබුණා. දැන් අපි හරවන්න ඕන වැඩේ ඒ විදියට. එක්සත් ජාතික පක්ෂයේ කතාව නෙමෙයි අපි කියන්නේ. පිට මිනිහෙකුට, ව්‍යාපාරිකයෙකුට දුන්න එක අපි කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙයාට දුන්නේ මොකද කියන ප්‍රශ්නය නෙමෙයි මට නම් තිබුණේ. ගං වතුර නිසා මට ප්‍රශ්නය තිබුණේ. හැබැයි එකක් තියෙනවා. සාමාන්‍යයෙන් එකක් තියෙනවා මිනිස්සුන්ගේ දැන් ගමක කඩයක් දැම්මම අනෙක් කෙනත් බලන්නේ සිල්ලර කඩයක් දාන්න. හැබැයි ඒක වැරදි දෙයක් ඇත්තටම. සිල්ලර කඩයක් දැම්මම අඩු ගාණේ සපත්තු කඩයක් දාන්න ඕන. ජූස් බාර් එකක්වත් දාන්න ඕන. හැබැයි මේ වැඩේ හොඳයි. හැබැයි මේ වැඩේ හොඳ වගේම මේකෙ තියෙනවා අනතුරකුත්. ඒ අනතුර තමයි දැන් බලන්න හොඳම මිලකට මේකෙ අළෙවිය යනවා. ලක්ෂ ගාණක් කියලා කිවුවේ ඒකනේ ආදායම. හැබැයි ජනතාවට මේක දරන්න පුලුවන් වෙන්න ඕන පළවෙනි එක. දෙවෙනි කතාව දැන් දඹුල්ල පැත්ත ගත්තම වවා ගෙන යනකොට තක්කාලි වවනවා නම් කවුරුත් තක්කාලි වවනවා. ඊළඟට ඒවායින් වෙන නාස්තියත් වෙනවා. එක්කෝ මෙහේ ලැස්ති කරන්න ඕන මෙහේ තැනකින් කැනින් ෆැක්ටරි එකක්. තක්කාලි වලට උදාහරණයක් කිවුවේ. එහෙම නැත්නම් ශීතකරණ මොනවා හරි තියෙන්න ඕන. ඇත්තටම හොඳ විදේශ වෙළඳපොළක් තියෙනවා. දැන් මේක ඇත්තටම මම දකින්නේ බෝවෙනවා හෙට අනිද්දා වෙන කොට. මිනිස්සු බලාගෙන ඉඳලා ආසාවට කරනවා අපිටත් මේ ආදායම ගන්න පුලුවන් කියලා හිතලා. ඒ අදායම ගන්න බැරි වෙන්න පුලුවන්. මම නම් දකින්නේ මේ රෝගය බෝ වෙන එක නම් හොඳයි. මේක බෝකරන්න වුවමනාව තිබුණා ගොඩාක් කල්. අපි පෞද්ගලිකව නිතරම කතා කරලා තියෙනවා මේක ගැන. පලා විකුණලා ජීවිතය ජය ගනිපු මිනිස්සු ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක වටින්නේ කාබනික පොහොර නිසා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මම කියන්නම් එක දෙයක් විතරක්. මේ කාබනික පොහොර කතාවයි, බෙහෙත් නොයෙදනවා කියන කතාවයි මේ ලෝකයටවත් ගැලපෙන්නේ නැහැ. කරන්නත් බැහැ ඒක. ඒක බොරුවක්. හැබැයි ඒක ප්‍රමිතියට දානවද නැද්ද කියන එක තියෙන්නේ. අද තියෙන කටවල් සම්භාරයට අර පරණ වී ජාති වපුරලා කටට දාන්න බැහැ ප්‍රමාණය මදියි. ඒක නිසා අනිවාර්යයෙන්ම ක්‍රමය දියුණු වෙන්න ඕන. හැබැයි අපේ මිනිස්සුන්ට තියෙන්නේ මොකක්වත් නෙමෙයි. ප්‍රමිතියක් නැතුව බෙහෙත් ගහන්න ගියාම ගහගෙන ගහගෙන යනවා. මම දකින්නේ කාබනික පොහොර හෝ කොම්පෝස්ට් ටිකක් දාන්නේ නැත්නම් වගාවෙන් ගුණය ගන්න බැහැ. හැබැයි අපිට රසායනික පොහොර ටිකක් දාන්න වෙනවා. බෙහෙත් ටිකක් ගහන්න වෙනවා. බෙහෙත් නොගහන තැනක් තියෙනවා නම් එහෙම යන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේවාට ගහන්නේ නැහැ. හේතුව මම කියන්නම්. බෙහෙත් ගහන්න අවශ්‍ය නැහැ මේක වෙනම තාක්ෂණයක්. කීටයා පොළවට වැටිලා ඇවිල්ලා තමයි විදින්නේ. වතුර තියෙන කොට එතන කීට ගහණය නැහැ. පළවෙනි කාරණය ඒක. දෙවැනි කාරණය

බෙහෙත් ගහන්න බැහැ වතුරේ මාළු ඉන්නවා. වතුරේ තිලාපියෝ ඉන්නවා. එහා පැත්තේ වෙනම කරලා තියෙනවා රසායනික පොහොර දාලා. නමුත් ඒකට වැඩිය මේකෙ වැඩේ සාර්ථකයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කිවුවේ කොහොම වුණත් මේක බෝවෙලා යන්න ඕන ඇත්තටම. අඩු ගාණේ දැන් ලබුදූව පැත්ත ගත්තම පලා වලින් ජීවිතය ජය ගනිපු මිනිස්සු ඉන්නවා. මේකෙත් ඇත්තටම ඒක කරන්න පුලුවන්. මම හිතන්නේ ඇත්තටම මොකක් වුණත් මේ උත්සාහය හොඳයි. මේ රෝගය බෝවෙනවා නම් කොරෝනා වගේම හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 41.** ගාල්ල - බද්දේගම සහ නරාවල - පෝද්දල මාර්ග යා කරනු ලබන මීපාවල පත්නමග අතුරු මාර්ගය සහ කාණු පද්ධතිය පිළිසකර කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් මේ මාර්ගය අබලන් වෙලා. කාණු නැහැ. ඒ මාර්ගය සංවර්ධනය කරන්න කියලා කියන්නේ. මෙතුමාගේ ගෙවල් වලට යන පාරත් ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ට්‍රාන්ස්පෝමර් එක ළඟින් යන පාරද, හව්පෙගේ වත්ත පාරද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නැහැ. මේක මෙතුමන්ලාගේ ගෙවල් වලට යන පාර.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒ යෝජනාවේ තියෙන්නේ මගේ නිවසට යන මාර්ගය. එතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ යෝජනාව කරාට. මට යෝජනා කර ගන්න බැරි දෙයක් එතුමා යෝජනා කරා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමාට ඒක කරලා දෙන්න. ගෙදරට යන පාරනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2020-11-26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2020-12-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. තාක්ෂණික සේවා කමිටුව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2020-11-26 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2020-12-08 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**(ඉ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය - 2021 වර්ෂය

ඒක සභාගත කරනවා.

වාහන අලුත්වැඩියාව, සැපයුම් සහ සේවා, විදුලි උපාංග, වීදි පහන් නඩත්තු උපකරණ උපාංග, පරිගණක උපාංග, මුද්‍රණ කටයුතු, වාහන අමතර කොටස් මිලදී ගැනීම, කුලී පදනම මත වාහන ලබා ගැනීම වැනි සියලු දේ අඩංගුයි මේ සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනයට.

**(ඉ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ නොවැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමාගෙන් සහ සියළුම දෙනාගෙන් අවසරයි අද දිනයේ රංගනී මන්ත්‍රීතුමිය අසනීපයෙන් පසුවන නිසා මහා සභා රැස්වීමට සහභාගි වෙන්න හැකියාවක් නැහැ කියලා දැනුම් දුන්නා. එතුමියට නිවාඩු අනුමත කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රංගනී මන්ත්‍රීතුමියටත් එක්කම උප සභාපතිතුමාටත් නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, තව දෙයක් කියන්න තියෙනවා. නන්දන ගුණරත්න මහතාගේ කඩය ගාව තියෙන ‘‘සව්සිරි මාවත ’’ බෙරලියදොළ ග්‍රාම සේවා වසමට අයිති වන්නේ.

එතන ඇළ මාර්ගය ඇහිරිලා තියෙන්නේ. වැහි දිනයක පාරක පවා යන්න බැහැ. එතනින් යන්නම බැහැ. පාර වැහිලා තියෙන්නේ. කාපට් කරපු පාර ගැන අවධානයට ලක් කරන්න. ඒ පාර කැඩෙන තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා ඒ කාණුව දිගටම හාරන්න.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ජේ. සී. බී. එක දාලා කපන්න පුලුවන්ද.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ៖-** පුලුවන්. තව ඉස්සරහට තියෙනවා ලොකු කැලයක්. එතන ගෙපලකුත් කපලා තියෙනවා. එතන ඉදිකිරීම් කරපු මනුස්සයෙකුට ලොකු අනතුරක් වුණා. ඒ අයිතිකාරයව හොයලා ඒක සුද්ධ කරවන්න. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට කියලා හරි ඒක කරවන්න. ලොකු කැලයක් තියෙනවා. ඒ කැලේ සුද්ධ කරවන්න කියලා ඉල්ලනවා. අර කාණු පද්ධති ටිකත් බැකෝ යන්ත්‍රයක් දාලා සුද්ධ කරන්න කියලා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, අපේ උප සභාපති සුමිත් ජයසේකර මැතිතුමාගේ පියා අභාවප්‍රාප්ත වුණා පසුගිය දවසක. ඒ පිළිබඳව සභාපතිතුමා, මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් ඇතුළු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සියලු නිලධාරි මහත්ම මහත්මීන්ගේ සාතිශය සංවේගය මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒ වගේම පොඩ්ඩක් මතක් කරන්න ඕන දෙයක් තියෙනවා. අපේ ලියනගේ මන්ත්‍රීතුමත් මේක සිහිපත් කරන්න කියලා කිවුවා. ගොඩකන්ද, වැලිකැටිය වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සැකසීම පිළිබඳව ඒකට යම් කිසි මුදලක් වෙන් කරන්න පුලුවන්ද කියලා ගරු සභාපතිතුමාගෙන් දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම එතුමත් එක්ක ඒ ගැන සාකච්ඡා කරලා බලන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ៖-** දැන් ගෙදරට වාහනයක් ගන්නත් බැරුව ඉන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ៖-** පාර කඩා ගෙන ගිහිල්ලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමාලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, කුණු ප්‍රශ්නය ආපහු උග්‍ර වෙලා තියෙනවා. මම ඉන්න ප්‍රදේශයේ කුණු ගොඩවල් මහා ලොකුවට දැන් ගොඩ ගැහිලා තියෙනවා. අද වෙන කොට ඒ කුණු ටික අස්වෙලා නැහැ. මම එදා ඔබතුමා එක්කත් ඒ ගැන සාකච්ඡා කරා. සතියකට පාරක් තමයි අපි කුණු ගන්නේ. ඒ කුණු ගන්න අතර කාලයන් වලදී, ඒ කියන්නේ සඳුදා කුණු එකතු කරනවා නම් සඳුදා කුණු ගෙනිච්චට පස්සේ සභාවේ වාහනයෙන්, ඊට පස්සේ අඟහරුවාදා ඉඳලා කුණු බෑග් ටික එල්ලනවා ලයිට් කණුවේ. ලයිට් කණුව යට කුණු ගොඩවල් පිරිලා තියෙනවා. ඒක බොහොම සෝචනීය තත්ත්වයක් මම ඉන්න ප්‍රදේශයේ වුණාට හැබැයි තිස්ස මන්ත්‍රීතුමාගේ තමයි කොට්ඨාශය. ඒක එතුමා හොයන්නෙත් නැහැ. ඒක එතුමා හොයන්න ඕන. නමුත් මගේ ගේ ඉස්සරහනේ මේ ප්‍රශ්නය තියෙන්නේ. අනිත් එක විදුහල ඉස්සරහ. ඒක හින්දා මම යෝජනා කරනවා ඒ කුණු එකතු කරන අදාළ දිනය සඳුදා නම් සඳුදා දිනයට කුණු බැහැර කරන්න කියලා බෝඩ් කිහිපයක් ඒ ස්ථාන වල ප්‍රදර්ශනය කරන්න. මොකද මිනිස්සුන්ට අපි පෞද්ගලිකව කියන්න ගියාම හොඳ නැහැ. ගමේ අහළ පහළ ගෙවල් තරහා වෙනවා. දැනටමත් බාගෙට තරහා වෙලා. ඒ වගේම අද කුණු ගෙනිච්චද දන්නේ නැහැ. ඒකත් ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අද ගියා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** හැබැයි අද උදේ 9.30 වෙනකනුත් ආවේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මාර ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ රියදුරෝ ගොඩක් නිවාඩුයි. පුදුම වැඩක් වෙලා තියෙන්නේ. මොකක් හරි ඒකට කරන්න ඕන. රියදුරන්ගෙන් බාගෙට බාගයයි ඉන්නේ හැම තිස්සෙම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ៖-** අනුමත කිරීමක් කරලද නිවාඩු ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** නිවාඩු ඒ අයට හිමි දෙයක්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ៖-** හිමි දේ ගන්න බැහැ එහෙම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක තමයි දැන් කරන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** අපේ සභාවේ කාර්යය ඉෂ්ඨ කරලා නිවාඩු ගන්න එකයි යුතුකම වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව දෙයක් තියෙනවා සභාව දැනුවත් කරන්න. මම මෙහෙම දෙයක් කරා. අතිකාල දීමනා ක්ෂේත්‍ර ගත අයට උපරිමය පැය 80 ක් කරා. කාර්යාලය ඇතුලේ අයට උපරිමය පැය 40 ක් කරා. අතිකාල දැන් සීමා කරලා තියෙන්නේ. ඊට අමතරව මොන වැඩේ කරත් ගෙවන්නේ නැහැ. එතන ප්‍රශ්නයක් මතු වුණා අතිකාල නොගෙවීම සම්බන්ධව. ඒක සම්පූර්ණයෙන්ම නැවැත්තුවා. අතිකාල දීමනා වලින් සැහෙන්න ප්‍රමාණයක් කිසිම හේතුවක් නැතුව ගෙව්වා. ඒ ටික නැවැත්තුවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එහෙම නෙමෙයි සභාපතිතුමා. සමහර අයට වැඩ කරන්න වේවි. සමහර අයට වැඩ නැති එක වෙන ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දැන ගන්න ඕන. ලේකම්තුමාට මම දැන් ඒක කියලා තියෙන්නේ. ඒක එතුමා දැන ගන්න ඕන. කෙනෙක් අතිකාල පැය 150 ක් කරන්නයි තවත් කෙනෙක් පස්වරු 12.30 ට ගෙදර යන්නයි දෙකක් කරන්න බැහැනේ. දැන් කරන මිනිහටම කරන්න දීලා හරියන්නේ නැහැනේ. දැන් සරත් මහතා වැඩ කරනවා. ගොඩක් අය යැපෙන්නේ එයාගෙන්. එයාටම වතුර බවුසර් ආවත් දෙනවා. වෙනත් වැඩත් දෙනවා. එතකොට එයාගේ අතිකාල ප්‍රමාණය වැඩි වෙනවා. නමුත් ඒකෙදී අනිත් මිනිහා කරන්නේ පස්වරු 12.30 ට ගෙදර යනවා. අතිකාල කරන්නේ නැහැ. නිවාඩු ටිකත් හරියටම ගන්නවා. ඒක හරියට පාලනය කරන්න ඕන. මම ඒක කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කියලා තියෙන්නේ. ඒක පාලනය කරන්න ඕන හරියටම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ ක්‍රමවේද හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්නම් තේරුමක් නැහැ. කරන මිනිහා හැමදාම කරනවා. ඒක අසාධාරණයි. මම අතිකාල පැය කිහිපයක් කැපුවා. මම කිවුවා කරන්න දෙයක් නැහැ පැය 80 ට වැඩිය ගෙවන්න බැහැ කියලා. මම මාසයේ මුලදීම ඒක කිවුවා. පැය 80 ට වැඩිය කාටවත් එවන්න එපා කියලා ගෙවන්න. එතකොට මෙතුමත් දැන ගන්න ඕන පැය 80 ට වැඩිය අනුමත නොකර අනිත් අයගෙන් ඒක කළමනාකරණය කරන්න. නැතුව ඒක කරන්න බැහැ. තරහා වෙන්න පුලුවන්. මාත් එක්ක තමයි තරහා වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** නම කියපු නිසා කියන්නේ. නිවාඩු දවසද, පෝය දවසද කියලා නැහැ වැඩට කොයි වෙලේ කතා කරත් එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්ත කතාව. එයා විතරයි එන්නේ. අනිත් අයගේ වාහන වලට යන්න බැහැ. කඳු නගින්න බැහැ. මාත් මේ ඔක්කොම බලාගෙන ඉන්නේ. කඳු නගින්න බැරි වාහන ඔක්කොම ඒවා තියෙන්නේ. අසාධාරණය වෙන්නේ කරන මිනිහටම තමයි. හැබැයි මම ලේකම්තුමාට කියලා තියෙන්නේ ඒකට සාධාරණයක් කරන්න කියලා. අතිකාල දීමනා වලින් නෙමෙයි අනෙත් අයගෙනුත් වැඩ ගන්න ඕන. අනිත් අයගෙන් ඒ වැඩ ප්‍රමාණය ගන්න ඕන. ට්‍රැක්ටර් ඩ්‍රයිවින් බැරිනම් ඒ අයට ලියුම ගහන්න. ජේ.සී.බී. ඩ්‍රයිවින් කරන්න පුලුවන්, කැබ් එකේ ඩ්‍රයිවින් බැහැ කකුල් දෙක වෙව්ලනවා. ඒ වගේ ප්‍රශ්න තියෙනවා. සයිඩ් කණ්ණාඩිය අකුලන්න බැහැ. ග්ලාස් එක පහළට දා ගන්න බැහැ. හැබැයි ජේ. සී. බී. ඩ්‍රයිවින් කරන්නේ. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ අයව ලිඛිතව දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කැබ් එක එළවන්න දුන්නම කකුල් දෙක වෙව්ලනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ වගේම සභාපතිතුමා මම කලින් සභාවක කිවුවා මෙහේ ඉවතලන ගොඩනැගිලි අපද්‍රව්‍ය සන්බීම් පාර්ක් එකට දාන්න කියලා. ඒක පිටුපස පිට්ටනියක් තියෙනවා. ඒ පිට්ටනිය ගොඩකර ගන්න ඕන. සභාවේ ඉඩම් කැබැල්ලක් තියෙනවා. ඒකෙ පිට්ටනියක් හදන්න බලාපොරොත්තුවක් තියෙනවා. ඒක ටිකක් ගොඩකරන්න වෙනවා. ඒක හින්දා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ තිබෙන පස්, ගල්, ගඩොල් කැලි තියෙනවා නම් ඒ ඉඩමට දාන්න කියලා මම ඉල්ලීම කරනවා. ඒක යෝජනා කරලා ඇත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කොතනද, පහත් බිමක්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔව්. ඇළබඩ පාලම ගාව. සභාව එහා පැත්තේ තාප්පය කඩනවා කියලා ආරංචියක් තියෙනවා. ඒ කඩන ටික ඒ ඉඩමට දාලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපේ ඉඩමක්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔව්. ඒක අපේ සභාවේ ඉඩමක්.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** අඳහන්දොළ කාණුව සුද්ධ කරලා දෙන්න සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජේ. සී. බී. එක දාලා සුද්ධ කරන්න බැරිද, සභාවෙන් දාන්න දෙයක් නැහැ ඔය ඉල්ලලා ගෙනිච්ඡානේ දේවල් වලට. ජේ. සී. බී. එක දාන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඔව්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවට දාන්න අවශ්‍ය නැහැ ඉල්ලන්න. දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ප්‍රගතිය අවස්ථාව මේ. අපි ලිපි කිහිපයක් යොමු කරන්න පසුගිය සභාවලදී යෝජනා කරලා ඒවා ස්ථිර කරලා සම්මත වුණා. ඒ ලිපි දැම්මද කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් සම්බන්ධයෙන්ද අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ භූමිය අවසතු කිරීම සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා ජනාධිපතිතුමාට යවන්න කියලා කිවුවා. ඒකෙ ලිපිය යැව්වද, එකේ පිටපත අපිට ලැබෙන්නේ කොහොමද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නඩුවට බලපෑමක් නැහැ. ඒක දාන්න. ඒක නඩුවට අදාළතාවයක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා මේකත් බලන්න. බංගලාවත්තේ අනවසර ඉදිකිරීමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ඒක මාර ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය දැනුවත් කරලා තියෙනවා මේක අනතුරුදායකයි කියලා. ඒක ගැන සභාව දැනුවත් කරලා තියෙනවා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් දැනුවත් කරලා තියෙනවා. ඒක අනිවාර්යයෙන්ම නොවැටී තියෙන්නේ නැහැ. ඒක අඩි 40 ක් විතර උසයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ ලියුම් ටික දාලා මේ දවස් දෙක තුනේදී ඒ වැඩ ටික කරන්න. ඊලඟට ඔබතුමන්ලා අපි සාකච්ඡා කරා කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය පිළිබඳව. දැන් ඒකෙ නඩුව 20 වෙනිදද කොහේද තියෙනවා කියලා කිවුවේ. දැන් නඩුව තියෙන එකක් නැහැ ඒක කොළඹ උසාවියේ තියෙන හින්දා. දැන් නඩු ගන්නේ නැහැනේ. නඩුව කල් යාවී නිකම්ම. ඒක හින්දා කිසිම ප්‍රශ්නයක් නැහැ.

ඊළඟට සභාපතිතුමනි, අපි මේ කමිටුව විදියට එදා ගිහිල්ලා මන්ත්‍රීවරු ටික බැලුවා ඇක්සස් එකේ ඉඩමයි, ග්‍රෑන්ඩ් පැනරෝමා ඉඩමයි, වතුර ටැංකිය පාරේ තියෙන ඉඩමයි. ඒවායේ තියෙන තත්ත්වය බැලුවා. ඒක නිසා මම අපේ තාක්ෂණ නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් ඉල්ලා සිටිනවා ඒකේදී අපි පෙන්වලා දීපු ටිකේ වාර්තාවක් වහාම අපිට ලබා දෙන්න කියලා. ඊළඟට අර තට්ටු තුනේ ගේ පිළිබඳව මොකක්ද ගනිපු ක්‍රියාමාර්ගය. ඒකෙ ලිපිගොනුව ගත්තම දිගින් දිගටම මම නම් දැක්කේ මෙයා ලෙඩ වෙනවා, අරයා ලෙඩ වෙනවා. ඒ නිසා ඒකට කල් දිදී ඉන්නවා. ඒක හදාගෙන යන්න ඉඩ දීපු එකම වැරදියි. ඒ මිනිස්සුන්ව අමාරුවේ දාලා තියෙන්නේ ඇත්තටම ඔබතුමන්ලා. ඔබතුමන්ලාගේ කාලයේදී නෙමෙයි මේක පටන් ගත්තේ. නමුත් එකක් තියෙනවා ඒක හදාගෙන යන්න ඉඩ දීපු එක ඒ මිනිස්සුන්ට කරපු හානියක්. ඒක නීතියට විරුද්ධයි. ජල සම්පාදන මණ්ඩලයේ බිම් කොටසත් අල්ලා ගෙන තියෙනවා. ඊළඟට ඔබතුමන්ලා බලන්න අපිට තාක්ෂණය පැත්ත නොපෙනුනත් අරහේ කොහොමද තට්ටු තුනේ ගෙදර හදන්නේ. දැන් සාමාන්‍යයෙන් ඕනම ගෙයක් හදන්න අවසර දෙන කොට වතුර බැහැලා යන්නේ කොහොමද කියලා ඔක්කොම දෙනවානේ. එන්.බී.ආර්.ඕ එක දීපු නිර්දේශ වලට අනුවද කරලා තියෙන්නේ කියලා බලන්න. ඉතිං ඒක ගිහිල්ලා බලන්න. කරලා ඉවර වුණාට පස්සේ කඩන්න කියන එක අපරාධයක්නේ. දැන් ඒකට කරන්න දෙයක් නැහැ. වරදක් කරා නම් එය නිවරදි විය යුතුයි. ඒක වහාම නිවරදි කරන්න. නැත්නම් අවශ්‍ය නීතිමය පියවර ගන්න. ඒක බලලා ඒ මිනිස්සුන්ට අවශ්‍ය නිවරදිකිරීම් ටික කරන්න. ඒ නිසා ඒ පිළිබඳව වාර්තාවක් අපිට ඉස්සරහ සති දෙක ඇතුලතවත් ගරු සභාපතිතුමනි ලබා දෙන්න. දැන් ඒකට මාසයකට වැඩිය ගිහිල්ලා. ඉස්සරහට ඒ දෙකට වාර්තාවක් අපිට ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන දෙකටද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ග්‍රෑන්ඩ් පැනරෝමා එකේ හදාගෙන යන නිවාස අපි ගිහිල්ලා පෙන්නුවා තාක්ෂණ නිලධාරි මහත්වරුන්ට සහ මහත්මියන්ට. ජල සම්පාදනයට යන පාරේ තරංගා ලෑන්ඩ්ස් ඉඩමත් පෙන්නුවා. අන්න එම ඉඩම් දෙකේ වාර්තාවයි අපිට අවශ්‍ය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා අර 14 ට තියෙනවාද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔව් ඒ 14 ට තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ 14 ට තියෙනවා නම් ඉස්සෙල්ලා ඒ ටික ඉවර කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක විතරක් නෙමෙයිනේ. දැන් මේ මම කිවුවේ එකක් විතරයි. හදාගෙන ගියාට පස්සේ සභාපතිතුමා ඒක වැඩක් නැහැ. මම අර වාර්තාවල් ටික ඉල්ලුවට පස්සේ කියලා තිබුණේ මගෙන් ඉල්ලන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද හරි නැත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් හදා ගෙන යන ගෙවල්නේ ඔක්කොම තියෙන්නේ. දැන් ඇත්තටම මේක බලන්න කියන්නේ වෙන මුකුත් හින්දා නෙමෙයි. ඊළඟ අනතුර එනවා අනිත් පැත්තේ හදන කොට. යන පාරේ අනිත් පැත්තේ හදන කොට ඒක එනවා. ඒක නිසා දැනට ඒවා හරි නතර කරන්න ඕන එන්.බී.ආර්.ඕ. එකත් ගෙන්වලා බලලා ඉවර වෙලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි අනුමත නොකරපුවා නවත්වන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනුමත කරලා තියෙන්නේ. අනුමත කරේ කොහොමද කියන එක අපිට දෙන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනුමැතිය අරගෙන නම් අපි කොහොමද නවත්වන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හදපු නැති පැත්තක් තියෙනවා. දැන් අපි දන්න එකක් තියෙනවා එන්.බී.ආර්.ඕ. එකෙන් දෙනවා හැම ගෙදරින් ගෙදරකටම හදන්න අනුමැතිය ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය සාකච්ඡාව ඉක්මන් කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැම එකටම ඒ අයගේ අනුමැතිය අරගෙන පස් කපන්න කියලා දීලා තියෙනවා. එතකොට එහෙමද කරලද තියෙන්නේ. ඒ අනුවද කපලා තියෙන්නේ. මම බොහොම පැහැදිළිව කියනවා එහෙම නැහැ කියලා. මම තාක්ෂණ නිලධාරීට එදා ගිහිල්ලා ඒක පෙන්නුවා අර ජල සම්පාදනයට යන පාරේ වෙන්දේසි ඉඩමට යනකොට. මම බොහොම පැහැදිළිව ඒක පෙන්නුවා. මොකද වෙන්නේ එහෙම කැපුවම අර කාණුව තියෙද්දී. කාණුව තව ටිකක් යනකොට කඩාගෙන යනවා. මම කියන්නේ දීපු ඒවායෙම වැරැද්දක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලබන සතියේ මම කිවුවා අර සාකච්ඡාව යොදා ගන්න කියලා. එතකොට ඔය ප්‍රශ්න වලට පිළිතුරු හම්බවේවි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, නරාවල බෝගහ හන්දියේ මම හිතන්නේ සභාව පැවති නැති කාලයේ වෙන්දේසි ඉඩමක් කරලා තියෙනවා. ගෙවල් දොළහක් විතර තියෙන්නේ ඒකෙ. ඒකෙ නම සැනසුම. මකුළුවේ සම්පත් ලී මෝල අයිති මහතා ඒක කරලා තියෙන්නේ. හැබැයි අද වෙන කොට ඒ මිනිස්සුන්ට වතුර නැහැ. මම හිතන්නේ අධිවේගී මාර්ගය ආසන්නයේ කරපු නිසා නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ වෙලා තමයි මම හිතන්නේ ඒක කරන්න ඇත්තේ. මොකද අවසර ගන්න ඕන නාගරික සංවර්ධන අධිකාරියෙන්. සභාව නැති කාලයේදී තමයි ඒක වෙලා තියෙන්නේ. මන්ත්‍රීවරු සභාවට පත් වෙලා නැහැ එතකොට. නමුත් දැන් ඒ වෙන්දේසි ඉඩමේ ඉන්න මිනිස්සුන්ට වතුර නැහැ. හැබැයි ඒ වෙනුවෙන් මුදලක් සභාවට වෙන් වෙලා ඇති. වතුර දෙන්න මුදලක් වෙන් වෙන්න එපැයි. ඒ නිසා මේ සඳහා සභාවේ අවධානය යොමු කරවන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අවුරුදු පහ ඉවර ඇති සභාව නැති කාලයේ කරපු එකක් නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලන්න කියන්නම් මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතිය අවස්ථාවේදී පොඩි කාරණයක් කියන්න තියෙනවා. ඔබතුමා දීපු ප්‍රගති වාර්තාවේම තියෙනවා වී.සී පාරේ ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ නිවස අසළ කාණුව ඇළ දක්වා කැපුවා කියලා. බොහොම ස්තුතියි ඒ කාරණාවට මැදිහත් වුණ එක

සම්බන්ධව ඉස්සෙල්ලම. ප්‍රශ්නය තියෙන්නේ ගරු සභාපතිතුමනි, ඒ කාණුව කපලා ඇළට සම්බන්ධ කරලා තියෙනවා. බොහොම අපහසුතා මධ්‍යයේ තමයි ඒ වැඩේ කරලා තිබුණේ. ඒ කොහොම වුණත් ඒකෙ වතුර පාර දැන් සම්පූර්ණයෙන්ම බහිනවා. ඒකෙ කපපු කාණුව එතුමාගේ ගෙදර අයිනේ තියෙන කාණුවට වඩා උසයි. ඒක පහත නැති නිසා වතුර රැඳෙනවා. යම් වතුර ප්‍රමාණයක් මේ පැත්තේ රැඳෙනවා. ඒක ඉස්සරහට කොන්ක්‍රීට් කරලා හදනවා කියලා තිබුණා. ඒක හදන වෙලාවට අදාළ ප්‍රමාණයෙන් ගැඹුරට සකස් කරන්න. මම හිතන්නේ ඒක ප්ලෑන් එකක තියෙන කාණුවක්. ඒ කාණුව පිහිටි කාණුවක්. ගරු සභාපතිතුමනි, මම ඒ කාරණය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ කාණුව අපි කම්කරුවන් දාලා වතුර බහින්න පුලුවන් විදියට කපන්නම්. ඒක කරන්නම් කපපු කාණුවේ වතුර බහින්නේ නැහැයි කියන නිසා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගේ අයිනේ තියෙන කාණුව පහතයි. ඒකෙ තව වතුර ටිකක් පිරෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං අපි ඒ කාණුව කපපු වෙලාවේ වතුර බැස්සානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** යම් වතුර ප්‍රමාණයක් බැහැලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාගේ ඉඩම හදාගන්න කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ඉඩම පහතයිනේ අර පුරවපු ප්‍රමාණය තිබුණට. ඔබතුමා කාණුව කපද්දි කපපු කාණුවේ ප්‍රමාණයට වතුර ටික බැස්සා. තව වතුර කාණුවේ තියෙනවා. කාණුවේ ගැඹුර හරි ප්‍රමාණයට කැපිලා නැහැ. කාණුවේ පළලත් බොහොම පටු ප්‍රමාණයක් තියෙන්නේ. ඒ කාණුව අදාළ ප්‍රමාණයට කපලා කාණුවේ වතුර බහින විදියට හදන්න. එතුමා ඒ පැත්ත හදා ගෙන අහුරගනීවි. ඒ කාණුවේ වතුර රැඳෙන එකත් හොඳ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලන්නම්. ඒක බලලා ඉවර වෙලා මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගමු.

උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන්ටත් ජනතාවටත්, අනෙකුත් සියළු දෙනාටත්, ජනමාධ්‍යවේදීන්ටත් ස්තුතිවන්ත වෙනවා සභාපතිවරයා විදියට පසුගිය වර්ෂය පුරාවටම සභාවේ වැඩ කටයුතු කර ගෙන යන්න දක්වපු දායකත්වය සහ මඟ පෙන්වීම සම්බන්ධව. ඔබතුමන්ලා දන්නවා 2020 වර්ෂය කොරෝනා වසංගතයත් සමඟ අපේ රටේ සහ මුළු මහත් ලෝකය පුරාවටම පැවතුන තත්ත්වය පිළිබඳව. 2021 වර්ෂයේදීවත් අපිට මේ කොරෝනා උවදුරෙන් මිදිලා රටක් විදියට ඉදිරියට යන්න පුලුවන්. ඒ වගේම ප්‍රාදේශීය සභාව විදියට සංවර්ධන කටයුතු රාශියක් කරලා අපිට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විදියට ඉදිරියට යන්න පුලුවන් පරිසරයක් නිර්මාණය කර ගන්න හැකි වේවා කියන බලාපොරොත්තුව ඇතුව ඔබ සියලු දෙනාටම නිදුක් නිරෝගීමත් සුහම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

<u>**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**</u>

මීළඟ මහා සභා රැස්වීම 2021-01-19 වන අඟහරුවාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.